දකුණු පළාත් සභාව - 2023

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

දකුණු පළාත් සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාල තොරතුරුද ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(1) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පළාත් සභා පනතේ 23(2) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) උපවගන්තියේ විධිවිධාන ප්‍රකාර සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 31 දින නිකුත් කරන ලද අතර ජාතික විගණන පනතේ 11(2) උප වගන්තිය ප්‍රකාර විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 ජුනි 14 දින නිකුත් කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව හා ජාතික විගණන පනතේ 10(1) උප වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙතද, වාර්තාවේ පිටපත 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(2) වගන්තිය ප්‍රකාරව පළාත් සභාව ඉදිරියේ තැබීම සඳහා ආණ්ඩුකාරවරයා වෙතද ඉදිරිපත් කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට දකුණු පළාත් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

1.2.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) දකුණු පළාත් සභා අරමුදල

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	ඉකුත් වර්ෂවලට අදාළ රු.19,342,530 ක් වූ උකස් ඇප තැන්පත් පොලී ආදායම වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත කිරීම හා පළාත් සභාවේ ආයතන 03 කට අදාළව වර්ෂයේ වියදම් රු.15,313,217 ක් අඩුවෙන් දක්වා තිබීම හේතුවෙන් රු.34,655,747 ක් අඩුවෙන් වර්ෂයේ ඌනතාවය දක්වා තිබුණි.	ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව.	ආදායම් සහ වියදම් නිවැරදිව හඳුනා ගෙන ගිණුම් ගත කිරීමට කටයුතු කල යුතුය.

(ii)	දකුණු පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ අතිරික්ත අරමුදල වෙනුවෙන් 1991 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වාම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එම අරමුදලේ පැවති එකතුව රු.262,443,441 ක් වූ මුළු වත්කම් සමාලෝචිත වර්ෂයේ පළාත් අරමුදල් ගිණුමෙන් අත්හැරී තිබුණි.	ශේෂ සනාථන ලබා ගැනීමට අදාළව මූලික කටයුතු මේ වන විට සිදු කරමින් පවතින අතර ශේෂ සනාථන ලබාගත් වහාම අවසාන ගිණුම විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව.	වත්කම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කිරිමට කටයුතු කල යුතුය.
(iii)	සමාලෝචිත වර්ෂයේ ප්‍රත්‍යාගණනය කර තිබූ දකුණු පළාත් ධීවර අමාත්‍යාංශය සතු දේපල, පිරියත හා උපකරණ වටිනාකම රු.5,610,734 ක් අඩුවෙන් දක්වා තිබීම හා ආයුර්වේද දෙපාර්තමේන්තුව යටතේවූ බෙලිඅත්ත ඖෂධ නිෂ්පාදනාගාරයට අයත් රු.85,643,000 ක් වූ ස්ථාවර වත්කම් වටිනාකම ගිණුම්ගත නොවීම හේතුවෙන් පළාත් අරමුදල් ගිණුමේ දෙසැම්බර් 31 දිනට වූ දේපළ, පිරියත හා උපකරණ වටිනාකම රු.91,253,734 කින් සහ ක්ෂය වියදම රු.2,375,355 කින් අඩුවෙන් දක්වා තිබුණි.	ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව.	දේපල, පිරියත හා උපකරණවල වටිනාකම හා ක්ෂය වියදම නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කිරිමට කටයුතු කල යුතුය.
(iv)	ඉකුත් වර්ෂයන්හි සහ සමාලෝචිත වර්ෂයෙහි ආයතන 08 ක් විසින් මිලදී ගෙන තිබූ රු.70,996,540 ක් වටිනා ස්ථාවර වත්කම් ගිණුම් ගත නොවීම සහ දකුණු පළාත්, පළාත් පාලන දෙපාර්තමේන්තුව සතු සූර්ය පැනලයෙහි වටිනාකම රු.604,727 කින් වැඩියෙන් දක්වා තිබීම හේතුවෙන් පළාත් අරමුදල් ගිණුමේ දෙසැම්බර් 31 දිනට වූ දේපළ, පිරියත හා උපකරණ වටිනාකම රු.70,391,813 කින් අඩුවෙන් දක්වා තිබුණි.	ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව.	දේපල, පිරියත හා උපකරණවල වටිනාකම නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කිරිමට කටයුතු කල යුතුය.
(v)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දකුණු පළාත් සභාවේ අධ්‍යාපන දෙපාර්තමේන්තුව හා ප්‍රධාන අමාත්‍යාංශය සතු එකතුව රු.61,757,745 ක් වූ වාහන 25 ක් හා යතුරු පැදි 24 ක වටිනාකම අදාළ ශීර්ෂය යටතේ ගිණුම්ගත කර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පළාත් අරමුදල් ගිණුමේ දේපල, පිරියත හා උපකරණ වටිනාකම ඒ හා සමාන අගයකින් අඩුවෙන් දක්වා තිබුණි.	ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව.	දේපල, පිරියත හා උපකරණවල වටිනාකම නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කිරිමට කටයුතු කල යුතුය.

(vi)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය සතු මුළු ඉඩම් හා දේපල වටිනාකම රු.20,158,000 ක් අඩුවෙන් දක්වා තිබීම සහ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 07 දින අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙතින් දකුණු පළාත් ප්‍රධාන අමාත්‍යාංශය වෙත පවරා තිබූ අක්කර 28 රූඩ් 01 පර්චස් 29 විශාලත්වයෙන් යුතු බටඅත - දකුණ සමෝදාන ගොවිපල ව්‍යාපෘති භූමියේ වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබීම නිසා පළාත් අරමුදල් ගිණුමේ ඉඩම් වටිනාකම අඩුවෙන් දක්වා තිබුණි.	ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව.	දේපල, පිරියත හා උපකරණවල වටිනාකම නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කිරිමට කටයුතු කල යුතුය.
(vii)	දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය සතු පරිගණක මෘදුකාංග පද්ධති 02ක වටිනාකම රු.2,335,000 ක් අඩුවෙන්ද, ඉකුත් වර්ෂයන්හි හා සමාලෝචිත වර්ෂයෙහි දකුණු පළාත් සභාවේ ආයතන 02 ක එකතුව රු.15,701,915 ක් වැයකර ඉදිකර තිබූ කර්මාන්තවල වටිනාකම සහ දකුණු පළාත් කළමනාකරණ සංවර්ධන හා පුහුණු ආයතනයට අයත් රු.12,883,500 ක් වූ ස්ථාවර වත්කම් ගිණුම්ගත නොවීමෙන් පළාත් අරමුදල් ගිණුමේ දේපළ පිරියත හා උපකරණවල එකතු වටිනාකම රු.30,920,415 කින් අඩුවෙන් දක්වා තිබුණි.	ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව.	දේපල, පිරියත හා උපකරණවල වටිනාකම නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කිරිමට කටයුතු කල යුතුය.
(viii)	2023 වර්ෂයේ ගිණුම් පිළියෙල කිරීමට උපදෙස් සපයමින් නිකුත් කර තිබූ 2024 ජනවාරි 01 දිනැති අංක 03/2023 දරන ප්‍රධාන ලේකම් (ගිණුම් හා ගෙවීම්) චක්‍රලේඛයේ 8.2 ඡේදය අනුව සමාලෝචිත වර්ෂය අවසානය වන විට තම ආයතනය සතු සියළුම මූල්‍ය නොවන වත්කම් ගිණුම්ගත කර අවසන් කල යුතු වුවත්, දකුණු පළාත් සභාවේ ආයතන 04 ක් සතු ස්ථාවර වත්කම් 29 ක් තක්සේරු කර ගිණුම්ගත කර නොතිබීම නිසා පළාත් අරමුදල් ගිණුමේ එම වත්කම්වල අගය අඩුවෙන් දක්වා තිබුණි.	අදාළ තක්සේරු කිරිම් සිදුකර 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයන්ට ඇතුළත් කිරිමට කටයුතු කරන බව.	දේපල, පිරියත හා උපකරණවල වටිනාකම නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කිරිමට කටයුතු කල යුතුය.
(ix)	දකුණු පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේදී තීරක ගාස්තු ලැබිම් වලට අදාළව පළාත් සභාවේ ආදායමට බැර කල යුතුව තිබූ රු.26,708,965 ක මුදලක්, දිස්ත්‍රික් කාර්යාල 03	2024 වර්ෂයේ සිට තීරක ගාස්තු ලැබීම් හා ගෙවීම් මූල්‍ය ප්‍රකාශන වලින් හෙළිදරව්වන පරිදි ගිණුම්ගත කිරීම සඳහා ඉදිරි කටයුතු සිදු කරන බව.	සියලු ආදායම් පළාත් අරමුදලට බැර කිරීමට කටයුතු කල යුතුය.

මගින් පවත්වා ගෙන යනු ලබන පොදු ගිණුම් 03 ක රඳවා ගෙන ඉන් රු.1,319,290 ක මුදලක් පමණක් පළාත් සභා ආදායමට බැර කොට ඉතිරි මුදල වූ රු.25,716,897 ක මුදල පළාත් සභා අරමුදලට බැර කිරීමකින් තොරව වියදම කර තිබුණද එම ගනුදෙනු පළාත් සභා අරමුදල මගින් හෙළිදරව් කර නොතිබුණි.

1.2.2 නොසැසඳූ පාලන ගිණුම්

(අ) දකුණු පළාත් සභා අරමුදල

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළ ජංගම වගකීම් යටතේ දක්වා තිබුණු පළාත් පාලන ආයතන වලට ගෙවිය යුතු මුද්දර ගාස්තු හා උසාවි දඩ පිළිවෙලින් රු.681,794,411 ක් හා රු.11,201,340 ක් වූ අතර අදාළ පළාත් පාලන ආයතන විසින් සමාලෝචිත වර්ෂයේ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව එම අගයන් පිළිවෙලින් රු.1,649,058,200 ක් සහ රු.81,548,318 ක් වීමෙන් එකතුව රු.1,037,610,767 ක වෙනසක් පැවතුණි.	2023 දෙසැම්බර් 31 දිනට ගෙවීමට ඉතිරි මුද්දර ගාස්තු රු.681,794,410 ක් හා උසාවි දඩ රු.11,201,339 ක් වේ. ඒ අනුව අදාළ අගයන් පිළිබඳව පළාත් පාලන ආයතන දැනුවත් කරන ලදි. පළාත් ආදායම් කොමසාරිස් විසින් නිර්දේශ කරනු ලබන මුදල එම ආයතන ද ඇතුළත් කල යුතු වුවද එම ආයතන විසින් ගෙවිය යුතු මුද්දර ගාස්තු සඳහා ඉඩම් රෙජිස්ටාර් කාර්යාල මඟින් එවනු ලබන ලේඛනයන්හි සඳහන් මුදල් සටහන් කර ගෙන ඇත.එමෙන්ම වර්ෂයේ මුල ගිණුම් සකස් කිරීමේදි පළාත් පාලන ආයතන විසින් වර්ෂය සඳහා ලැබිය යුතු ලෙස සලකා ඇස්තමේන්තු ගත මුදලක් එම ගිණුම් වලට එකතු කර ඇත.එම කරුණු මෙම වෙනසට හේතු වන බව හා පළාත් භාණ්ඩාගාරය විසින් යොමු කරන ලද ශේෂයන් එම ගිණුම් වලට ඇතුළත් කර ගන්නා ලෙසද පළාත් පාලන ආයතන දැනුවත් කර ඇති බව.	ශේෂ සැසඳීමට ලක්කර මූල්‍ය ප්‍රකාශන පිලියෙල කිරිමට කටයුතු කල යුතුය.

1.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

දකුණු පළාත් සභා අරමුදල

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
දකුණු පළාත් කළමනාකරණ සංවර්ධන හා පුහුණු ආයතනය සතු 2018 වර්ෂයට පෙර මිලදී ගෙන තිබූ රු.16,778,168 ක් වූ දේපල, පිරියත හා උපකරණ වටිනාකම පළාත් අරමුදල් ගිණුමෙහි ගිණුම්ගත කර තිබුණේද යන්න පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවුණි.	2018 වර්ෂයේ සිට එම වියදම් ප්‍රාග්ධනිත කොට නොමැති බව හා 2024 මූල්‍ය ප්‍රකාශනයෙන් අදාළ අත්හැරීම් දෝෂය නිවැරදි කරන බව.	ප්‍රමාණවත් හා යෝග්‍ය විගණන සාක්ෂි විගණනයට ඉදිරිපත් කලයුතුය.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති වියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

පළාත් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම පළාත් භාණ්ඩාගාරය ඇතුළු ඒ ඒ ආයතනවල කළමනාකාරීත්වය විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව දකුණු පළාත් සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම

මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස පළාත් සභාවේ අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිත භාවය සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව කළමනාකරණය දැනුවත් කරන ලදී.

1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.5.1 ශීර්ෂය 300 - දකුණු පළාත් ආණ්ඩුකාර ලේකම් කාර්යාලය

(අ) නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව	අනුකූල නොවීම	ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම	නිර්දේශය
2019 මැයි 31 දිනැති අංක 13/2008(V) දරන රාජ්‍ය පරිපාලන	යොමුගත චක්‍රලේඛයන්හි අනුමත ඉන්ධන සීමාවන් හා ඉන්ධන වර්ගය පිළිබඳව පළාත් සභා ප්‍රධාන	ඉන්ධන දීමනා ගෙවීමේදී නිලධාරීන් කාණ්ඩ වර්ගකර පදනම් දෙකක් යටතේ ඉන්ධන	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය.

චක්‍රලේඛයෙන් සංශෝධිත 2011 පෙබරවාරි 09 දිනැති අංක 13/ 2008 (IV) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය හා 2014 ජනවාරි 02 දිනැති 01/2014 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 2.1.3 (ii) ඡේදය	ලේකම්වරුන් දැනුවත් කර තිබියදී හා ඒ පිළිබඳ ලබා දී තිබූ නිර්දේශ නොසලකා සහ රාජ්‍ය වියදම් කළමනාකරණය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති සම්බන්ධ චක්‍රලේඛ විධිවිධාන අභිබවායමින් ආණ්ඩුකාරවරගේ 2019 මැයි 13 දිනැති අංක G/SP/1/6/1/19 දරන ලිපියෙන් ලද අනුමැතිය මත 2019 මැයි 16 දිනැති අංක 02- 2019 දරන ප්‍රධාන ලේකම් චක්‍රලේඛය (මුදල්) නිකුත් කර තිබුණු අතර ඒ අනුව දකුණු පළාත් ආණ්ඩුකාර ලේකම් කාර්යාලයේ එක් තනතුරකට අයත් එක් නිලධාරියෙකු වෙත 2019 මැයි මස සිට 2023 ජූනි දක්වා වූ කාලපරිච්ඡේදයට අදාළව රු.295,280 ක් අනුමත සීමාව ඉක්මවීම හේතුවෙන් සහ සුපිරි පෙට්‍රල් /සුපිරි ඩීසල් භාවිතය හේතුවෙන් රු.56,100 ක් ඉන්ධන දීමනා ලෙස වැඩිපුර ගෙවා තිබුණි.	ගෙවා නොමැති අතර නිලධාරීන් භාවිතා කරන වාහන සඳහා එම වාහන වලට භාවිතා කරන ඉන්ධන වර්ගය අනුව වර්ග දෙකක් හඳුනාගෙන ඇති අතර ඒ අනුව භාවිතා කරන සත්‍ය ඉන්ධන වර්ගය පදනම් කර ගෙන දීමනා ගෙවා ඇති බව.

(ආ) කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශ ලේකම්ගේ 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන චක්‍රලේඛයේ 3.1 වගන්තිය ප්‍රකාරව ඉන්ධන දහන පරීක්ෂාවක් සිදුකල යුතු අතර නිල වාහන සඳහා වෙන්කර තිබූ වාහනවල ඉන්ධන දහන පරීක්ෂාව සිදුකිරීමේදී ඉන්ධන ටැංකිය සම්පූර්ණයෙන් පුරවා ඉන්ධන පරීක්ෂාවකින් පසු දහනය වූ ඉන්ධන ප්‍රමාණය පමණක් නැවත සම්පූර්ණ කල යුතුය. එසේ වුවත් ආණ්ඩුකාර ලේකම් කාර්යාලයේ නිල වාහන හිමිකම සහිත හා ඒ වෙනුවෙන් මාසික ඉන්ධන දීමනාවක් ලබන නිලධාරීන්ගේ නිල වාහන 08 ක් සඳහා ඉන්ධන දහන පරීක්ෂාව වෙනුවෙන් රු.163,402 ක අතිරික්ත ඉන්ධන වියදමක් දරා තිබුණි.	අතිරික්ත ඉන්ධන වියදම් ලෙස රු.163,402 ක් වූ මුදල අදාල නිලධාරීන්ගෙන් අයකර ගැනීමට එම නිලධාරීන් දැනුවත් කර ඇති අතර එම මුදල් අයකර ගත් පසු විගණනය වෙත දැන්වීමට කටයුතු කරන බව.	චක්‍රලේඛ විධිවිධාන වලට අනුකූලව කටයුතු කල යුතුය.

(ii)	2019 මැයි 02 දිනැති හා 2020 ජනවාරි 15 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ පරිදි 2019 ජුනි 25 දින සිට ආණ්ඩුකාර උපදේශක සඳහා මසකට රු.75,000 ක මාසික දීමනාවක් සහ රේඛීය අමාත්‍යාංශයක ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් තනතුරකට අයත් පහසුකම් සහ නිල රථයක් ලබා දී තිබුණි. ඒ අනුව ආණ්ඩුකාරවර උපදේශක වශයෙන් මෙම නිලධාරියා වෙත 2019 ජුනි 25 දින සිට 2023 අගෝස්තු 31 දින දක්වා ඉන්ධන දීමනා ලෙස එකතුව රු.3,203,409 ක් ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.	1987 අංක 42 දරණ පළාත් සභා පනතේ 33 වගන්තිය අනුව ගරු ආණ්ඩුකාරතුමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව G/SP/Legal/108 හා 2020 මාර්තු 18 දිනැති ලිපිය මගින් අදාල නිලධාරියා දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජික තනතුරට පත් කර ඇත. අදාළ තනතුරට හිමි දීමනා සහ අනෙකුත් ගෙවීම් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් සිදු කරනු ලබන බව.	අමාත්‍ය මණ්ඩල තීරණ පරිදි කටයුතු කල යුතුය.
(ඒ)	ආණ්ඩුකාර උපදේශකවරයෙකු ලෙස සේවය කරමින් සිටියදී 2020 මාර්තු 18 දින සිට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජිකයෙකු ලෙසද මෙම නිලධාරීයා පත් කර තිබූ අතර 2020 මාර්තු 19 දින සිට වැඩ භාරගෙන එදින සිට 2023 අගෝස්තු 31 දක්වා රු.1,166,838 ක දීමනා ලබා ගෙන තිබුණි.	1987 අංක 42 දරණ පළාත් සභා පනතේ 33 වගන්තිය අනුව ගරු ආණ්ඩුකාරතුමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව G/SP/ Legal/ 108 හා 2020 මාර්තු 18 දිනැති ලිපිය මගින් අදාල නිලධාරියා දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජික තනතුරට පත් කර ඇත. අදාළ තනතුරට හිමි දීමනා සහ අනෙකුත් ගෙවීම් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් සිදු කරනු ලබන බව.	අමාත්‍ය මණ්ඩල තීරණ පරිදි කටයුතු කල යුතුය.
(බී)	තවද, ආණ්ඩුකාර උපදේශක සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජිකයෙකු ලෙස කටයුතු කරමින් සිටියදීම ගාලු උරුමය පදනමේ අධ්‍යක්ෂවරයෙකු ලෙසද 2020 ජූලි 22 දින සිට පත්කර තිබුණු අතර, 2020 අගෝස්තු 22 දින වැඩ භාරගෙන ඒ සඳහා එදින සිට 2023 අගෝස්තු 31 දින දක්වා රු.2,354,639 ක දීමනා ලබා ගෙන තිබුණි.	ගාලු උරුමය පදනම යනු ගරු ආණ්ඩුකාරතුමා යටතේ හෝ දකුණු පළාත් සභාව යටතේ ඇති ආයතනයක් නොවන බව.	අමාත්‍ය මණ්ඩල තීරණ පරිදි කටයුතු කල යුතුය.
(සී)	ආණ්ඩුකාර උපදේශක විසින් නිල රථය පාවිච්චි කරමින් ඉන්ධන දීමනා ලබා ගෙන තිබුණු අතර, එම රථය ඔහුගේ නිවසේ නතර කර තබා ගැනීමටද අනුමැතිය ලබා ගෙන තිබියදී ගාලු උරුමය පදනමට අයත් කාර් රථයක්ද භාවිතා කර	ගාලු උරුමය පදනම පළාත් සභා ආයතනයක් හෝ ගරු ආණ්ඩුකාරතුමා යටතේ පාලනය වන ආයතනයක් නොවන බව කාරුණිකව දන්වා සිටිමි. අදාල ආයතනයේ රෙගුලාසි සහ විධිවිධාන අනුව එම ආයතනය	අමාත්‍ය මණ්ඩල තීරණයන්ට අනුව කටයුතු කල යුතුය.

		කිලෝමීටර් 2450 ක් ධාවනය කර තිබුණි. එයට අමතරව ආණ්ඩුකාර ලේකම් කාර්යාලය විසින් සපයන ලද වාහනය සඳහා 2022 ජුලි මස සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා ගාලු උරුමය පදනමෙන්ද ලීටර් 410 ක් සඳහා රු.142,280 ක ඉන්ධන ලබා ගෙන තිබුණි. තවද, පූර්ණ කාලීනව ගාලු උරුමය පදනමේ අධ්‍යක්ෂ තනතුරේ රාජකාරී ඉටු කළ යුතු වුවද, එලෙස කටයුතු කර නොතිබුණි.	කටයුතු කරන බවත් අදාල පරීක්ෂා කිරීම් එම ආයතනය සතු වගකීමක් බව.	
	(ඩ)	ඒ අනුව 2020 දෙසැම්බර් දක්වා ආයතන තුනෙන්ම වැටුප් හා දීමනාද 2021 ජනවාරි සිට මේ දක්වාම ආණ්ඩුකාර ලේකම් කාර්යාලයෙන් උපදේශක තනතුර සඳහා ඉන්ධන දීමනාව සමඟ නිල වාහනයක්ද ගාලු උරුමය පදනමෙන් වැටුප් හා දීමනා සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් දීමනාද ලබා ගෙන තිබුණි.	ආණ්ඩුකාර උපදේශක තනතුර සඳහා දීමනාව ලබා ගෙන ඇත්තේ 2020 අගෝස්තු දක්වා පමණක් වේ. 2020 සැප්තැම්බර් මස සිට 2021 දෙසැම්බර් මස දක්වා ලීටර් 140 ක් හා 2022 ජනවාරි මස සිට ලීටර 135 ක් ආණ්ඩුකාර උපදේශක තනතුරේ රාජකාරී ආවරණය සඳහා ඉන්ධන දීමනාවක් පමණක් ලබාගෙන ඇත. ආණ්ඩුකාරවරගේ අනුමැතිය අනුව ආණ්ඩුකාර උපදේශක තනතුරේ රාජකාරී කටයුතු කිරීම වෙනුවෙන් වාහනය ලබා දී ඇත. රාජ්‍ය සේවා කොමිෂන් සභාව හා ගාලු උරුමය පදනම සඳහා වන දීමනා සහ අනෙකුත් ගෙවීම් සිදු කරනු ලබන්නේ මෙම කාර්යාලයෙන් නොවන බව.	අමාත්‍ය මණ්ඩල තීරණයන්ට අනුව කටයුතු කල යුතුය.
(iii)		ආණ්ඩුකාර ලේකම් කාර්යාලයේ නිල වාහන සම්බන්ධ පරීක්ෂාව		
	(අ)	ජනාධිපති ලේකම්ගේ 2018 ඔක්තෝබර් 12 දිනැති අංක PC/CSA/11-18 දරන චක්‍රලේඛයේ 4.2 වගන්තිය හා 2021 දෙසැම්බර් 29 දිනැති අංක 13/2008(VI) දරන සංශෝධිත රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව මාසික ඉන්ධන දීමනාව ගෙවිය හැකි බව දක්වා තිබුණද, දකුණු පළාත් ආණ්ඩුකාර ලේකම් කාර්යාලයේ මහජන සම්බන්ධතා නිලධාරී වෙත අනුයුක්ත කර තිබූ නිල රථය වෙනුවට	ජනාධිපති ලේකම් විසින් රාජ්‍ය වියදම් කලමානාකරණය යටතේ නිකුත් කරන ලද ජනාධිපති චක්‍රලේඛ විධිවිධාන පරිදි මහජන සම්බන්ධතා නිලධාරී භාවිතා කරන නිලරථය සඳහා මාසික ඉන්ධන දීමනාවක් වශයෙන් ගෙවා ඇත. එමෙන්ම ගරු ආණ්ඩුකරතුමා වෙතද එම චක්‍රලේඛයේම ප්‍රතිපාදන පරිදි ආණ්ඩුකාරවර ආරක්ෂක රථ වෙනුවෙන් චක්‍රලේඛයේ සඳහන් ඉන්ධන ලීටර ප්‍රමාණය සඳහා	චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතුය.

	ආණ්ඩුකාරවර නිල රථය හෝ ආණ්ඩුකාරවර ආරක්ෂක රථය 2023 ජනවාරි මස සිට අගෝස්තු මස දක්වා කාලසීමාව තුළ රාජකාරී කටයුතු සඳහා යොදාගෙන තිබියදී මහජන සම්බන්ධතා නිලධාරී වෙත අනුයුක්ත කරන ලද රථය සඳහා මසකට ඉන්ධන ලීටර් 213 බැගින් ඉන්ධන ලීටර් 1704 ක් වෙනුවෙන් රු.601,512ක් ඉන්ධන දීමනා ලෙස ගෙවා තිබුණි. එමෙන්ම, ආණ්ඩුකාරවර වෙතද ආණ්ඩුකාරවර ආරක්ෂක රථය වෙනුවෙන් එම කාල සීමාව සඳහා මසකට ලීටර් 495 ක් බැගින් ලීටර් 3960 ක් වෙනුවෙන් රු.1,397,880 ක ප්‍රමාණයක්ද ගෙවා තිබුණි.	මාසික ඉන්ධන දීමනාවක් ගෙවීම සිදු කර ඇතිබව.	
(බී)	එමෙන්ම, මහජන සම්බන්ධතා නිලධාරි 2023 ජනවාරි මස සිට 2023 අගෝස්තු මස දක්වාවූ කාලපරිච්ඡේදය තුළ ක්ෂේත්‍ර රාජකාරී කටයුතු වෙනුවෙන් ගමන් කළ දින 119 න් දින 118 ක් වෙනුවෙන් සිය තනතුරට වෙන්කළ වාහනය යොදාගෙන නොතිබූ අතර ධාවනය සඳහා ආණ්ඩුකාරවර නිලරථ හෝ ආණ්ඩුකාරවර ආරක්ෂක රථය යොදා ගෙන තිබුණි.	මහජන සම්බන්ධතා නිලධාරී හට රථය වෙන් කර දී ඇත. නමුත් ගරු ආණ්ඩුකාරතුමන් රාජකාරී කටයුතු සඳහා බැහැර යන අවස්ථාවන්වන්හිදී ගරු ආණ්ඩුකාරතුමන්ගේ උපදෙස් මත හා රාජකාරී කටයුතු පහසුව සඳහා මහජන සම්බන්ධතා නිලධාරී ආණ්ඩුකාරවර නිල රථයේ හෝ පරිවාරක රථයේ ගමන් කිරීම ඇතැම් අවස්ථා වල සිදු කර ඇත. මහජන සම්බන්ධතා නිලධාරී විසින් ගමන් වියදම් ලබාගෙන ඇත්තේ එක් වාහනයක් සඳහා පමණක් බව.	ඉදිරි වැඩසටහන් සහ ඉටුකල වැඩසටහන් ඉදිරිපත් කිරීමේදී එක් එක් දිනවලදී ඉටුකරන ලද වැඩ පැහැදිලිව දැක්වීමට කටයුතු කල යුතුය.
(iv)	ආණ්ඩුකාරවර සංචිත ලෙස පැවති ජීප් රථයක් සඳහා අංක 13/2008 හා 2008 ජුනි 26 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ ඇමුණුම 01 පරිදි 2022 ජනවාරි මස සඳහා පමණක් ධාවන සටහන් ඉදිරිපත් කර තිබූ අතර එම මාසය අවසානයේ මයිලෝ මීටරයේ අගය 598296 ක් වූ අතර 2023 සැප්තැම්බර් 19 වන දින ඉන්ධන දහන පරීක්ෂණය සිදුකරන අවස්ථාවේදී මයිලෝ මීටරයේ අගය 602460 ක් වූයෙන් එම කාල සීමාව තුළ ධාවනය කර තිබූ කිලෝමීටර් ප්‍රමාණය 4164 ක් වුවද, ඒ වෙනුවෙන් ධාවන	කැබ් රථය සඳහා අනුයුක්ත රියදුරකු නොමැති අතර, ආණ්ඩුකාරවර නිල රථය ඇතුළු පරිවාරක රථ 3 හා මහජන සම්බන්ධතර නිලධාරී වෙත වෙන් කල රථය ඇතුළු වාහන 4 සඳහා රියදුරන් දෙදෙනෙක් පමණක් යොදවා ඇත. දැනට සිටින රියදුරන් දෙදෙනා වාහන 4 හි අවස්ථානුකූලව ධාවන කටයුතු සිදු කරයි. එබැවින්, කැබ්රථය රාජකාරී කටයුතු සඳහා යොදවා තිබුනත් එම රථය සඳහා ධාවන සටහන් ලබා	මු.රෙ 1645 ප්‍රකාරව කටයුතු කල යුතුය.

	සටහන් ඉදිරිපත් කර නොතිබුණි.	ගැනීමේදී ගැටළුසහගත තත්ත්වයක් මතුවී ඇති බව සහ ඉදිරියේදී මෙම තත්ත්වය මගහරවා ගැනීමට කටයුතු කරන බව.	
(v)	වර්තමාන සාමාජිකයින් සංඛ්‍යාව 06 දෙනෙකුගෙන් සමන්විත දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ වර්තමාන සභාපතිවරයාගේ වයස අවුරුදු 78 ක්ද එක් සාමාජිකයෙකුගේ වයස අවුරුදු 54 ක්ද අනෙක් සාමාජිකයන්ගේ වයස අවුරුදු 65 ත් 77 ත් අතර පරාසයකද පැවති අතර ඔවුන්ගේ සේවා කාලය අවුරුදු 03 සිට අවුරුදු 29 දක්වා වූ කාල පරාසයක පැවතුණි. තවද, වයස අවුරුදු 77 හා 78 ක් වූ සාමාජිකයන් දෙදෙනෙකු 1994 වර්ෂයේ සහ 1997 වර්ෂයේ සිට කොමිෂන් සභාවේ සාමාජිකයන් ලෙස දිගින් දිගටම නැවත පත් කිරීම් සිදු කර තිබූ අතර ඔවුන්ගේ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සේවා කාලය පිළිවෙලින් වර්ෂ 29 ක් හා 26 ක් ලෙස පැවතුණි. මේ අනුව, කොමිෂන් සභාවේ සාමාජිකයන් ආණ්ඩුකාරවර විසින් පත්කිරීමේදී වයස් සීමාවක් සඳහන් කර නොමැති වුවද, කාර්යයන් ඉටු කිරීමේදී කාලෝචිත හා ඵලදායි තීන්දු තීරණ ගැනීමට ඉතාමත් සුදුසු නිලධාරීන් පත් කිරීම වඩාත් යෝග්‍ය බව නිරීක්ෂණය කරන අතර සාමාජිකයින් අඛණ්ඩව දීර්ඝ කාලීන සේවය තුළින් පුද්ගල ආධිපත්‍ය ගොඩනැගීම සිදුවන බවද වැඩිදුරටත් නිරීක්ෂණය විය.	දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා සාමාජිකයන් මෙතෙක් දකුණු පළාත් සභාවේ සේවය කරන ලද විවිධ ආණ්ඩුකාරවරුන් විසින් ඔවුන්ගේ එක් එක් ධූර කාල තුලදී පත් කරන ලද සාමාජිකයන් වේ. යම් සාමාජිකයකු අලුතින් පත් කිරීම සඳහා මෙන්ම ඉහත දක්වා ඇති ප්‍රතිපාදන යටතේ කොමිෂන් සභාවට පත් කරනු ලැබ සිටි අයකු නැවත පත් කිරීමට පළාත් ආණ්ඩුකාරවරයාට හිමිවන බලතල කිසිදු නෛතික ප්‍රතිපාදනයකින් සීමා වී නොමැති බව හා එය පළාත් ආණ්ඩුකාවරයාගේ අභිමතය අනුව ක්‍රියාත්මක වන කාරණයක් බව.	කොමිෂන් සභා සාමාජිකයින් ලෙස සුදුසු සහ යම් වයස් සීමාවකට යටත්ව සාමාජිකයින් පත් කිරීමට කටයුතු කල යුතුය.

1.5.2 ශීර්ෂය 301 - දකුණු පළාත් සභා ලේකම් කාර්යාලය

(අ) නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

	නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව	අනුකූල නොවීම	ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	2019 මැයි 31 දිනැති අංක 13/2008(V) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙන්	යොමුගත චක්‍රලේඛයන්හි අනුමත ඉන්ධන සීමාවන් හා ඉන්ධන වර්ගය පිළිබඳව පළාත් සහා ප්‍රධාන ලේකම්වරුන් දැනුවත් කර	ඉන්ධන දීමනා ගෙවීමේදී නිලධාරීන් කාණ්ඩ වර්ගකර පදනම් දෙකක් යටතේ ඉන්ධන ගෙවා නොමැති අතර නිලධාරීන් භාවිතා කරන	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය.

	සංශෝධිත 2011 පෙබරවාරි 09 දිනැති අංක 13/ 2008 (IV) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය හා 2014 ජනවාරි 02 දිනැති 01/2014 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 2.1.3 (ii) ඡේදය	තිබියදී හා ඒ පිළිබඳ ලබා දී තිබූ නිර්දේශ නොසලකා සහ රාජ්‍ය වියදම් කළමනාකරණය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති සම්බන්ධ චක්‍රලේඛ විධිවිධාන අභිබවායමින් ආණ්ඩුකාරවරගේ 2019 මැයි 13 දිනැති අංක G/SP/1/6/1/19 දරන ලිපියෙන් ලද අනුමැතිය මත 2019 මැයි 16 දිනැති අංක 02- 2019 දරන ප්‍රධාන ලේකම් චක්‍රලේඛය (මුදල්) නිකුත් කර තිබුණු අතර ඒ අනුව දකුණු පළාත් සභා ලේකම් කාර්යාලයේ එක් තනතුරකට අයත් නිලධාරින් දෙදෙනෙකු වෙත 2019 මැයි මස සිට 2023 ජුනි දක්වා වූ කාලපරිච්ඡේදයට අදාළව රු.950,733 ක් අනුමත සීමාව ඉක්මවීම හේතුවෙන් සහ සුපිරි පෙට්‍රල් /සුපිරි ඩීසල් භාවිතය හේතුවෙන් රු.324,145 ක් ඉන්ධන දීමනා ලෙස වැඩිපුර ගෙවා තිබුණි.	වාහන සඳහා එම වාහන වලට භාවිතා කරන ඉන්ධන වර්ගය අනුව වර්ග දෙකක් හඳුනාගෙන ඇති අතර ඒ අනුව භාවිතා කරන සත්‍ය ඉන්ධන වර්ගය පදනම් කර ගෙන දීමනා ගෙවා ඇති බව.	
(ii)	2010 අගෝස්තු 09 දිනැති දකුණු පළාත් ආණ්ඩුකාර ලේකම්ගේ අංක G/SP/1/57 වෙළුම 01 දරන ලිපිය	යොමුගත ලිපියට අනුකූල නොවන ලෙස 2020 අගෝස්තු මස සිට 2022 ඔක්තෝබර් මස දක්වා කාලයට අදාළව දකුණු පළාත් සභාවේ සභාපතිවරයාට නිවසක් කුලියට ගැනීම වෙනුවෙන් රු.1,350,000 ක දීමනාවක් සභා ලේකම් කාර්යාලය විසින් ගෙවා තිබුණි.	2022 වර්ෂයේ නිකුත් කරන ලද පීඑස්/සීඑස්ඒ/11-18(1 හා පීඑස්/සීඑස්ඒ/11-18 (11) චක්‍රලේඛයන්ට අනුව 2022 ඔක්තෝබර් මස සිට මෙම දීමනාව ගෙවීම නතර කර ඇති බව.	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය.
(iii)	ජනාධිපති ලේකම් චක්‍රලේඛ			
	(අ) 2018 ඔක්තෝබර් 12 දිනැති අංක PS/CSA/11-18 චක්‍රලේඛයේ 1 වන ඡේදය	යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව පළාත් සභාව විසුරුවා හැරීමෙන් පසුව කාර්යාල දීමනා ගෙවිය නොහැකි වුවද දකුණු පළාත් සභාවේ සභාපතිවරයාට 2019 ඔක්තෝබර් මස සිට 2022 ඔක්තෝබර් මස දක්වා සභා ලේකම් කාර්යාලයෙන් කාර්යාල දීමනාව ලෙස රු.1,850,000 ක් ගෙවා තිබුණි.	ජනාධිපති ලේකම්ගේ 2018 ඔක්තෝබර් මස 12 දිනැති අංක: අංක:පීඑස්/සීඑස්ඒ/11-18 චක්‍රලේඛ ප්‍රකාරව කාර්යාල දීමනාව සම්බන්ධයෙන් කිසිදු සඳහනක් දක්වා නොමැති අතර, එම චක්‍රලේඛයෙහි ඇතුලත් නොවන වෙනත් දීමනා ගෙවීමෙන් වලකින ලෙසද සඳහනක් නොමැති බව සහ	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය.

			අංක CSS/7/1/2 හා 2019 මැයි 31 දිනැති ලිපියෙන් ලද අනුමැතිය ප්‍රකාරව මෙම දීමනාව ලබාදී ඇති බවත් එමෙන්ම 2022 වර්ෂයේ නිකුත් කරන ලද චක්‍රලේඛයන්ට අනුව 2022 ඔක්තෝබර් මස සිට මෙම දීමනාව ගෙවීම නතර කර ඇති බව.	
(බී)	2018 ඔක්තෝබර් 12 දිනැති අංක PS/CSA/11-18 දරන චක්‍රලේඛයේ 4.1 ඡේදය	යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව පළාත් සභාවේ සභාපතිවරයාට පෙට්‍රල් වාහනයක් සඳහා ලීටර් 600 ක්ද ඩීසල් වාහනයක් සඳහා ලීටර් 500 ක්ද ලබා දිය හැකි බව දන්වා තිබියදී එකී විධිවිධාන අභිබවායමින් දකුණු පළාත් ආණ්ඩුකාරවරයගේ අංක G/SP/1/2/1 /3/19 හා 2019 ජූලි 09 දිනැති ලිපිය ප්‍රකාරව ඩීසල් ලීටර් 600 ක් බැගින් ලබා ගැනීම නිසා 2019 ජූලි මස සිට 2022 සැප්තැම්බර් මස දක්වා චක්‍රලේඛයට අනුකූල නොවන ලෙස ඩීසල් ලීටර් 3,900 ක් වෙනුවෙන් රු.708,000 ක් සභා ලේකම් කාර්යාලයෙන් ගෙවා තිබුණි. තවද, චක්‍රලේඛ උපදෙස්වලට අනුකූල නොවන ලෙස සුපිරි ඩීසල් රේටයන් පදනම් කරගෙන ගෙවීම් කිරීම නිසා රු.682,525 ක වැඩිපුර ගෙවීමක්ද කර තිබුණි.	ආණ්ඩුකාර ලේකම්ගේ ජී/එස්පී/1/2/1/3/19 අංක සහ 2019 අගෝස්තු 09 දිනැති ලිපිය අනුව ගරු සභාපතිතුමා සඳහා ලබාදී ඇති නිල රථ දෙක සඳහා එක් වාහනයකට ඩීසල් ලීටර් 600 බැගින් 2019 අප්‍රේල් මස සිට ඉන්ධන දීමනාව ලබාදීමට අනුමැතිය ලැබී ඇති බව සහ මෙම රාජ්‍ය වියදම් කළමනාකරණය පිළිබඳ චක්‍රලේඛය අනුව ඉන්ධන දීමනා ගෙවීමේදී ලබාදිය යුතු ඉන්ධන වර්ගය කුමක්ද යන්න පිළිබඳ උපදෙස් ලබාදී නැත. 2014/1 ජාතික අයවැය චක්‍රලේඛය අනුව සාමාන්‍ය ඉන්ධන රේටයන් අනුව රජයේ නිලධාරීන්ට ඉන්ධන දීමනා ගෙවිය යුතු බව සඳහන් වුවද එම උපදෙස් වලංගු වන්නේ 2014-2016 කාලය සඳහා පමණක් බව.	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය.
(සී)	2018 ඔක්තෝබර් 12 දිනැති අංක PS/CSA/11-18 දරන චක්‍රලේඛයේ 4.2 ඡේදය	යොමුගත චක්‍රලේඛයට පටහැනිව දකුණු පළාත් සභාවේ සභාපතිවරයාගේ සම්බන්ධීකරණ හා මහජන සම්බන්ධතා ලේකම්වරුන්ට 2019 ඔක්තෝබර් මස සිට 2022 ඔක්තෝබර් මස දක්වා මසකට රු.50,000 බැගින් රු.3,700,000 ක් වූ වාහන දීමනාවක් සහ නිල වාහන සපයා නොතිබියදී 2019 අගෝස්තු සිට 2022 ඔක්තෝබර් දක්වා රු.2,516,680 ක් වූ ඉන්ධන දීමනාවක් සහ ලේකම් කාර්යාලයෙන් ගෙවා තිබුණි.	ජනාධිපති ලේකම්ගේ පීඑස්/සීඑස්ඒ/11-18 රාජ්‍ය වියදම් කළමනාකරණ චක්‍රලේඛයේ 3.4 වගන්තිය ප්‍රකාරව ගරු පළාත් සභා සභාපතිවරුන්ගේ සහාය කාර්ය මණ්ඩලයේ අංක:1,2 හා 4 යන නිලධාරීන් එනම් පිළිවෙලින් පෞද්ගලික ලේකම්, සම්බන්ධීකරණ ලේකම් හා මහජන සම්බන්ධතා නිලධාරී එක් නිල වාහනයක් සඳහා හිමිකම් ලබයි. නමුත් ඔවුන් වෙත ලබාදීමට ඒ වන විට කාර්යාලය සතුව අමතරව වාහන නොතිබූ බැවින් වාහන දීමනාවක්	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය.

			ලබාදීමට කටයුතු කර ඇති බව කෙසේ නමුත්, 2022 වර්ෂයේ නිකුත් කරන ලද පීඑස් /සීඑස්ඒ/ 11-18(1) හා පීඑස්/සීඑස්ඒ/11-18(11) චක්‍රලේඛයන්ට අනුව 2022 ඔක්තෝබර් මස සිට මෙම දීමනාව ගෙවීම නතර කර ඇති බව.	
(ඕ)	2022 සැප්තැම්බර් 27 දිනැති අංක PS/CSA/11-18(I) හා 2022 ඔක්තෝබර් 28 දිනැති අංක PS/CSA/11-18(II) දරන රාජ්‍ය වියදම් කළමනාකරණය- පළාත් සභා චක්‍රලේඛ	යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව පළාත් සභාවේ සභාපතිවරුන් වෙත ගෙවිය හැකි දීමනා පිළිබඳව පැහැදිලිව දක්වා තිබියදී ඊට අනුකූල නොවී සභා ලේකම් විසින් 2023 මාර්තු 30 දින කරන ලද ඉල්ලීම මත ඒ සඳහා දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමා 2023 අප්‍රේල් 06 දින දෙන ලද අනුමැතිය මත දකුණු පළාත් සභාවේ සභාපති වෙත වෛද්‍ය රක්ෂණාවරණයක් ලබාදීම සඳහා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව වෙත රු.104,818 ක මුදලක් ගෙවා තිබුණි. එමෙන්ම, 2011 අප්‍රේල් 27 දින පැවති අමාත්‍ය මණ්ඩල තීරණ 566 ප්‍රකාරව එවකට පැවති අමාත්‍ය මණ්ඩලය මගින් මේ සඳහා අනුමැතිය ලබාදී තිබුණද, 2022 වර්ෂයේදී රටේ පැවති මූල්‍ය අර්බුද හමුවේ ජනාධිපති ලේකම් විසින් පළාත් සභාවල රාජ්‍ය වියදම් කළමනාකරණය කිරීම සඳහා චක්‍රලේඛ මගින් වියදම් සීමා කිරිමට කටයුතු කරන ලෙස උපදෙස් ලබා දී තිබියදී ඒ අනුව කටයුතු කර නොතිබුණි.	2011 අප්‍රේල් 27 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ 566 පරිදි වාර්ෂික වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය සාර්ථකව ගරු ඇමතිවරුන්ට හා මන්ත්‍රීවරුන්ට ලබා දී ඇති අතර 2019 අප්‍රේල් 10 වන දින හත්වන පළාත් සභාව විසුරුවා හැරීමෙන් පසුව වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමයද අවලංගු විය. නමුත් 1987 අංක 42 දරණ පළාත් සභා පනතේ 7 වන වගන්තිය අනුව එසේ විසුරුවා හැරීමෙන් පසුවද පළාත් සභාවේ ගරු සභාපතිවරයා සිය ධුරය හිස් නොකර පවත්වාගෙන යායුතු බැවින් වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය අඛණ්ඩව ක්‍රියාත්මක කල යුතු බව.	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය.

(ආ) කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	2019 අප්‍රේල් 10 දින සිට දකුණු පළාත් සභාව විසුරුවා තිබූ බැවින් මන්ත්‍රීවරුන්ගේ ධූරකාලයද අහෝසි වී තිබුණද, සභාවේ එක් මන්ත්‍රීවරයෙකුට 2016 අගෝස්තු 22	අදාල මන්ත්‍රීවරයා විසින් ගිනි අවිය සොරගත් බවට හික්කඩුව පොලීසියේ සිදු කරන ලද පැමිණිල්ලට අදාල පැමිණිලි	පසු විපරම් කටයුතු විධිමත් පරිදි සිදුකල යුතුය.

	දින ලබාදී තිබුණු ගිනි අවිය සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් ආපසු රජයට භාරදී නොතිබුණි.	ලදුපතේ පිටපතක් ඉදිරිපත් කර ඇති බව.	
(ii)	අමාත්‍යවරුන්ට හා මන්ත්‍රීවරුන්ට රු.10,484,810 ක මුදලක් වැය කර ලැප්ටොප් යන්ත්‍ර 51 ක්, ටැබ් යන්ත්‍ර 54 ක් හා පරිගණක යන්ත්‍රයක් 2015 අගෝස්තු 25 දින ලබා දී තිබූ අතර 2019 අප්‍රේල් 10 දින සිට පළාත් සභාව විසුරුවා හැර තිබුණද, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් ඒවා ආපසු සභා ලේකම් කාර්යාලයට භාරදී නොතිබුණු නමුත් මේ දක්වාම ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	ඉදිරි කටයුතු සඳහා සුදුසු ක්‍රියාමාර්ග අනුගමනය කරන ලෙස දන්වා ඇති බව හා නැවත පළාත් සභාවක් පිහිටුවන තෙක් මේ සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ගයක් ගත නොහැකි වී ඇති බව.	අදාළ ලැප්ටොප්, ටැබ් හා පරිගණක යන්ත්‍ර නැවත ලබා ගැනීමට කටයුතු කල යුතුය.

1.5.3 ශීර්ෂය 302 - දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

(අ) නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව	**අනුකූල නොවීම**	**ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
2019 මැයි 31 දිනැති අංක 13/2008(V) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙන් සංශෝධිත 2011 පෙබරවාරි 09 දිනැති අංක 13/ 2008 (IV) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය හා 2014 ජනවාරි 02 දිනැති 01/2014 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 2.1.3 (ii) ඡේදය	යොමුගත චක්‍රලේඛයන්හි අනුමත ඉන්ධන සීමාවන් හා ඉන්ධන වර්ගය පිළිබඳව පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් දැනුවත් කර තිබියදී හා ඒ පිළිබඳ ලබා දී තිබූ නිර්දේශ නොසලකා සහ රාජ්‍ය වියදම් කළමනාකරණය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති සම්බන්ධ චක්‍රලේඛ විධිවිධාන අභිබවායමින් ආණ්ඩුකාරවරගේ 2019 මැයි 13 දිනැති අංක G/SP/1/6/1/19 දරන ලිපියෙන් ලද අනුමැතිය මත 2019 මැයි 16 දිනැති අංක 02- 2019 දරන ප්‍රධාන ලේකම් චක්‍රලේඛය (මුදල්) නිකුත් කර තිබුණු අතර ඒ අනුව දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ එක් තනතුරකට අයත් එක්	ඉන්ධන දීමනා ගෙවීමේදී නිලධාරීන් කාණ්ඩ වර්ගකර පදනම් දෙකක් යටතේ ඉන්ධන ගෙවා නොමැති අතර නිලධාරීන් භාවිතා කරන වාහන සඳහා එම වාහන වලට භාවිතා කරන ඉන්ධන වර්ගය අනුව වර්ග දෙකක් හඳුනාගෙන ඇති අතර ඒ අනුව භාවිතා කරන සත්‍ය ඉන්ධන වර්ගය පදනම් කර ගෙන දීමනා ගෙවා ඇති බව.	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය.

නිලධාරීයෙකු වෙත 2019 මැයි මස සිට 2023 ජුනි දක්වා වූ කාලපරිච්ඡේදයට අදාළව රු.1,005,520 ක් අනුමත සීමාව ඉක්මවීම හේතුවෙන් සහ සුපිරි පෙට්‍රල් /සුපිරි ඩීසල් භාවිතය හේතුවෙන් රු.340,540 ක් ඉන්ධන දීමනා ලෙස වැඩිපුර ගෙවා තිබුණි.

(ආ) කළමනාකරණ අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ලැබී ඇති දකුණු පළාත් රාජ්‍ය සේවයේ තනතුරු 10 කට අදාළ සේවා ව්‍යවස්ථාවන් අතුරින් සේවා ව්‍යවස්ථා 07 ක් සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභා අනුමැතිය ලැබී තිබුණු අතර සේවා ව්‍යවස්ථා 10 සඳහාම දකුණු පළාත් ආණ්ඩුකාරතුමාගේ අනුමැතියද ලැබී තිබුණි. කෙසේ වුවත් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් දකුණු පළාත් රාජ්‍ය සේවයේ කිසිදු තනතුරක් සඳහා සේවා ව්‍යවස්ථාවන්ට අදාළ ගැසට් නිවේදනයක් නිකුත් කර නොතිබුණි.	දකුණු පළාත් රාජ්‍ය සේවයේ සේවා ව්‍යවස්ථාවන් මධ්‍ය රජයේ සේවා ව්‍යවස්ථාවලට අනුරූපීව සකසනු ලැබේ. මධ්‍ය රජය විසින් මෙම සේවා ව්‍යවස්ථා භාෂාත්‍රයෙන්ම සකසා ගැසට් මඟින් ප්‍රකාශයට පත් කරනු ලබන බැවින් පළාත් රාජ්‍ය සේවය මගින්ද එම සේවා ව්‍යවස්ථා නැවත ගැසට් කිරීමේ අවශ්‍යතාවයක් නොවන බව.	සේවා ව්‍යවස්ථාවන් සඳහා අනුමැතිය ලබා දී ගැසට් නිවේදනයක් නිකුත් කිරීමට කටයුතු කල යුතුය.

1.5.4 ශීර්ෂය 304 - දකුණු පළාත් ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, පළාත් පාලන, ප්‍රවාහන, සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය, සංචාරක සහ ඉංජිනේරු සේවා අමාත්‍යාංශය

(අ) නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

	නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව	අනුකූල නොවීම	ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	දකුණු පළාත්, මූල්‍ය රීති 46.1	දකුණු පළාත් ප්‍රධාන අමාත්‍යාංශයේ වැය විෂයයන් 08 ක් වෙනුවෙන් ප්‍රතිපාදිත මුදල ඉක්මවා රු.2,701,831 ක් වූ බැරකම්වලට එළැඹ තිබුණි.	ඉදිරියේදී මු.රී 46.1 පරිදි කටයුතු කිරීමටත් මෙවැනි තත්වයන් පාලනය කිරීමටත් කටයුතු කරන බව	මූල්‍ය රීති ප්‍රකාරව කටයුතු කල යුතුය.

(ii)	මුල්‍ය රීති 259.2 හා දකුණු පළාත් ප්‍රධාන ලේකම්ගේ 2024 ජනවාරි 02 දිනැති අංක 03/2023 දරන ප්‍රධාන ලේකම් (ගිණුම් හා ගෙවීම්) චක්‍රලේඛය	යොමුගත රීතිය ප්‍රකාරව වර්ෂය අවසානයේදී ගිණුම් පියවිය යුතු අතර, දෙසැම්බර් මාසයේ 31 වන විට ඉතිරි වූ අග්‍රිම ශේෂය ඊළඟ වර්ෂයේ ජනවාරි 10 වන දිනට හෝ පළාත් භාණ්ඩාගාරය විසින් නියම කරනු ලබන දිනයට පෙර පළාත් භාණ්ඩාගාරය වෙත ආපසු ගෙවිය යුතු වුවත් දකුණු පළාත් ප්‍රධාන අමාත්‍යාංශයේ රු.179,441 ක් වූ අග්‍රිම ශේෂ සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි.	ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව	මුල්‍ය රීති අනුව කටයුතු කල යුතුය.
(iii)	2019 මැයි 31 දිනැති අංක 13/2008(V) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙන් සංශෝධිත 2011 පෙබරවාරි 09 දිනැති අංක 13/ 2008 (IV) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය හා 2014 ජනවාරි 02 දිනැති 01/2014 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 2.1.3 (ii) ඡේදය	යොමුගත චක්‍රලේඛයන්හි අනුමත ඉන්ධන සීමාවන් හා ඉන්ධන වර්ගය පිළිබඳව පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් දැනුවත් කර තිබියදී හා ඒ පිළිබඳ ලබා දී තිබූ නිර්දේශ නොසලකා සහ රාජ්‍ය වියදම් කළමනාකරණය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති සම්බන්ධ චක්‍රලේඛ විධිවිධාන අභිබවායමින් ආණ්ඩුකාරවරගේ 2019 මැයි 13 දිනැති අංක G/SP/1/6/1/19 දරන ලිපියෙන් ලද අනුමැතිය මත 2019 මැයි 16 දිනැති අංක 02- 2019 දරන ප්‍රධාන ලේකම් චක්‍රලේඛය (මුදල්) නිකුත් කර තිබුණු අතර ඒ අනුව දකුණු පළාත් ප්‍රධාන අමාත්‍යාංශයේ තනතුරු 04 කට අයත් නිලධාරින් 05 දෙනෙකු වෙත 2019 මැයි මස සිට 2023 ජුනි දක්වා වූ කාලපරිච්ඡේදයට අදාළව රු.2,471,315 ක් අනුමත සීමාව ඉක්මවීම හේතුවෙන් සහ සුපිරි පෙට්‍රල් /සුපිරි ඩීසල් භාවිතය හේතුවෙන් රු.1,090,657 ක් ඉන්ධන දීමනා ලෙස වැඩිපුර ගෙවා තිබුණි.	ඉන්ධන දීමනා ගෙවීමේදී නිලධාරීන් කාණ්ඩ වර්ගකර පදනම් දෙකක් යටතේ ඉන්ධන ගෙවා නොමැති අතර නිලධාරීන් භාවිතා කරන වාහන සඳහා එම වාහන වලට භාවිතා කරන ඉන්ධන වර්ගය අනුව වර්ග දෙකක් හඳුනාගෙන ඇති අතර ඒ අනුව භාවිතා කරන සත්‍ය ඉන්ධන වර්ගය පදනම් කර ගෙන දීමනා ගෙවා ඇති බව.	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය.

(iv)	දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද 2023 මාර්තු 29 දිනැති අංක SEC/2023/E/01 දරන සේවා නියුක්ති ආදායමෙන් අත්තිකාරම් පුද්ගල ආදායම් බදු (අ.පු.ආ.බ) අඩුකිරීම සම්බන්ධයෙන් සේවා යෝජකයින් සඳහා වන උපදෙස් මාලාවෙහි 02 ඡේදය	යොමුගත උපදෙස් මාලාව ප්‍රකාරව බදු අයකරනු ලැබීමට සමත් විය යුතු සේවා නියුක්ති මඟින් වන ලැබීම් සහ ලාභ ඇතුළත් විය යුතු වුවද, ප්‍රධාන අමාත්‍යාංශ නිලධාරින් දෙදෙනකු 2023 ජනවාරි සිට 2024 ජනවාරි 31 දින දක්වා කාලය තුළ ලබාගෙන තිබුණු රු.982,000 ක් වූ ප්‍රසම්පාදන කමිටු දීමනා උපයන විට බදු ගණනය කිරීම සඳහා පාදක කරගෙන නොතිබුණි.	2023 ජනවාරි සිට 2024 ජනවාරි 31 දක්වා කාලය තුළ ලබා ගෙන තිබුණු ප්‍රසම්පාදන දීමනාව රු.982,000 කි.එය උපයන විට ගෙවීම් සඳහා වූ බදු ගණනයට අදාළ කර ගෙන නොතිබුණු බවත්, මෙහි පෙර වර්ෂයට අදාළ දීමනාවක් වර්තමාන තත්වයට ගලපා අය කිරීම සම්බන්ධයෙන් දේශීය ආදායම් දෙපාර්තමේන්තු උපදෙස් ලබා ගෙන ඒ අනුව ඉදිරි වැටුප් ගෙවීම් මඟින් අදාළ බදු ගණනය සඳහා මෙම දීමනා මුදල අදාළ නිලධාරීන්ගෙන් අය කර විගණනය දැනුවත් කිරීමට කටයුතු කරන බව.	දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද උපදෙස් මාලාව අනුව කටයුතු කල යුතුය.

(ආ) කළමනාකරණ අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2019 සහ 2020 වර්ෂවල මන්ත්‍රී යෝජනා යටතේ දකුණු පළාත් සංවර්ධන අධිකාරිය විසින් රියදුරු පුහුණුව ලබා දීම සඳහා වෙන් කර තිබූ මුදලින් රු.15,000,000 ක් හා දකුණු පළාත් සංවර්ධන අධිකාරියේ පොදු ගිණුමෙහි 2021 දෙසැම්බර් 31 දිනට පැවති රු.8,281,140 ක මුදලින් රු.5,000,000 ක් 2021 දෙසැම්බර් 23 දින ප්‍රධාන අමාත්‍යාංශය වෙත ආපසු එවා තිබූ අතර එම මුදල් පොදු තැන්පත් ගිණුමේ රඳවා තබාගෙන 2023 පෙබරවාරි 09 දින රජයේ ආදායමට බැරකර තිබුණි. දකුණු පළාත් සංවර්ධන අධිකාරියේ කටයුතු මෙහෙයවීම හා අධීක්ෂණය දකුණු පළාත් ප්‍රධාන අමාත්‍යාංශයේ කාර්යයන් අතුරින් ප්‍රධාන කාර්යයක් වුවද, එම කාර්යයද අපේක්ෂිත පරිදි ඉටු කර නොතිබුණි.	මෙම ගිණුමෙහි පැවති ශේෂය 2019/2020 වර්ෂයන්හි මන්ත්‍රීවරුන්ගේ යෝජනා අනුව රියදුරු පුහුණු පාඨමාලා සිදු කිරීම වෙනුවෙන් රියදුරු පුහුණු පාසල් වෙත ගෙවීම් කිරීම සඳහා වෙන්ව තිබූ නමුත් එවකට පැවති කොවිඩ් 19 වසංගත තත්ත්වය වසර 03 ක් පැවතීම හේතුවෙන් පුහුණු පාඨමාලා නොපැවැත්වීම හා රියදුරු බලපත්‍ර නිකුත් කිරීම සිදු නොවූ බැවින් අපේක්ෂිත කාර්යයන් සඳහා වැය කිරීමට නොහැකි වී ඇති බව.	වෙන් කල ප්‍රතිපාදන යොදවා අපේක්ෂිත කාර්යයන් ඉටු කර ගැනීමට කටයුතු කල යුතුය.

(ඇ) ප්‍රසම්පාදනය

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i) පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන - 2023 යටතේ දකුණු පළාතේ බස් රථ සේවාවන්ට සමගාමී සේවා නියාමනය සඳහා රු.8,000,000 ක ප්‍රතිපාදන වෙන් කර තිබුණි. එම ප්‍රතිපාදන උපයෝගී කරගෙන දකුණු පළාතේ ත්‍රීරෝද රථ, පාසල් සේවා වාහන, කාර්යාල සේවා වාහන හා වෙනත් මගී සේවා වාහන නියාමනය සඳහා වෙබ් මත පදනම් වූ මාර්ගගත බලපත්‍ර නිකුත් කිරීමේ යෙදවුමක් නිර්මාණය කර දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය සැපයීමට ජාතික තරඟකාරී ලංසු කැඳවීම් ක්‍රමය යටතේ මිල ගණන් කැඳවීමට 2023 සැප්තැම්බර් 26 දින පුවත්පත් දැන්වීමක් පලකර තිබුණි. ඒ අනුව උක්ත යෙදවුම නිර්මාණය කර සැපයීම සඳහා වසර 05 ක වගකීම් කාලයක් සහිතව රු.7,590,000 කට (වැට් රහිත) සපයා සවිකිරිම සඳහා පෞද්ගලික සමාගමක් වෙත 2023 නොවැම්බර් 13 දිනැති අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව විසින් අනුමැතිය ලබා දී තිබුණි. මේ පිළිබඳ පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.		
(ඒ) අමාත්‍යාංශය විසින් යෙදවුම නිර්මාණය කිරිම වෙනුවෙන් ලබා ගෙන තිබූ රු.379,500 ක් වටිනා ලංකා බැංකු කාර්යයසාධන බැඳුම්කරය 2024 ජනවාරි 28 දින කල් ඉකුත් වී තිබූ අතර 2024 පෙබරවාරි 16 විගණන දින වන විටත් යෙදවුම නිර්මාණය කර භාරදී නොතිබුණද, කාර්යසාධන බැඳුම්කරයේ	මෙම ප්‍රසම්පාදනය 2023 දෙසැම්බර් 31 දිනට අවසන් කිරීමේ අපේක්ෂාව මත කාර්ය සාධන සුරක්ෂණය 2024 ජනවාරි 28 දින දක්වා ලබා ගෙන ඇති බව, 2023 දෙසැම්බර් 31 දිනට මෙම ව්‍යාපෘතියේ සියයට 80 ක ප්‍රමාණයක් අවසන් කර ඇති බවට තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් නිර්දේශ කර ඇති බැවින් ඉතිරි සියයට 20 ක ප්‍රමාණය 2024 ජනවාරි 28 දිනට පෙර අවසන් කිරීමට හැකියාව පවතී යැයි අපේක්ෂා කර	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූලව කටයුතු කල යුතුය.

	කාලය දීර්ස කර ගැනීමට කටයුතු කර නොතිබුණි.	බැවින් 2024 ජනවාරි 28 දින දක්වා වූ කාර්යසාධන සුරක්ෂණය දීර්ස කිරීමට කටයුතු නොකළ බව.	
(බී)	ආයතනයක් තෝරා ගැනීම සඳහා ලද මිල ගණන් තාක්ෂණික ඇගයීම් කමිටුවට යොමු කිරිමේදී තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් මෙම ආයතනයේ පසුගිය වසර 05 ක කාල සීමාව තුළ සිදුකරන ලද ව්‍යාපෘති සම්බන්ධව තොරතුරු ලිඛිත සාක්ෂි සහිතව ඉදිරිපත් කරන ලෙස දැනුම් දී තිබුණි. එහෙත් මෙම සමාගම, සමාගම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලියාපදිංචි වී ඇත්තේ 2023 අප්‍රේල් 18 දින බව විගණනයට නිරික්ෂණය විය.	මෙම ආයතනය දීර්ස කාලයක් ක්ෂේත්‍රයේ ක්‍රියාකාරී වී ඇති අතර ඊට අදාළ වසර 05 ක පළපුරුද්ද සහිත ලේඛණ තාක්ෂණ කමිටුව ලිඛිත කරුණු යටතේ තහවුරු කර තිබූ බවද, එහි වර්තමාන නාම ලියාපදිංචිය 2023 අප්‍රේල් 16 දින ALDTAN නාමය යටතේ ලියාපදිංචි වී තිබෙන බව.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූලව කටයුතු කල යුතුය. එමෙන්ම, අනෙකුත් රජයේ ආයතනයන් සමඟ සාකච්ඡා කර අඩු පිරිවැයක් යටතේ කටයුතු කිරිමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.
(සී)	ගිවිසුම්ගත වීමේදී රු.379,500 ක කාර්යසාධන බැඳුම්කරයක් ලබා ගැනීමේදී එම සමාගමේ ක්‍රියාකාරී අධ්‍යක්ෂවරුන් නොවූ බාහිර අයකුගේ ඉල්ලීම මත අදාළ සමාගම නමින් රක්වාන ලංකා බැංකු ශාඛාව වෙතින් ඉදිරිපත් කර තිබුණි. එමෙන්ම, අත්තිකාරම් ගෙවීමට අදාළ රු.1,518,000 ක අත්තිකාරම් ගෙවීම් සුරක්ෂණයද එම ලංකා බැංකු ශාඛාව වෙතින්ම 2023 නොවැම්බර් 24 දින නිකුත් කර තිබුණි.	මෙම ප්‍රසම්පාදනය 2023 දෙසැම්බර් 31 දිනට අවසන් කිරීමේ අපේක්ෂාව මත කාර්ය සාධන සුරක්ෂණය 2024 ජනවාරි 28 දින දක්වා ලබා ගෙන ඇති බව සඳහන් කරමි. 2023 දෙසැම්බර් 31 දිනට මෙම ව්‍යාපෘතියේ සියයට 80 ක ප්‍රමාණයක් අවසන් කර ඇති බවට තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් නිර්දේශ කර ඇති බැවින් ඉතිරි සියයට 20 ක ප්‍රමාණය 2024 ජනවාරි 28 දිනට පෙර අවසන් කිරීමට හැකියාව පවතී යැයි අපේක්ෂා කර බැවින් 2024 ජනවාරි 28 දින දක්වා වූ කාර්යසාධන සුරක්ෂණය දීර්ස කිරීමට කටයුතු නොකල බව.	විනිවිදභාවයකින් යුතුව කටයුතු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.

1.5.4.1 දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය

(අ) ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	සමාලෝචිත වර්ෂය සඳහා පාරිතෝෂිත වියදම රු.6,114,080 ක් විය යුතු වුවත්, එය රු.193,105 ක් ලෙස එනම් රු.5,920,975 ක් අඩුවෙන් මූල්‍යකාර්යය සාධන ප්‍රකාශයේ දක්වා තිබුණි.	2024 වර්ෂයේ සිට විගණනය පෙන්වා දී ඇති ආකාරයට අවශ්‍ය කටයුතු කරන බව.	නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කල යුතුය
(ii)	ප්‍රධාන අමාත්‍යාංශය විසින් අධිකාරිය වෙනුවෙන්, 2019 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා දරා තිබුණු වියදම් රු.49,854,693 ක් ගිණුම් පද්ධතියට ඇතුළත් කර නොතිබුණි.	2019 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා ප්‍රධාන අමාත්‍යාංශය මගින් දරණ ලද වියදම් ගිණුමට ඇතුලත් නොවුනු අතර 2023 වර්ෂයේ වියදම් වලට ඇතුලත් කල බව.	නිවැරදිව හා සම්පූර්ණව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කල යුතුය.
(iii)	සමාලෝචිත වර්ෂය සඳහා පාරිතෝෂිත වෙන්කිරීමේ ගිණුමේ ශේෂය රු.58,409,230 ක් විය යුතු වුවත් රු.54,807,235 ක් ලෙස රු.3,601,995 ක් අඩුවෙන් දක්වා තිබුණි.	පාරිතෝෂිත ගණනය කිරීම පරිගණක ආශ්‍රයෙන් සිදු කර ඇති අතර එහිදී එකතු කිරීමේ දෝශයක් සිදු වී ඇත. ඒ අනුව රු.3,601,995 ක් අඩුවෙන් ගණනය වී ඇති බව.	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 19 අනුව සමාලෝචිත වර්ෂයේ පාරිතෝෂිත වෙන් කිරීම් සිදුකල යුතුය.
(iv)	සේවක ණය ලෙස ලබාදී තිබුණු රු.22,217,916 ක මුදල මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දැක්වීමේදී, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 ප්‍රකාරව වසරකදී අයකර ගත හැකි රු.8,619,147 ක මුදල ජංගම වත්කම් යටතේ දක්වා නොතිබුණි.	ඉදිරි වර්ෂයේ සිට සේවක ණය ශේෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 අනුව ජංගම වත්කම් හා දිගුකාලීන වත්කම් යටතේ පෙන්වීමට කටයුතු කරන බව.	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 අනුව වත්කම් හඳුනාගත යුතුය.

(ආ) කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	2019 වර්ෂයේ සිට මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය විසින් ආරම්භකර තිබුණු, රු.626,355,000 ක ස්ථාවර තැන්පත් සඳහා රු.34,023,029 ක පොලී ආදායමක් ලැබී තිබුණු අතර, එම පොලිය වෙනුවෙන්, බැංකුව විසින් අඩු කර, සෘජුව දේශීය	දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත රඳවා ගැනීමේ බදු සම්බන්ධයෙන් දැනුම් දී ඇත. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මගින් ලබා දෙන උපදෙස් අනුව ඉදිරියේදී කටයුතු කරන බව.	අධිකාරිය විසින් ගෙවනු ලබන රඳවා ගැනීමේ බදු (WHT) සම්බන්ධයෙන් අදාල විධිවිධාන පරිදි කටයුතු කල යුතුය.

	අදායම් දෙපාර්තමේන්තුවට යවා තිබුණු සියයට 05 ක් වූ රු1,790,685 ක රඳවා ගැනීමේ බදු වටිනාකම (WHT) දේශිය අදායම් දෙපාර්තමේන්තුවෙන් යලි අයකර ගැනීමට හෝ අධිකාරියට බදු බැඳියාවක් නොමැති බැවින් දේශිය අදායම් දෙපාර්තමේන්තුවෙන් ලබා ගන්නා නිෂ්කාෂන සහතිකයක් මත රඳවා ගැනීමේ බදු අඩු නොකරන ලෙස අදාල බැංකුවෙන් ඉල්ලීමට හෝ කටයුතු කර නොතිබුණි.		
(ii)	මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය විසින් නඩත්තු කරනු ලබන ගාල්ල බස් නැවතුම්පොළ පරිශ්‍රයෙහි, රූපවාහිනි ඩිජිටල් තිර භාවිතයෙන් දැන්වීම් ප්‍රදර්ශනය කිරීම සඳහා අධිකාරියේ අන්‍යොන්‍ය සුභසාධක සමිතිය විසින් පුද්ගලික ආයතනයක් වෙත අධිකාරියට ගාස්තු ලබා ගැනීමකින් තොරව වසරක කාලයක් සඳහා පැවරීම සිදුකර සුභසාධන සමිතිය සමග ගිවිසුම්ගත වී තිබුණි. ඒ අනුව පුද්ගලික ආයතනයෙන් ලබාගත් තොරතුරු අනුව, දිනකට පැය 14 ක කාලයක් තුල, ප්‍රධාන කාණ්ඩ 7 ක් යටතේ දැන්වීම් ක්‍රියාත්මක කරන බවත්, ඉන් අවම දැන්වීම් ගාස්තුව අනුව මසකට තත්පර 8400 ක් සඳහා දැන්වීම් ගාස්තුව වශයෙන් රු.8,000 ක් අය කරන බවත් තහවුරු විය. ඒ අනුව අධිකාරියට වාර්ෂිකව අවම වශයෙන් රු.මිලියන 17 ක පමණ ආදායමක් ලබා ගත හැකිව තිබියදී බාහිර පාර්ශවයන්ට පැවැරීමට කටයුතු කර තිබුණි.	මෙම බස්නැවතුම්පොල 04 ම අධිකාරියේ අයිතිය යටතේ හෝ පරිපාලන අයිතිය පවතින බස්නැවතුම්පොලවල් හෝ නඩත්තු කරනු ලබන බස් නැවතුම්පොලවල් නොවන බැවින් බස් නැවතුම්පොළවල් සම්බන්ධයෙන් අධිකාරියට හෝ සාමාජික මණ්ඩල නිල බලයෙන් එහි කඩකාර බදු දීම හෝ ඒ යටතේ ආදායම් මුලාශ්‍ර සඳහා යොමුවීමේ බලයක් නොපවතින බව.	අධිකාරිය විසින් නඩත්තු කරන බස් නැවතුම්පොළ පරිශ්‍රයන් ආශ්‍රීතව ලබා ගත හැකි අදායම් මුලාශ්‍ර හඳුනා ගෙන ක්‍රියාත්මක කිරීමට කටයුතු කල යුතුය.
(iii)	GPS තාක්ෂණය බස් සේවා කළමනාකරණය සඳහා යොදා ගැනීම සඳහා වන ව්‍යාපෘති වාර්තාව අනුව, සෑම ගමන් වාරයකම අවම වශයෙන් විනාඩි 05 ක් බැගින්, දිනකට ගමන් වාර 13,000 ක් ප්‍රමාද වීමෙන් වසරකදී, දකුණු පළාතට විනාඩි 3,250,000 ක් අහිමි වන බව දක්වා තිබුණි. ඒ අනුව, එම ප්‍රමාද වන එක් ගමන් වාරයක් සඳහා, 1996 අංක 02 දරන දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය පිළිබඳ ප්‍රඥප්තිය ප්‍රකාරව දඩ මුදලක් අයකලේ නම්, වර්ෂයකට රු.මිලියන 949	මෙම ව්‍යාපෘතිය යටතේ ප්‍රඥප්තිගත අරමුණු වන ගුණාත්මක මගී ප්‍රවාහන සේවාවක් සැමට සාධාරණ වනපරිදි ගොඩ නැගීම යන මුඛ්‍ය අරමුණු යටතේ ක්‍රියාත්මක වන බැවින් හා ජාතික වශයෙන් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවද සෑම ප්‍රවාහන ආයතනයකටම දන්වා ඇති බැවින් එකී අරමුණු යටතේ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන බව.	ප්‍රමාද වන ගමන් වාර සඳහා, 1996 අංක 02 දරන දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය පිළිබඳ ප්‍රඥප්තිය ප්‍රකාරව දඩ මුදල් අය කර ගැනීමට කටයුතු කල යුතුය.

ක් අවම දඩ මුදල් වශයෙන් අය කර ගත හැකිව තිබියදී, සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රමාද ගමන් වාර සඳහා රු.80,750ක් පමණක් අය කර ගෙන තිබුණි. තවද එම මුදල අය කරගත හැකිව තිබූ මුදලින් සියයට 0.01 ක් පමණක් වී තිබුණි.

(ඇ) මෙහෙයුම් අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණය	**ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ දැක්වීම**	**අදහස් නිර්දේශය**
2022 දෙසැම්බර් මස 05 වන දින සියයට 15 ක පොලී අනුපාතයක් යටතේ මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය විසින් ආයෝජනය කර තිබුණු ස්ථාවර තැන්පතුවක්, කල් ඉකුත් වීමට දින 66 කට ප්‍රථම නිදහස් කරගැනීම හේතුවෙන් රු1,125,000 ක අලාභයක් සිදු වී තිබුණි.	අදාල මුදල මාස 11 ක කාලයක් ආයෝජනය කර දින 25 ක් සඳහා ආයෝජනය නොකරන ලද්දේ අදාල පියවීම් 2022 දෙසැම්බර් 31 සිදු කිරීම සඳහා වේ. එබැවින් අදාල ස්වංක්‍රියව කල්පිරෙන තෙක් එය තබා නොමැති බව.	මූල්‍ය කලමනාකරණය ප්‍රශස්ථ ලෙස සිදුකල යුතුය.

(ඇ) අවිධිමත් ගණුදෙනු

විගණන නිරීක්ෂණය	**ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ දැක්වීම**	**අදහස් නිර්දේශය**
2022 ජනවාරි 03 දින දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය විසින් ඉතිරි කිරීම් ගිණුමක අතිරික්ත මුදල් වසරකට සියයට 7.5 පොලියකට 2023 ජනවාරි 03 දිනට කල්පිරෙන අයුරින් රු.59,080,000 ක් ස්ථාවර තැන්පතුවක තැන්පත් කර තිබුණද, දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ පාලන සංවර්ධන මූල්‍ය අධ්‍යක්ෂකගේ අංක SPRTA/ACC/ F1/01 හා 2022 දෙසැම්බර් 30 දිනැති ලිපිය අනුව කල්පිරිමට දින 04 ක් තිබියදී රු.846,398 ක පොලී ආදායමක් යටතේ නිදහස් කර ගෙන තිබුණි.	මෙම පොලී අනුපාතිකයට වඩා වැඩි ප්‍රමාණයක් මුදල් පසුව ආයෝජනය කිරිමෙන් අධිකාරිය උපයා ගෙන ඇති බව.	මේ සම්බන්ධව පරීක්ෂණයක් සිදුකර ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතුය.

1.5.4.2 දකුණු පළාත් සංවර්ධන අධිකාරිය

(අ) ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දක්වා තිබූ චක්‍රිය අරමුදල් ණයගැති වටිනාකම හා විගණනය වෙත ලබා දුන් 2023 දෙසැම්බර් 31 දිනට කේවල ශේෂ ලේඛණය අනුව චක්‍රිය අරමුදල් ණයගැති වටිනාකම අතර රු.9,609,289 ක වෙනසක් පැවතුණි.	2017, 2018 ,2019, 2020, 2021, 2022 යන වර්ෂය ඇතිවූ වෙනස් හඳුනාගෙන පොදු ලෙජරයේ අවශ්‍ය ගැලපීම් කිරිමට කටයුතු කරමින් පවතින බව.	චක්‍රීය අරමුදල් ණයගැති වටිනාකම නිවැරදිව ගිණුම් ගත කල යුතුය.
(ii)	අධිකාරිය විසින් 2021 උපමාන පාදක සංවර්ධන සැලැස්ම යටතේ කන්ටේනර් පෙට්ටි භාවිතයෙන් අලෙවි මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය සඳහා රු.2,170,250 ක් වැය කර තිබුණි. නමුත්, විගණිත දින දක්වා එම වියදම ප්‍රාග්ධනිත කර නොතිබුණු බැවින් දේපල, පිරියත හා උපකරණ වටිනාකම රු.2,170,250 ක් අඩුවෙන් දක්වා තිබුණි.	අධිකාරිය විසින් 2021 උපමානපාදක සංවර්ධන සැලැස්ම යටතේ කන්ටේනර් පෙට්ටි භාවිතයෙන් අලෙවි මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය සඳහා රු.2,170,250ක් වැය කර තිබුණු නමුත් විගණිත දින දක්වා එම වියදම ප්‍රාග්ධනිත කර නොමැත. එම වරද නිවැරදි කර දේපල,පිරියත හා උපකරණ වටිනාකම පොත් වලට ඇතුලත් කිරිමට 2024 වර්ෂයේදී කටයුතු යොදා ඇති බව.	වත්කම් නිවැරදිව ගිණුම් ගත කල යුතුය.
(iii)	භාණ්ඩාගාරයෙන් විවිධ ව්‍යාපෘති වෙනුවෙන් ලැබී තිබුණු රු.55,000,000 ක මුදල් ව්‍යාපෘති ක්‍රියාත්මක නොකර අධිකාරියේ බැංකු ජංගම ගිණුම් තුළ රඳවාගෙන තිබීම හේතුවෙන් භාණ්ඩාගාරයට ප්‍රේෂණය කරන ලෙස දැනුම් දී තිබුණි. නමුත්, එම මුදලින් රු.20,000,000ක් පමණක් 2021 දෙසැම්බර් මස භාණ්ඩාගාරයට පියවා තවදුරටත් රු.35,000,000ක මුදලක් තවදුරටත් රඳවා ගෙන තිබුණි.	2021 දෙසැම්බර් 20 දින අමාත්‍යාංශ ලේකම් තුමා විසින් ගිණුම් වල ඉතිරිව ඇති මුදල් වෙනම් ආපසු එවන ලෙස කරන ලද දැන්වීම අනුව පොදු ගිණුමේ (පුනරාවර්තන වියදම් දරණ ගිණුමේ) තිබූ මුදලින් රු.5,000,000 ක්ද, මන්ත්‍රී ප්‍රතිපාදන ගිනුමේ ව්‍යාපෘති සඳහා ලැබූ මුදලින් ඉතිරිය රු 15,000,000 ක් ද ගරු සභාපති හා අධ්‍යක්ෂ ජනරාල් ගේ අනුමැතියෙන් 2021 දෙසැම්බර්23 දින ආපසු යවා ඇත. නමුත් චක්‍රිය අරමුදල් ණය ගෙවීම් ගිණුමෙන් ඉල්ලන ලද රු.30,000,000 ක මුදල අමාත්‍යාංශය වෙත නොයවා සිටිමට	භාණ්ඩාගාරයෙන් ව්‍යාපෘති සඳහා මුදල් එකී ව්‍යාපෘතිවල අරමුණු ඉටුකර ගැනීම වෙනුවෙන් කාර්යක්ෂමව යොදාගත යුතුය.

		තිරණය කර ඇත. ඊට හේතුව වූයේ ණය නිකුත් කිරිම ආරම්භ වූ පසු උපයෝගි කර ගැනිමට වේ.	
(iv)	2021 වර්ෂයේ කන්ටේනර් පෙට්ටි භාවිතයෙන් අලෙවි මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් දරන ලද රු.1,570,250 ක් වූ වියදම් වලට අදාළ වවුචරය අස්ථානගත වී තිබුණි.	කන්ටේනර් පෙට්ටි භාවිතයෙන් අලෙවි මධ්‍යස්ථානක් ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය යටතේ ඉටු කරනු ලැබු නව වැඩසටහනකි .එම මිලදී ගැනීමේ වවුචරය අස්ථාන ගත වී ඇති බව දැනගත් වහාම ඒ පිළිබඳව ගරු සභාපතිතුමන්ට හා අධ්‍යක්ෂ ජනරාල් වෙත දන්වන ලදි.ඒ පිළිබඳව පරීක්ෂණයක් ඉදිරියේදි පැවැතවීමට අවශ්‍ය කටයුතු සිදු කිරීමට නියමිත බව.	මූල්‍ය රීති ප්‍රකාරව වවුචර්වල ආරක්ෂාව තහවුරු කල යුතුවීම අස්ථානගත වූ වවුචර් සම්බන්ධයෙන් කටයුතු කල යුතුය.

(ආ) නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව	**අනුකූල නොවීම**	**ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
ජ්‍යෝෂ්ඨ කළමනාකරණ සේවා ගණයෙහි තනතුර සඳහා බඳවා ගැනීමේ පටිපාටියෙහි 4.1 ඡේදය	යථෝක්ත ඡේදය ප්‍රකාරව ජ්‍යෝෂ්ඨ කළමනාකරණ සේවා ගණයෙහි තනතුරක් සඳහා බඳවා ගැනීමේදී බාහිර අයදුම්කරුවන් වෙත තිබිය යුතු සුදුසුකම් ලෙස පිළිගත් උපාධියක් සමඟ පශ්චාත් උපාධියක් දක්වා තිබුණද දකුණු පළාත් සංවර්ධන අධිකාරියෙහි අධ්‍යක්ෂ ජනරාල් තනතුරේ දැනට කටයුතු කරන නිලධාරියා විසින් එම සුදුසුකම් සපුරා නොතිබුණි.	නඩු කටයුතු පවතින බව හා මේ වන විට එකී නඩුව වාර 07ක් කැඳවා ඇති බවත් එබැවින් අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා බඳවා ගැනීම තවකාලිකව නතර කර ඇත. එබැවින් 2019 සැප්තැම්බර් 23 දින ගරු ආණ්ඩුකාරතුමාගේ නිර්දේශ අනුව මෙම අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත වත්මන් වැඩ බලන අධ්‍යක්ෂ ජනරාල්වරයා පත් කර ඇති බව.	බඳවා ගැනීම් පටිපාටිය ප්‍රකාරව කටයුතු කල යුතුය.

(ඇ) කළමනාකරණ අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
දකුණු පළාත් සංවර්ධන අධිකාරියේ ස්වයං රැකියා ආධාර ලබා දීම සම්බන්ධයෙන් විධිමත් මාර්ගෝපදේශයන් ආයතනය විසින් සකස් කර නොතිබුණු අතර පළාත් සභා මන්ත්‍රීවරයෙකු විසින් ලබා දෙනු ලබන නාම ලේඛන පදනම් කර ගනිමින් ස්වයං රැකියා ආධාර ලබා දී තිබුණි. 2020, 2021 සහ 2022 වර්ෂ වලදීද දකුණු පළාත් සභාව ක්‍රියාත්මක නොවන තත්ත්වයක් තුල මන්ත්‍රී ප්‍රතිපාදන, මන්ත්‍රීවරුන්ගේ නාමයන් යටතේ ලබා දි තිබුණි. ඒ අනුව පසුගිය පළාත් සභාව නියෝජනය කල පළාත් සභා මන්ත්‍රීවරු 13 දෙනෙක් විසින් ඉදිරිපත් කරන ලද නාම ලේඛන වලට අනුව රු.2,945,583 ක් ස්වයං රැකියා ආධාර ලෙස 2021 වර්ෂයේ ලබා දී තිබුණි.	ස්වයංරැකියා ආධාර ලබාදීම යටතේ 2020 2021-2022 වර්ෂවල පළාත් සභා මන්ත්‍රීවරු වෙනුවෙන් වෙන්කල මුදල් වලින් ප්‍රතිලාභීන්ගේ හැකියාව හා නියැලීම මත ස්වයංරැකියා ආධාර ලබාදෙන ලද බව.	විධිමත් මාර්ගෝපදේශයන් ආයතනය විසින් සකස් කල යුතුය.

(ඇ) නොවිසදී ඇති විගණන ඡේද

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
දකුණු පළාත් සංවර්ධන අධිකාරියේ තේපැල ලක්ෂ 25 ක් සැපයීම සම්බන්ධයෙන් රජයට සෘජුවම සිදුවී ඇති රු.18,034,507 ක අලාභය අදාළ පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටද කටයුතු කර නොතිබුණි.	තේ පැල සම්බන්ධයෙන් වූ අලාභය අය කර ගැනිම සදහා ගාල්ල දිසා අධිකරණයේ නඩුවක් විභාග වෙමින් පවති. මේ වන විට 19 වාරයක් නඩුව රැස් වී ඇති බව.	විසදී නොමැති විගණන ඡේද පිළිබඳ අවධානය යොමු කර නිරවුල් කිරීමට කටයුතු කල යුතුය.

1.5.4.3 රුහුණු සංචාරක කාර්යාංශය

(අ) ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 72 ඡේදය ප්‍රකාරව ඉඩම් සඳහා ක්ෂය ගණනය නොකල යුතුය යන්න දක්වා ඇතත් රු.48,609,644 ක් වටිනාකම වූ ඉඩම් සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.2,430,482 ක ක්ෂය කර තිබුණි.	රුහුණු සංචාරක කාර්යාංශය විසින් ගිණුම් සකස් කිරීම ආරම්භ කල දින සිට ඉඩම් ගොඩනැගිලි දෙක සඳහාම ක්‍ෂය කර ඇත.මින් ඉදිරියට ඉඩම් සඳහා ක්‍ෂය ගණනය නොකරනු ලබන බව.	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අනුව කටයුතු කල යුතුය.
(ii)	ඉඩම්, ගොඩනැගිලි ආරම්භක ශේෂය ඉකුත් වර්ෂය අවසානයේ ධාරණ අගය වූ රු.185,403,610 ක් වුවද සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂය රු.182,293,461 ක් ලෙස දක්වා තිබීමෙන් රු.3,110,149 කින් ස්ථාවර වත්කම් අඩුවෙන් දක්වා තිබුණි.	ඉකුත් වර්ෂය අවසානයේ ශුද්ධ ධාරන අගය 185,403,610 නිවැරදි අගය නොවන අතර නමුත් 2022 වර්ෂය ඉදිරිපත් කල තොරතුරුම සටහනේ දැක්විය යුතු බැවින් එම තොරතුරු පෙන්වා ඇත.නමුත් 2023 ආරම්භක ශේෂය ලෙස නිවැරදි ආරම්භක ශේෂය ලබා ගන්නා ලදී.එසේ නොවුනහොත් 2023 වර්ෂය අගය නිවැරදිව ලබා ගැනීම නොහැකි වන බැවිනි.ඒ අනුව රු.182,293,461 ක අගය නිවැරදි අගය බවත් රු.3,110,149 කින් ස්ථාවර වත්කම් අඩු වීමක් සිදු වී නොමැති බව.	වත්කම් නිවැරදිව හඳුනා ගෙන ගිණුම් ගත කල යුතුය.
(iii)	ඉඩම් ගොඩනැගිලි සඳහා වර්ෂයේ එකතු කිරීම්, ලෙජර් ගිණුම අනුව රු.8,775,631 ක් වුවද ගිණුම්කරණ සටහන් 16 අනුව රු.12,916,612 ක් ලෙස දැක්වීම හේතුවෙන් ස්ථාවර වත්කම් වටිනාකම රු.4,140,981 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.	ලෙජර් ගිණුමට අනුව වර්ෂයේ එකතු කිරීම් රු. 8,775,631 වුවද ලෙජරය තුළ සමුච්චිත අරමුදලින් ගැලපීම් රු. 4,140,981 ක් පමණ වේ. එය සකස් වී ඇත්තේ 2022 වර්ෂයේ ප්‍රත්‍යාගණනය කලද ගිණුම් වලට නොහොත් අකුරල ඉඩම රු 3,000,000 හා 2021 වර්ෂයේ ඉඩම් වල එකතුව ලබාගැනීමේදි අඩුවෙන් සටහන් වූ රු.270,509.96 හා මදූනාගල වැසිකිළි පද්ධතිය ඉදිකිරීම් වෙනුවෙන් දරන ලද නමුත් 2022 සටහන් නොවූ රු 4,062,175 .08	වත්කම් නිවැරදිව හඳුනා ගෙන ගිණුම් ගත කල යුතුය.

		හා උණුදිය උල්පත් අසල ඉදිකර ඇති changing rooms සඳහා වැය වන ලද රු 188,880 මුදලිනි.ඒ අනුව ඉඩම් සහ ගොඩනැගිලි වල වැඩියෙන් සටහන් වීමක් සිදු වී නොමැති බව.	

(ආ) ආර්ථික නොවූ ගණුදෙනු

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	දේශීය හා විදේශීය සංචාරකයින්ට තොරතුරු සැපයීම සඳහා රුහුණු සංචාරක කාර්යාංශය විසින් රු.1,350,000 ක් වැයකර 2022 වර්ෂයේදී හික්කඩුව, වැලිගම හා තංගල්ල යන නගර වල ස්වයංක්‍රීය KIOSK යන්ත්‍ර 03 ක් සවිකර තිබුණද, එම KIOSK යන්ත්‍ර 03 ම විගණිත අවස්ථාව වන විටත් කිසිදු සංචාරකයකු විසින් භාවිතා කරමින් නොපැවතුණ අතර ඒ හේතුවෙන් මෙම යන්ත්‍ර සහ කුටි වෙනුවෙන් දරා තිබූ වියදම වූ රු.2,488,954 ක මුදල සම්පූර්ණයෙන්ම නිෂ්කාර්ය වියදමක් බවට පත්වී තිබුණි.	නගරාසන්නයේ පවතින නිසා නිරන්තර කුණු දූවිලි වලින් පිරෙන අතර කාර්යාංශයේ කම්කරු නිලධාරීන් විසින් මසකට වතාවක් පිරිසිදු කිරීම් සිදු කරනු ලබන බව හා දොරෙහි අගුල අක්‍රීය වීම සම්බන්ධයෙන් කුටි සකස් කිරීම් සිදුකරන ලද ආයතනය දැනුවත් කරන ලදී.එම ආයතනය ලවාම අදාළ කටයුත්ත සිදුකල යුතුව ඇත්තේ වීදුරුවට හානි සිදුවීම වලකමින් අදාළ අක්‍රීය වීම ආරක්ෂිතව සකස් කල යුතු බැවිනි.	වත්කම්වල ආරක්ෂාව සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු අතර වෙනත් ඵලදායී කාර්යයකට යොදවා ගැනීම කෙරෙහි අවධානය යොමු කල යුතුය.
(ii)	2023 ජුනි 30 දිනට හික්කඩුව අභිමංසල ගොඩනැගිල්ල බදු ලබාගත් ආයතනයෙන් රුහුණු සංචාරක කාර්යාංශය වෙත රු.5,703,750 ක මුදලක් අයවීමට පැවතුණි. එමෙන්ම, ගොඩනැගිල්ල සඳහා රු.47,722,156 ක වියදමක් දරා තිබුණද අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීමට හා සංචාරක ක්ෂේත්‍රය ප්‍රවර්ධනය සඳහා දායකත්වයක් ලබාදීමට නොහැකි වීම මත හික්කඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට නැවත පවරා ගෙන තිබුණි.	හිඟ බදු මුදල් අය කර ගැනීමට ලිඛිතව දන්වා ඇත. මේ සඳහා නිතීමය කටයුතු සිදු වෙමින් පවතී.	අයකර ගැනීමට ඇති හිඟ මුදල් අයකර ගැනීමට හා අදාළ වත්කම් ඵලදායී කටයුතු සඳහා යෙදවීමට අවශ්‍ය කටයුතු කල යුතුය.

1.5.5 ශීර්ෂය 305 - දකුණු පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව

(අ) නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

	නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව	අනුකූල නොවීම	ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම	නිර්දේශය
	දකුණු පළාත් සභා මූල්‍ය රීති			
(i)	මූල්‍ය රීති 46.1	දකුණු පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ වැය විෂයයන් 27 ක් වෙනුවෙන් ප්‍රතිපාදිත මුදල ඉක්මවා රු.476,540,487 ක් වූ බැරකම්වලට එළැඹී තිබුණි.	ඉදිරියේදී මූ.රී 46.1 පරිදි කටයුතු කිරීමටත් මෙවැනි තත්වයන් පාලනය කිරීමටත් කටයුතු කරන බව	මූල්‍ය රීති ප්‍රකාරව කටයුතු කල යුතුය.
(ii)	මූල්‍ය රීති 54	2023 දෙසැම්බර් 31 දිනට දකුණු පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ වාහන අනතුරු 58 කට අදාළව රු.38,685,020 ක් වූ අලාභයන් සම්බන්ධයෙන් තවදුරටත් අයකර ගැනීමට හෝ කපාහැරීමට පැවති අතර ඒ තුල වසර 05 ට අඩු රු.28,202,395 ක් වූ සිද්ධි 43 ක්ද වසර 05-10 ත් අතර රු.9,729,426 ක් වූ සිද්ධි 14 ක්ද වසර 10 ට වඩා වැඩි රු.753,200 ක එක් සිද්ධියක්ද පැවතුණි. මේ සම්බන්ධයෙන් පවත්වාගෙන යනු ලබන පරීක්ෂණ කාර්යයන් කඩිනමින් අවසන් කල යුතු වුවත් එසේ ක්‍රියාකර නොතිබුණි.	පෙන්වා දී ඇති වාහන අනතුරු අතුරින් 18 ක් මේ වන විට විසඳීමට කටයුතු කර ඇති අතර, 2024.05.15 දින වන විට තවදුරටත් විසඳීමට ඇති වාහන අනතුරු සංඛ්‍යාව 40 කි. එබැවින් ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව	මූල්‍ය රීති ප්‍රකාරව කටයුතු කල යුතුය.
(iii)	මූල්‍ය රීති 259.2 හා දකුණු පළාත් ප්‍රධාන ලේකම්ගේ 2024 ජනවාරි 02 දිනැති	යොමුගත රීතිය ප්‍රකාරව වර්ෂය අවසානයේදී ගිණුම් පියවිය යුතු අතර, දෙසැම්බර් මාසයේ 31 වන විට ඉතිරි වූ අග්‍රිම ශේෂය ඊළඟ වර්ෂයේ ජනවාරි 10 වන	ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව	මූල්‍ය රීති අනුව කටයුතු කල යුතුය.

අංක 03/2023 දරන ප්‍රධාන ලේකම් (ගිණුම් හා ගෙවීම්) චක්‍රලේඛය	දිනට හෝ පළාත් භාණ්ඩාගාරය විසින් නියම කරනු ලබන දිනයට පෙර පළාත් භාණ්ඩාගාරය වෙත ආපසු ගෙවිය යුතු වුවත් දකුණු පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ රු.111,851,705 ක්වූ අග්‍රිම ශේෂ සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබූ අතර එම ශේෂය තුළ 2020 සිට 2022 දක්වා වර්ෂ 03 ඉක්මවූ සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ලැබිය යුතු රු.4,755,322 ක ශේෂයක්ද ඇතුලත් වූ අතර එම මුදල සම්බන්ධයෙන් ලිඛිත තහවුරු කිරීම් විගණනයේදී ඉදිරිපත් නොවුණි.

(ආ) කළමනාකරණ අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2015 මැයි 21 දින ඉමදූව දිසා රෝහලට අයත් දරන ගිලන් රථයට වූ අනතුර සම්බන්ධයෙන් අනතුර සිදුවී වසරකට පසු රක්ෂණ ආයතනය දැනුවත් කිරීම නිසා රක්ෂණ වන්දි ලැබී නොතිබුණි. 2016 දෙසැම්බර් 14 දිනැති ත්‍රිපුද්ගල කමිටු වාර්තාව අනුව අළුත්වැඩියාව ඵලදායී නොවන බැවින් අබලි ද්‍රව්‍ය ලෙස අපහරණය කිරීම සඳහා 2017 ජනවාරි 10 දින රථය සෞඛ්‍ය අමාත්‍යාංශයට භාරදී තිබුණි. මේ සම්බන්ධයෙන් 2015 නොවැම්බර් 23 දින පත් කරන ලද මූලික විමර්ශන කමිටුවේ වාර්තාව විගණනයට ඉදිරිපත් නොවූ අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වාම විමර්ශන වාර්තාවේ නිර්දේශ අනුව අලාභය අයකරගෙන නොතිබුණි.	ගිලන් රථය 2015 මැයි 21 අනතුරට පත්වීම සම්බන්ධයෙන් ගොනු පරීක්ෂා කිරීමේදී යොමු කරන ලද මූලික විමර්ශන වාර්තා සහ මු.රෙ වාර්තා අතර පරස්පරතාවයක් නිරීක්ෂණය වූ බැවින් මේ පිළිබඳව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට ප්‍රථම ප්‍රධාන අමාත්‍යාංශ ලේකම් සමඟ සාකච්ඡාවක් ලබා දෙන ලෙස 2024 මාර්තු 13 දිනැතිව යොමු කරන ලද බව.	මූල්‍ය රීති අනුව කටයුතු කල යුතු අතර විමර්ශන වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කල යුතුය.

(ඇ) මෙහෙයුම් අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	හම්බන්තොට ජීව වෛද්‍ය ඉංජිනේරු ඒකකය මඟින් 2019 සිට 2023 දක්වා කාලය තුළ පුද්ගලික සමාගම් දෙකක් වෙත මිල ගණන් කැඳවා ලබාදී තිබූ දළ වටිනාකම රු.28,380,000 ක් වූ වෛද්‍ය උපකරණ 84 ක අළුත්වැඩියා කටයුතු විගණිත දින වන විටද නිමකර නොතිබුණි.	ආයතන මඟින් විමසුවද පිළිතුරු නොලැබීම නිසා සිහිකැඳවීම් සිදුකල බව.	අදාළ සමාගම් දෙක මඟින් අළුත්වැඩියාවන් පිළිබඳ තහවුරු කිරීම් ලබාගත යුතුය.
(ii)	අළුත්වැඩියාව සඳහා යොමුකර තිබූ වෛද්‍ය උපකරණ පිළිබඳ ලේඛනය අනුව ආයතන 301 කින් 2017 සිට 2023 වර්ෂය දක්වා ගාල්ල, මාතර, හම්බන්තොට ජීව වෛද්‍ය ඉංජිනේරු කාර්යාල වෙත අලුත්වැඩියාව සඳහා යොමු කර තිබූ පිළිවෙලින් 1,178 ක්, 112 ක් සහ 252 ක් ලෙස එකතුව 1,726 ක් වූ වෛද්‍ය උපකරණ අලුත්වැඩියාවන්ට අදාළ කාර්යයන් නිමකර නොතිබුණි.	මේ වන විට අලුත්වැඩියා කටයුතු නොකෙරුණු සියළුම වෛද්‍ය උපකරණ වලට අදාල පසුවිපරම් මේ වනවිටත් අප ආයතන විසින් තංගල්ල මූලික රෝහල හා දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය හා අදාල දේශීය නියෝජිත ආයතනයන් සම්බන්ධ කරගනිමින් සිදුකරන බව	අළුත්වැඩියාවන් කාර්යයන් කඩිනමින් නිමකල යුතුය.

(ඈ) මතභේදයට තුඩුදුන් ගණුදෙනු

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	2008 අගෝස්තු මස 28 දින ධාවනයට නුසුදුසු බැවින් දකුණු පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවට අයත්ව තිබූ යකඩ සඳහා විකුණන ලද මිට්සුබිෂි ජීප් රථය සහ ටොයෝටා ලැන්ඩ් කෲෂර් රථය 2009 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වාම පුද්ගලික නම්වලින් අදායම් බලපත්‍ර ලබාගෙන තිබුණි.	මේ සම්බන්ධව තවදුරටත් කරුණු සොයා බලා විගණනයට වාර්තා කරන බව.	සිද්ධියට අදාළව වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන රජයට වූ හානිය අයකර ගත යුතුය.
(ii)	දකුණු පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ නමින් ලියාපදිංචි කර තිබූ වාහන 02 ක් ආයතනය මඟින් වාහන අපහරණය කිරීම් යටතේ දක්වා නොමැති වුවද එම වාහන	මේ සම්බන්ධව තවදුරටත් කරුණු සොයා බලා විගණනයට වාර්තා කරන බව.	සිද්ධියට අදාළව වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන රජයට වූ හානිය අයකර ගත යුතුය.

දෙක පිළිවෙලින් 2018 වර්ෂයේදී පෞද්ගලික නම් යටතේ ලියාපදිංචි කර තිබුණු අතර 2023 වර්ෂය දක්වාම ආදායම් බලපත්‍ර ලබාගෙන තිබුණි.

(ඉ) දෘශ්‍ය අක්‍රමිකතා

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	හම්බන්තොට දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයට අයත් ගිලන් රථ 03 ක එන්ජින් අංක වෙනස්වීම සම්බන්ධයෙන් 2023 නොවැම්බර් 16 දින විමර්ශන කමිටුවක් පත්කර තිබුණද, විගණිත දිනය දක්වාම වගකිව යුත්තන් හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි.	විමර්ශන කමිටුවේ නිර්දේශයන් අනුව ඉදිරි කටයුතු සිදුකරන බව.	කඩිනමින් විමර්ශන නිර්දේශයන් ක්‍රියාත්මක කල යුතුය.
(ii)	2016 වර්ෂයේ සිට ක්‍රියාත්මක වූ වෛද්‍ය සැපයුම් තොරතුරු කළමනාකරණ පද්ධතිය (MSMIS) මඟින් කල් ඉකුත් වූ ඖෂධ වසරක් තුළ හඳුනාගෙන අපහරණය සඳහා කටයුතු කර, මුදල් රෙගුලාසි 102 සිට 109 ප්‍රකාරව පොතෙන් කපාහැරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්වරයා වෙත යොමු කල යුතු බව 2021 දෙසැම්බර් 08 දිනැති අංක 01/2021 දරන සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්වරයාගේ චක්‍රලේඛයේ දක්වා තිබුණද ඒ අනුව කටයුතු කර නොතිබුණි. එසේම කමිටු වාර්තා මඟින් අනාවරණය වූ රු.මිලියන 23.6 කට ආසන්න කල් ඉකුත් වූ ඖෂධ PRONTO පද්ධතිය මඟින් විධිමත් අවසරයකින් තොරව භාණ්ඩ සමීක්ෂණය සඳහා ලබාදී තිබූ මුරපද භාවිතා කර මකා දමා තිබුණි.	මේ සම්බන්ධයෙන් සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් 2023 සැප්තැම්බර් 27 දිනැති ලිපිය මඟින් ඉල්ලීම සිදුකලද ඒ සඳහා උපදෙස් ලබාදී නොමැති බව.	පද්ධතිය මඟින් ඖෂධ ඉවත් කිරීම සම්බන්ධ මූලික විමර්ශනයේ නිර්දේශ ප්‍රකාරව කටයුතු කල යුතුය.
(iii)	උඩුගම මූලික රෝහලේ ගිලන් රථ 03 කට අදාළව ව්‍යාජ ධාවන සටහන් සකස් කිරීම, අනුමැතියකින් තොරව ගිලන් රථ ධාවනය කිරීම, ඉන්ධන තුලනය ව්‍යාජව සිදු කිරීම සහ ව්‍යාජ ගමන් වාර සටහන් කිරීම හරහා රජයට වංචා කර තිබූ ඩීසල් ලීටර් 793 ක් සහ සුපර් ඩීසල් ලීටර් 369 ක වටිනාකම වූ රු.457,009 ක මුදල	මූලික විමර්ශන වාර්තාව ප්‍රධාන අමාත්‍යාංශයට යොමුකර ඇති අතර එම නිර්දේශ අනුව ඉදිරි කටයුතු සිදුකරන බව.	රජයට සිදුවූ අලාභය අයකර ගැනීම සහ වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගැනීම කඩිනමින් සිදුකල යුතුය.

සම්බන්ධයෙන් ලබා දී තිබූ මූලික විමර්ශන වාර්තාවේ නිර්දේශ සහ ආයතන සංග්‍රහයේ II කොටසේ උපලේඛනය ප්‍රකාරව කටයුතු කර රජයට සිදුවූ අලාභය අයකර ගැනීම සහ අදාළ සිද්ධියට වගකිවයුතු නිලධාරීන් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.

(ඊ) ආර්ථික නොවූ ගණුදෙනු

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	කඹුරුපිටිය මූලික රෝහලට මධ්‍ය වායු සමීකරණ පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා රු.14,416,500 ක බදු රහිත වටිනාකමට 2015 සැප්තැම්බර් 28 දින පුද්ගලික සමාගමක් සමඟ ප්‍රධාන අමාත්‍යාංශය ගිවිසුම් ගත වී තිබූ අතර, 2015 දෙසැම්බර් 28 දින වන විට වැඩ අවසන් කල යුතුව පැවතුණි. එසේ වුවද නියමිත දිනට හෝ පසුව ව්‍යාපෘතිය නිමකර විධිමත්ව භාරදී නොතිබුණි. විගණිත දිනය වූ 2023 නොවැම්බර් 15 දින වන විට අදාළ සමාගම වෙත එකතුව රු.13,727,482 ක මුදලක් දෝෂ නිවැරදි කිරීම වෙනුවෙන්ද, විදුලිය ලබා ගැනීම සහ සේවා කිරීම සඳහා වෙනත් ආයතන වෙත රු.938,940 ක්ද වැයකර තිබුණද මධ්‍ය වායු සමීකරණ පද්ධතිය සවි කරන ලද අවස්ථාවේ සිටම ක්‍රියාකාරී තත්ත්වයේ නොපැවතුණි. තවද, මෙම ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තු සකස් කිරීමේ සිට ව්‍යාපෘතිය අවසන් කිරීම දක්වාම ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කර නොතිබුණි.	ප්‍රධාන අමාත්‍යාංශය මඟින් පත්කර ඇති කමිටුවේ නිර්දෙශ අනුව ඉදිරි කටයුතු වාර්තා කරන බව.	රජයට සිදුවූ හානිය සම්බන්ධයෙන් වගකිව යුත්තන් හඳුනාගෙන අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.
(ii)	බලපිටිය මූලික රෝහල සඳහා මධ්‍ය වායු සමීකරණ පද්ධතියක් රු.7,678,179 ක් වැයකර 2016 ජුනි	ප්‍රධාන අමාත්‍යාංශය මඟින් පත්කර ඇති කමිටුවේ නිර්දේශ අනුව ඉදිරි කටයුතු වාර්තා කරන	රජයට සිදුවූ හානිය සම්බන්ධයෙන් වගකිව යුත්තන් හඳුනාගෙන අවශ්‍ය

20 දින ස්ථාපනය කර තිබුණද එදින සිටම දෝෂ සහගත තත්ත්වයේ පැවති අතර, එය 2017 දෙසැම්බර් 03 දින වන විට සම්පූර්ණයෙන්ම අක්‍රියව පැවතුණි. ඒ අනුව රෝහල් දෙකහි ශල්‍යාගාර පවත්වා ගැනීම සඳහා රු.4,365,980 ක මුදලක් වැයකර Split AC යන්ත්‍ර 22 ක් සවිකර තිබූ අතර විගණිත දින දක්වාම මෙම ව්‍යාපෘති අසාර්ථක වීම සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන රජයට සිදුවූ අලාභය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	බව.	ක්‍රියාමාර්ග ගත යුතුය.

(උ) අවිධිමත් ගණුදෙනු

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
මිද්දෙණිය ප්‍රාදේශීය රෝහලේ, ඉසින යන්ත්‍ර ක්‍රියාකරු 2018 අප්‍රේල් 07 දින සිට නොදන්වා සේවයට වාර්තා නොකිරීම මත 2023 පෙබරවාරි 13 දින තනතුර හැර යාමේ නිවේදනය නිකුත් කර තිබුණි. එහෙත් 2018 අප්‍රේල් 24 දින සිට 2022 සැප්තැම්බර් මස දක්වා සේවය හැර ගිය පසුවද රු.2,131,001 ක වැටුප් ගෙවා තිබුණි.	මූලික විමර්ශනයේ නිර්දේශ අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා බව.	රජයට වූ හානිය කඩිනමින් අයකර ගැනීමට කටයුතු කල යුතුය.

(ඌ) වාහන උපයෝජනය

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	අඟුණුකොලපැලැස්ස රෝහලට අයත් ගිලන් රථයක් 2017 ඔක්තෝබර් 14 දින සිදුවූ අනතුරට අදාළ අලුත්වැඩියා වියදම වූ රු.1,438,168 ක් මුදල රියදුරුගෙන් අයකරගත යුතු බවට නිර්දේශ ලබාදී තිබුණද, 2019 ජනවාරි 19 දින රියදුරු මියගොස් ඇති බැවින් නියමිත කාලය තුළ මූල්‍ය රීති අනුව ක්‍රියාකර රියදුරුගෙන් අදාළ හානිය අයකර ගැනීමේ අවස්ථාව නිලධාරීන්ගේ ප්‍රමාදය හේතුවෙන් මගහැරී තිබුණි.	2023 නොවැම්බර් 25 දින පත්කල පරීක්ෂණ කමිටුවේ නිර්දේශ අනුව ඉදිරි කටයුතු සිදුකරන බව.	වාහන අනතුරු සම්බන්ධයෙන් කාලීනව විධිමත් ක්‍රියාමාර්ග ගත යුතුය.

(ii)	වලස්මුල්ල මූලික රෝහලට අයත් රථයක් 2021 ජුනි 25 දින අනතුරට ලක්ව තිබූ අතර 2022 පෙබරවාරි 10 දිනැති මූලික විමර්ශන වාර්තාව අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොතිබූ අතර ජාතික රක්ෂණ භාරකාර අරමුදල විසින් රු.9,000,000 ක උපරිමයකට යටත්ව ගෙවීම් කල හැකි බව දන්වා තිබුණද පෞද්ගලික ආයතනයකින් සිදුකර තිබූ රු.8,890,620 ක් වූ අළුත්වැඩියා වියදමින් රු.6,312,568 ක මුදලක් ප්‍රතිපූර්ණය කර තිබූ අතර වෙනස වූ රු.2,578,052 ක මුදල රජය විසින් දැරීමට සිදුවී තිබුණද ඒ සම්බන්ධව වැඩිදුර ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	2023 අගෝස්තු 10 දිනැති මූලික විමර්ශන කමිටුවේ නිර්දේශ පරිදි කටයුතු කරන බව.	වාහන අනතුරු සම්බන්ධයෙන් කාලීනව විධිමත් ක්‍රියාමාර්ග ගත යුතුය.

(එ) නොවිසඳී ඇති විගණන ඡේද

විගණන නිරීක්ෂණය	**ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
ප්‍රධාන අමාත්‍යාංශ ලේකම්වරයාගේ අංක දපස/ප්‍රඅ/මු10/50 හා 2021 අප්‍රේල් 06 දිනැති ලිපිය මඟින් අංක 13 ශ්‍රී 9506 රථය සම්බන්ධව පත්කරන ලද ත්‍රිපුද්ගල කමිටු වාර්තාව 2022 ජූලි 18 දින ලබාදී තිබුණද එම වාර්තාවේ දක්වා තිබූ නිර්දේශයන් 04, විගණිත අවස්ථාව වන විටද ක්‍රියාත්මක කර නොතිබුණි.	ත්‍රිපුද්ගල කමිටු වාර්තාවේ නිර්දේශ 4 ප්‍රකාරව, රථයේ ලියාපදිංචිය අවලංගු කිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම් වෙත දැනුම් දී ඇති බව.	කමිටු වාර්තාවේ නිර්දේශ අනුව ඉදිරි කටයුතු සිදුකර අවසන් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.

1.5.6 ශීර්ෂය 306 - දකුණු පළාත්, පළාත් පාලන දෙපාර්තමේන්තුව

(අ) නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

	නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව	**අනුකූල නොවීම**	**ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
(i)	2019 මැයි 31 දිනැති අංක 13/2008(V) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙන් සංශෝධිත 2011 පෙබරවාරි 09 දිනැති	යොමුගත චක්‍රලේඛයන්හි අනුමත ඉන්ධන සීමාවන් හා ඉන්ධන වර්ගය පිළිබඳව පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් දැනුවත් කර තිබියදී හා ඒ පිළිබඳ ලබා දී තිබූ නිර්දේශ නොසලකා සහ	ඉන්ධන දීමනා ගෙවීමේදී නිලධාරීන් කාණ්ඩ වර්ගකර පදනම් දෙකක් යටතේ ඉන්ධන ගෙවා නොමැති අතර නිලධාරීන් භාවිතා කරන වාහන සඳහා එම වාහන වලට භාවිතා කරන ඉන්ධන වර්ගය අනුව	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය.

	අංක 13/ 2008 (IV) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය හා 2014 ජනවාරි 02 දිනැති 01/2014 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 2.1.3 (ii) ඡේදය	රාජ්‍ය වියදම් කළමනාකරණය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති සම්බන්ධ චක්‍රලේඛ විධිවිධාන අභිබවායමින් ආණ්ඩුකාරවරගේ 2019 මැයි 13 දිනැති අංක G/SP/1/6/1/19 දරන ලිපියෙන් ලද අනුමැතිය මත 2019 මැයි 16 දිනැති අංක 02- 2019 දරන ප්‍රධාන ලේකම් චක්‍රලේඛය (මුදල්) නිකුත් කර තිබුණු අතර ඒ අනුව දකුණු පළාත්, පළාත් පාලන දෙපාර්තමේන්තුවේ එක් තනතුරකට අයත් එක් නිලධාරියෙකු වෙත 2019 මැයි මස සිට 2023 ජුනි දක්වා වූ කාලපරිච්ඡේදයට අදාළව රු.360,297 ක් අනුමත සීමාව ඉක්මවීම හේතුවෙන් සහ සුපිරි පෙට්‍රල් /සුපිරි ඩීසල් භාවිතය හේතුවෙන් රු.306,297 ක් ඉන්ධන දීමනා ලෙස වැඩිපුර ගෙවා තිබුණි.	වර්ග දෙකක් හඳුනාගෙන ඇති අතර ඒ අනුව භාවිතා කරන සත්‍ය ඉන්ධන වර්ගය පදනම් කර ගෙන දීමනා ගෙවා ඇති බව.	
(ii)	1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (8), (9) වගන්ති	අධිභාර සම්බන්ධයෙන් විගණකාධිපතිවරයාගේ තීරණය දැනුම් දෙනු ලැබූ දින සිට දින 14 ක් ඇතුළත අධිභාරලාභියා විසින් පළාත් පාලන කොමසාරිස් වෙත අදාළ මුදල ගෙවිය යුතු අතර එසේ මුදල් ගෙවා නොමැති නම් හෝ අභියාචනාවක් කර නොමැති නම් අදාළ තැනැත්තා පදිංචි ප්‍රදේශයේ අධිකරණ බලය ඇති දිසා අධිකරණය වෙත ඉල්ලුම් කර අදාළ මුදල් අයකර ගැනීමට පළාත් පාලන කොමසාරිස් විසින් කටයුතු කල යුතු වුවත්, විගණකාධිපති විසින් විවිධ අවස්ථාවන්හිදී නිකුත් කල, වටිනාකම රු.8,649,112 ක් වූ අධිභාර සහතික 11 ක් සඳහා සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එකී නියමයන් අනුව කටයුතු කර නොතිබුණි.	අධිභාර සහතික 11 සම්බන්ධ යෙන් වර්තමාන තත්ත්වය සහ ඒ සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳව සංක්ෂිප්ත වාර්තාවක් ඉදිරිපත් කරනු ලබන බව.	ප්‍රාදේශීය සභා පනත ප්‍රකාරව කටයුතු කල යුතුය.

(ආ) කළමනාකරණ අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i) මාතර දිස්ත්‍රික් පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයේ ආරක්ෂක කටයුතු වෙනුවෙන් අනුමත, ස්ථිර මුරකරුවෙකු සේවයේ යොදවා තිබුණු අතර සේවකයා නිවාඩු ලබාගන්නා අවස්ථාවලදී ආරක්ෂක කටයුතු වෙනුවෙන් පෞද්ගලික ආයතනයක් මගින් සේවාව ලබා ගැනීමට 2023 ජනවාරි සිට ඔක්තෝබර් දක්වා රු.416,413 ක මුදලක් ගෙවා තිබුණි. මේ පිළිබඳ පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.		
(ඒ) පෞද්ගලික ආරක්ෂක සේවය ලබාගැනීමට අදාළ ප්‍රසම්පාදනයේදී නියෝජ්‍ය කම්කරු කොමසාරිස් විසින් ලබා දී තිබූ වාර්තාවෙහි සඳහන් කොන්දේසි වලට පටහැනිව පෞද්ගලික ආයතනයේ මුරකරු අඛණ්ඩව පැය 24 කට වැඩි කාලයක් සේවයේ යොදවා ගෙන තිබුණු අතර ඒ අනුව ස්ථිර මුරකරුවකුගේ සේවය ලබා ගැනීම පිළිබඳව අවධානය යොමු කිරීමකින් තොරව පෞද්ගලික ආරක්ෂක සේවය යොදා ගෙන තිබුණි.	මාතර පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය සඳහා ආරක්ෂාව සපයා ගැනීමට එක් මුරකරුවෙකු පමණක් කාර්යය මණ්ඩලයේ සිටීම හා ඔහුට තනි ව මෙම කාල සීමාවන් ආවරණය කිරීමට නොහැකි වීම හේතුවෙන් පෞද්ගලික ආරක්ෂක සේවය ලබා ගැනීමට සිදු විය. එහි දි, නියෝජ්‍ය කම්කරු කොමසාරිස් විසින් ලබා දී තිබූ අඛණ්ඩ සේවා මුරයක කාලය වන පැය 12ක සීමාව පිළිබඳව අවධානය යොමු වීම අතපසු වී ඇති බව හා ගිවිසුම්ගත වීමේ දී එම වගන්තිය ඇතුළත් කිරීමට නොහැකි වීම හේතුවන් විගණනය විසින් පෙන්වා දී ඇති පරිදි පැය 12ට වැඩි සේවා මුරයන්හි එක් සේවකයෙකු යොදවා ඇති බවත් එවන් අවස්ථාවල දී සේවකයින් මාරු කර යොදවන ලෙස පෞද්ගලික ආරක්ෂක සේවයට දැනුම් දී ඇති බවත් , ස්ථිර මුරකරු අතිකාල යටතේ සේවය කිරීමට අකමැත්ත ප්‍රකාශ කිරීම හේතුවෙන් ඔහුට දිනකට පැය 08 ක් වන පරිදි සේවා මුර ක්‍රමය යටතේ දින 06ක් සඳහා සේවයේ	කම්කරු නීති රීති වලට අනුකූලව කටයුතු කල යුතුය.

		යොදවන ලද බව ද, විගණන නිරීක්ෂණයට අදාළ මුළු කාල සීමාවේදී ම ඔහුට අතිකාල ගෙවා නොමැති බව.	
(බී)	2022 අගෝස්තු 29 දිනැති පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ අංක මාර/ පපසකො/ප්‍රකනි01/2022 දරන ලිපිය මඟින් ස්ථිර මුරකරුගේ සේවා මුර සඳුදා, බදාදා සහ සිකුරාදා යන දිනයන්හි ප.ව 4.00 සිට පෙ.ව 8.00 දක්වා සංශෝධනය කර තිබුණු අතර 2017 නොවැම්බර් 28 දිනැති අංක 29/2017 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ (II) වගන්තියට සහ (V) වගන්තියට පටහැනිව මුරකරුගේ සේවා මුර සංශෝධනයේදී එක් සේවා මුරයක් පැය 08 ක් ලෙස සලකා එක් දිනයකට පැය 16 බැගින් සතියේ සඳුදා, බදාදා හා සිකුරාදා යන දින 03 ක් පමණක් වන පරිදි සේවා මුර සංශෝධනය කර තිබුණි.	දිනකට පැය 08 ක් බැගින් වන සේවා මුර ක්‍රමය යටතේ සතියේ දින 06 ක් ස්ථිර මුරකරු සේවයේ යෙදවීම සඳහා ඔහු වෙත රාජකාරි පවරා ඇති බව.	කම්කරු නීති රීති වලට අනුකූලව කටයුතු කල යුතුය.
(සී)	තවද, 2017 නොවැම්බර් 28 දිනැති අංක 29/2017 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 02 (I) වගන්තියට පටහැනිව එම මුරකරු වෙත සේවා මුර ලෙස පැවරීම් සිදු කර තිබූ සඳුදා, බදාදා සහ සිකුරාදා දිනයන්හි රජයේ නිවාඩු දිනයන් යෙදී ඇති අවස්ථාවන්හිදී සාමාන්‍ය රාජකාරි දිනයක් ලෙස නොසලකා නිවාඩු ලබාදී එම දිනයන් සඳහා පෞද්ගලික ආරක්ෂක නිලධාරී දිවා, රාත්‍රී සේවා මුරයන්හි සේවයේ යොදවා තිබුණි.	ඇතැම් රජයේ නිවාඩු දිනයන්හි දී ස්ථිර මුරකරු සේවයට වාර්තා නොකර, ඒ වෙනුවට, පෞද්ගලික ආරක්ෂක සේවයේ නිලධාරියා සේවයට කැඳවා ඇති බව නිරීක්ෂණය වූ බව හා ඒ අනුව එම රජයේ නිවාඩු දිනයන්හිදීද සේවයට නොපැමිණ ඇති දින සඳහා ස්ථිර මුරකරුගේ පෞද්ගලික නිවාඩු හිලව් කිරීමට කටයුතු කර ඇති බව.	චක්‍රලේඛ විධිවිධාන වලට අනුකූලව කටයුතු කල යුතුය.
(ඩී)	2017 අප්‍රේල් 19 දිනැති අංක 03/2017 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව කාර්යාලයේ ස්ථිර මුරකරු ඇඟිලි සලකුණු සටහන් යන්ත්‍ර භාවිතය මඟින් කාර්යාලයට පැමිණීම හා පිටවීම සනාථ කිරීමක් සිදු කර නොතිබුණි.	විගණිත දිනය වන විට ස්ථිර මුරකරු හා පෞද්ගලික ආයතනයෙන් සේවයේ යෙදවූ මුරකරුගේ පැමිණීම හා පිටවීමට අදාළව පැමිණීමේ ලේඛනයක් නඩත්තු කිරීම සිදු කරන ලද බවත්, 2024 ජනවාරි 01 දින සිට මෙම කාර්යාලයේ ස්ථිර මුරකරුගේ ඇඟිලි සලකුණු කාර්යාලයීය ඇඟිලි	චක්‍රලේඛ විධිවිධාන වලට අනුකූලව කටයුතු කල යුතුය.

		සලකුණු සටහන් යන්ත්‍රයට ඇතුළත් කර පැමිණීම පිටවීම සනාථ කිරීමට කටයුතු කරන බව.	
(ii)	කාර්යාලයේ ඉඩ පහසුකම් ප්‍රමාණවත් නොවීම මත මාතර පළාත් පාලන සහකාර කොමසාරිස් නිල කාමරය කාර්යාලයේ ඉදිරිපසට ගෙන ඒම ඇතුළු නවීකරණ කටයුතු සඳහා රු.2,711,538 ක මුදලකට ඇස්තමේන්තු ගත කර 2023 ඔක්තෝබර් මස 27 දින ගිවිසුම්ගතව තිබුණි. 2018 වර්ෂයේදී පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයේ නවීකරණය වෙනුවෙන් රු.5,249,116 ක මුදලක් දරා තිබියදී, 2022 අප්‍රේල් 26 දිනැති අංක BD/CBP/01/01/04 -2022 දරන ජාතික අයවැය චක්‍රලේඛයට අනුකූල නොවී වසර 04 කට පෙර රු.5,249,116 ක් වැයකර නවීකරණය කර තිබූ කාර්යාල පරිශ්‍රය ඉඩපහසුකම් ප්‍රමාණවත් නොමැති බව සඳහන් කරමින් චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව 2023 වර්ෂයේදීද නැවත රු.2,711,538 කට ගිවිසුම්ගත වී නවීකරණය කිරීමට කටයුතු කර තිබුණි.	පළාත් පාලන ආයතනවලින් විසඳුම් නො ලද මහජන පැමිණිලි ඉදිරිපත් කිරීම, තොරතුරු පනත සම්බන්ධව තොරතුරු ලබා ගැනීම හා ඉදිකිරීම් ද්‍රව්‍ය පරීක්ෂණාගාර යෙන් පරීක්ෂණ කරවා ගැනීම ආදී කටයුතු සඳහා ආයතනයට පැමිණෙන සේවාලාභීන්ගේ පහසුව උදෙසා පෙරටු කාර්යාලයක් පිහිටුවීම මෙකී නවීකරණයේ මූලික අරමුණු වූ බව සහ පෙර පැවති සහකාර කොමසාරිස් නිල කාමරයට විදුලිය විසන්ධි වූ අවස්ථාවල දී ආලෝකය හෝ වාතාශ්‍රය නොලැබීම තුළ එහි රැඳී සිටීමට අපහසු තත්ත්වයක් ඇති බැවින්, වෙනත් ස්ථානයක නිල කාමරය ස්ථානගත කිරීමට සිදු වූ බව හා තවද, මෙම නවීකරණ කටයුතු සිදු කිරීමේ දී ගලවා ඉවත් කරන ලද සවි කිරීම් කොටස් සියල්ල නැවත සවි කරන ලද බව බිල්පත් පරීක්ෂාවේ දී තහවුරු කර ගත හැකි බව.	චක්‍රලේඛ විධිවිධාන වලට අනුකූලව සැලසුම් සහගත ලෙස රාජ්‍ය වියදම් කළමනාකරණය කල යුතුය.

1.5.7 ශීර්ෂය 307 - දකුණු පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව

(අ) නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව	අනුකූල නොවීම	ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම	නිර්දේශය
දකුණු පළාත් සභා මූල්‍ය රීති			
(i) මූල්‍ය රීති 46.1	දකුණු පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ වැය විෂයයන් 16 ක් වෙනුවෙන් ප්‍රතිපාදිත මුදල ඉක්මවා රු.8,048,776 ක්වූ බැරකම් වලට එළැඹ තිබුණි.	ඉදිරියේදී මු.රී 46.1 පරිදි කටයුතු කිරීමටත් මෙවැනි තත්වයන් පාලනය කිරීමටත් කටයුතු කරන බව	මූල්‍ය රීති ප්‍රකාරව කටයුතු කල යුතුය.

(ii) මූල්‍ය රීති 29.1	යොමුගත රීතියට අනුකූල නොවන ලෙස සමාලෝචිත වර්ෂයේදී දකුණු පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ මුදල් ප්‍රකාශයට අනුව ඇස්තමේන්තුගත නොවූ වැය විෂයයන් 04 ක් වෙනුවෙන් එකතුව රු.3,415,329 ක් වූ බැරකම් වලට එළඹ තිබුණි.	1409 වෙනත් වැය විෂය යටතේ මෙම වියදම් ඇතුළත් කල අතර 2024 වසරේ සිට මුදල් ප්‍රකාශය අනුව ඒ ඒ වියදමට අදාළ වැය විෂයන් වෙන වෙනම දක්වා තිබූ බැවින් සහ පෙර තිබූ වැය විෂයන් වලට 2024 වසරේ ප්‍රතිපාදන වෙන් වී නොතිබූ බැවින් ද නව වැය විෂයන් යටතේ බැරකමට ඇතුළත් කිරීමට සිදුවූ බව	මූල්‍ය රීති ප්‍රකාරව කටයුතු කල යුතුය.

(ආ) කළමනාකරණ අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
පශ්චාත් උපාධි පාඨමාලා හැදෑරීම ආරම්භ කර නියමිත කාලය තුළදී අවසාන නොකල දකුණු පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවට අයත් වෛද්‍ය නිලධාරීන් 16 දෙනෙකු සිටින බව නිරීක්ෂණය වූ අතර, ඒ සඳහා රජය විසින් දරන ලද වියදම රු.4,152,500 ක් විය. තවත් වෛද්‍ය නිලධාරීන් 05 දෙනෙකු සමාලෝචිත වර්ෂය තුළදී රු.900,000 ක රජයේ වියදමින් පාඨමාලා හදාරා තිබුණද විගණිත දිනය වූ 2024 අප්‍රේල් 04 දින වන විට පාඨමාලා අවසන් කර නොතිබුණි.	අදාළ නිලධාරීන්ට නියමිත දිනට පාඨමාලා අවසන් කර සහතික පත්‍ර භාර දෙන ලෙසට උපදෙස් ලබාදී ඇති බව.	නියමිත දිනට පාඨමාලා අවසන් කර සහතික පත්‍ර භාරදී තහවුරු කල යුතුය.

1.5.8 ශීර්ෂය 308 - දකුණු පළාත් අධ්‍යාපන, ඉඩම් හා ඉඩම් සංවර්ධන, මහා මාර්ග හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය

(අ) නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

	නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව	අනුකූල නොවීම	ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	2019 මැයි 31 දිනැති අංක 13/2008(V) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙන් සංශෝධිත 2011 පෙබරවාරි 09 දිනැති	යොමුගත චක්‍රලේඛයන්හි අනුමත ඉන්ධන සීමාවන් හා ඉන්ධන වර්ගය පිළිබඳව පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් දැනුවත් කර තිබියදී හා ඒ පිළිබඳ ලබා දී තිබූ නිර්දේශ නොසලකා සහ	ඉන්ධන දීමනා ගෙවීමේදී නිලධාරීන් කාණ්ඩ වර්ගකර පදනම් දෙකක් යටතේ ඉන්ධන ගෙවා නොමැති අතර නිලධාරීන් භාවිතා කරන වාහන සඳහා එම වාහන වලට භාවිතා කරන ඉන්ධන වර්ගය අනුව	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය.

	අංක 13/ 2008 (IV) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය හා 2014 ජනවාරි 02 දිනැති 01/2014 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 2.1.3 (ii) ඡේදය	රාජ්‍ය වියදම් කළමනාකරණය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති සම්බන්ධ චක්‍රලේඛ විධිවිධාන අභිබවායමින් ආණ්ඩුකාරවරගේ 2019 මැයි 13 දිනැති අංක G/SP/1/6/1/19 දරන ලිපියෙන් ලද අනුමැතිය මත 2019 මැයි 16 දිනැති අංක 02- 2019 දරන ප්‍රධාන ලේකම් චක්‍රලේඛය (මුදල්) නිකුත් කර තිබුණු අතර ඒ අනුව දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ තනතුරු 04 කට අයත් නිලධාරින් 06 දෙනෙකු වෙත 2019 මැයි මස සිට 2023 ජුනි දක්වා වූ කාලපරිච්ඡේදයට අදාළව රු.2,142,292 ක් අනුමත සීමාව ඉක්මවීම හේතුවෙන් සහ සුපිරි පෙට්‍රල් /සුපිරි ඩීසල් භාවිතය හේතුවෙන් රු.905,932 ක් ඉන්ධන දීමනා ලෙස වැඩිපුර ගෙවා තිබුණි.	වර්ග දෙකක් හඳුනාගෙන ඇති අතර ඒ අනුව භාවිතා කරන සත්‍ය ඉන්ධන වර්ගය පදනම් කර ගෙන දීමනා ගෙවා ඇති බව.	
(ii)	අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛ			
(ඒ)	2018 ජුනි 22 දිනැති අංක 26/2018 දරන පාසල් පාදක ගුණාත්මක, ප්‍රමාණාත්මක හා ව්‍යුහාත්මක සංවර්ධනය සඳහා සැලසුම්කරණය හා ප්‍රසම්පාදනය පිළිබඳ චක්‍රලේඛයේ සහ මාර්ගෝපදේශ අත්පොතෙහි 12.1.2.6.1 හා 11.1 වගන්ති	යොමුගත චක්‍රලේඛයේ සඳහන් වගන්ති හා උපදෙස්වලට පටහැනිව දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් අකුරැස්ස කලාප අධ්‍යාපන කාර්යාලය හා වලස්මුල්ල කලාප අධ්‍යාපන කාර්යාලයට අයත් පාසල් දෙකකට එකතු වටිනාකම රු.6,437,000 ක මුදලක් ලබා දී තිබුණි.	මෙම මුදල් ලබාදී ඇත්තේ මාර/මලිදූව කණිටු විද්‍යාලයේ ප්‍රධාන ශාලාවේ උපකරණ මිලදී ගැනීමට රු.5,137,000 ක් හා මිද්දෙනිය මහ විද්‍යාලයේ සංගීත උපකරණ , ශබ්ද විකාශන යන්ත්‍ර හා ක්‍රීඩා උපකරණ මිලදී ගැනීම සඳහා රු.1,300,000ක් වශයෙනි. ආණ්ඩුකාර ලේකම් වැය ශීර්ෂයෙන් හා ප්‍රධාන ලේකම් වැය ශීර්ෂයෙන් ප්‍රතිපාදන අනුමත වී ඇති අතර මෙම උපකරණ ප්‍රාදේශීය මිල ගණන් කැඳවා ඉදිරිපත් කරන ලද මිල ගණන් පිළිබඳ තීරණ සළකා අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව මඟින් අනුමැතිය ලබාදී ඇති බවත්,එම තීරණ අනුව පාසල විසින් එම මිලදී ගැනීම් සිදුකර ඇති බව. හ/මිද්දෙණිය මහා විද්‍යාලය	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය.

			සඳහා රු.1,300,000 ක් ලබා දී තිබූ නමුත් එය ලබාදී ඇත්තේ එකිනෙකට වෙනස් මිලදී ගැනීම් 03 ක් සඳහා වේ. පාසල් ප්‍රසම්පාදන කමිටුව විසින් සිදුකල හැකි සීමාව ඉක්මවා කටයුතු කර නොමැති බව.	
(ii)	2013 නොවැම්බර් 28 දිනැති අංක 07/2013 දරන චක්‍රලේඛයේ 10.1 වගන්තිය	යොමුගත චක්‍රලේඛයෙහි පාසලට ලැබෙන අරමුදල්, ප්‍රදාන ඇතුළු සියළුම මුදල් තැන්පත් කිරීම සඳහා “පාසල් සංවර්ධන ගිණුම” නමින් වූ නව ජංගම ගිණුමක් විවෘත කර එතෙක් පැවති අනෙකුත් බැංකු ගිණුම්වල ශේෂයන් මාරු කර, පැරණි බැංකු ගිණුම් වසා දැමීමට කටයුතු කල යුතු ලෙස දක්වා තිබුණද, චක්‍රලේඛ උපදෙස් පිළිපැදීමකින් තොරව පාසල් 372 ක එකතුව රු.28,771,757 ක් වූ මුදල් ප්‍රමාණයක් පාසල් සංවර්ධන ගිණුම හැර වෙනත් බැංකු ගිණුම්වල පැවතුණි. තවද පාසල් 129 ක ගුරු වැටුප් ලෙස ලද එකතුව රු.1,994,709 ක් වූ මුදල් ප්‍රමාණයක් ගුරු වැටුප් ගිණුම්වල රඳවා තිබූ අතර පළාත් භාණ්ඩාගාරයට පියවීමට කටයුතු කර නොතිබුණි.	අවශ්‍ය ගැලපීම් සිදුකර නිවැරදි කිරීමට කටයුතු කරන බව.	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය.
(iii)	භාණ්ඩාගාර ලේකම්ගේ 2022 අප්‍රේල් 26 දිනැති අංක 03/2022 දරන චක්‍රලේඛය, 2022 නොවැම්බර් 25 දිනැති අංක 08/2022 දරන ජාතික අයවැය චක්‍රලේඛය හා ජනාධිපති ලේකම්ගේ 2022 අගෝස්තු 15 දිනැති අංක PC/SB/ Circular/10/2022-2 දරන චක්‍රලේඛය	යොමුගත චක්‍රලේඛයන්ට පටහැනිව දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් 2022 නොවැම්බර් 29 දින රු.4,864,268 ක වියදමක් දරමින්, 2020 අ.පො.ස.(සා.පෙ.) සෞන්දර්ය විභාග ප්‍රතිඵල ඇගයීමේ වැඩසටහන පවත්වා තිබුණි. සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතියේ මුදල් එහි අරමුණු වලට පටහැනිව මෙම වැඩසටහන සඳහා යොදවා ගෙන තිබුණි.	අ.පො.ස සා/පෙළ 2020 ප්‍රතිඵල ඇගයීමේ සමස්ථ වැඩ සටහන සඳහා ගරු ආණ්ඩුකාරතුමා ගෙන් ලද අනුමැතිය මත 2022 නොවැම්බර් 29 දින මෙම වැඩ සටහන පැවැත්වූ අතර එහිදී ගුරු භවතුන් හා අධ්‍යාපන නිලධාරීන් සියල්ල 1500 කට ආසන්න ප්‍රමාණයක් සඳහා තිළිණපත් ලබාදීම ඇතුළුව මුළු වියදම රු.4,864,268 ක් වූ බව.	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය.

1.5.8.1 දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය

(අ) නොවිසඳී ඇති විගණන ඡේද

විගණන නිරීක්ෂණය	**ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ ගලගොඩ වැඩ අංගනයේ සවිකර තිබූ ඇස්පෝල්ට් යන්ත්‍රය වෙන්දේසි කිරීමේදී තක්සේරු කාර්යය සඳහා පත්කල කමිටුව මඟින් වත්කම සඳහා ලබා දුන් තක්සේරුව රු.10,400,000 ක් වූ අතර යන්ත්‍රය වෙන්දේසීයේදී රු.21,100,000 කට අලෙවි වී තිබුණි. මේ අනුව තක්සේරු වටිනාකම නිවැරදි නොවන බව නිරීක්ෂණය වූ අතර තක්සේරු කිරීමේදී යන්ත්‍රය තුළ වූ තාර ලීටර් 21,782 ක් හා ඩීසල් ලීටර් 4028 පිළිබඳව සැලකිල්ලට නොගෙන තක්සේරු කර තිබීමෙන් අධිකාරියට රු.3,274,784 ක පාඩුවක් සිදු වී තිබුණි.	මෙම යන්ත්‍රය වෙන්දේසි කිරිමේ දී රජයට අලාභයක් සිදු වී නොමැති බවත්, යන්ත්‍රයේ තක්සේරු වටිනාකම රු.මි.10.5 ක් වන බව	වත්කම් නිවැරදිව තක්සේරු කර රජයට අලාභයක් නොවන පරිදි වත්කම් අපහරණය සිදුකල යුතුය.

1.5.9 ශිර්ෂය 309 - දකුණු පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව	**අනුකූල නොවීම**	**ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
2019 මැයි 31 දිනැති අංක 13/2008(V) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙන් සංශෝධිත 2011 පෙබරවාරි 09 දිනැති අංක 13/ 2008 (IV) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය හා 2014 ජනවාරි 02 දිනැති	යොමුගත චක්‍රලේඛයන්හි අනුමත ඉන්ධන සීමාවන් හා ඉන්ධන වර්ගය පිළිබඳව පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් දැනුවත් කර තිබියදී හා ඒ පිළිබඳ ලබා දී තිබූ නිර්දේශ නොසලකා සහ රාජ්‍ය වියදම් කළමනාකරණය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති සම්බන්ධ චක්‍රලේඛ විධිවිධාන අභිබවායමින් ආණ්ඩුකාරවරගේ	ඉන්ධන දීමනා ගෙවීමේදී නිලධාරීන් කාණ්ඩ වර්ගකර පදනම් දෙකක් යටතේ ඉන්ධන ගෙවා නොමැති අතර නිලධාරීන් භාවිතා කරන වාහන සඳහා එම වාහන වලට භාවිතා කරන ඉන්ධන වර්ගය අනුව වර්ග දෙකක් හඳුනාගෙන ඇති අතර ඒ අනුව භාවිතා කරන සත්‍ය ඉන්ධන වර්ගය පදනම් කර ගෙන දීමනා ගෙවා ඇති බව.	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය.

	01/2014 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 2.1.3 (ii) ඡේදය	2019 මැයි 13 දිනැති අංක G/SP/1/6/1/19 දරන ලිපියෙන් ලද අනුමැතිය මත 2019 මැයි 16 දිනැති අංක 02- 2019 දරන ප්‍රධාන ලේකම් චක්‍රලේඛය (මුදල්) නිකුත් කර තිබුණු අතර ඒ අනුව දකුණු පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ එක් තනතුරකට අයත් එක් නිලධාරියෙකු වෙත 2019 මැයි මස සිට 2023 ජුනි දක්වා වූ කාලපරිච්ඡේදයට අදාළව රු.407,960 ක් අනුමත සීමාව ඉක්මවීම හේතුවෙන් සහ සුපිරි පෙට්‍රල් /සුපිරි ඩීසල් භාවිතය හේතුවෙන් රු.126,435 ක් ඉන්ධන දීමනා ලෙස වැඩිපුර ගෙවා තිබුණි.		

1.5.10 ශීර්ෂය 310 - දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

(අ) නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

	නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව	අනුකූල නොවීම	ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	මුල්‍ය රීති 46.1 හා 46.2.1	දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ වැය විෂයයන් 08 ක් වෙනුවෙන් ප්‍රතිපාදිත මුදල ඉක්මවා රු.35,591,084 ක් වූ බැරකම් වලට එළැඹ තිබුණි.	ඉදිරියේදී මු.රී 46.1 පරිදි කටයුතු කිරීමටත් මෙවැනි තත්වයන් පාලනය කිරීමටත් කටයුතු කරන බව	මුල්‍ය රීති ප්‍රකාරව කටයුතු කල යුතුය.
(ii)	2019 මැයි 31 දිනැති අංක 13/2008(V) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙන් සංශෝධිත 2011 පෙබරවාරි 09 දිනැති අංක 13/ 2008 (IV) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය හා 2014	යොමුගත චක්‍රලේඛයන්හි අනුමත ඉන්ධන සීමාවන් හා ඉන්ධන වර්ගය පිළිබඳව පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් දැනුවත් කර තිබියදී හා ඒ පිළිබඳ ලබා දී තිබූ නිර්දේශ නොසලකා සහ රාජ්‍ය වියදම් කළමනාකරණය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති සම්බන්ධ චක්‍රලේඛ විධිවිධාන	ඉන්ධන දීමනා ගෙවීමේදී නිලධාරීන් කාණ්ඩ වර්ගකර පදනම් දෙකක් යටතේ ඉන්ධන ගෙවා නොමැති අතර නිලධාරීන් භාවිතා කරන වාහන සඳහා එම වාහන වලට භාවිතා කරන ඉන්ධන වර්ගය අනුව වර්ග දෙකක් හඳුනාගෙන ඇති අතර ඒ අනුව භාවිතා කරන සත්‍ය ඉන්ධන වර්ගය පදනම් කර ගෙන දීමනා	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය.

ජනවාරි 02 දිනැති 01/2014 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 2.1.3 (ii) ඡේදය	අභිබවායමින් ආණ්ඩුකාරවරගේ 2019 මැයි 13 දිනැති අංක G/SP/1/6/1/19 දරන ලිපියෙන් ලද අනුමැතිය මත 2019 මැයි 16 දිනැති අංක 02- 2019 දරන ප්‍රධාන ලේකම් චක්‍රලේඛය (මුදල්) නිකුත් කර තිබුණු අතර ඒ අනුව දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ තනතුරු 04 කට අයත් නිලධාරින් 09 දෙනෙකු වෙත 2019 මැයි මස සිට 2023 ජුනි දක්වා වූ කාලපරිච්ඡේදයට අදාළව රු.1,125,715 ක් අනුමත සීමාව ඉක්මවීම හේතුවෙන් සහ සුපිරි පෙට්‍රල් /සුපිරි ඩීසල් භාවිතය හේතුවෙන් රු.478,931 ක් ඉන්ධන දීමනා ලෙස වැඩිපුර ගෙවා තිබුණි.	ගෙවා ඇති බව.

(ආ) අවිධිමත් ගණුදෙනු

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	හ/රන්න මහා විද්‍යාලෙහි පැවති ක්‍රීඩාපිටිය බාහිර පාර්ශවයක් අනවසරයෙන් පාවිච්චි කරන බව අධ්‍යාපන, ඉඩම් හා ඉඩම් සංවර්ධන....අමාත්‍යාංශයේ සහකාර ලේකම් (පාලන) ගේ දප/ස/ අඉමා/ 12/01/47 හා 2021 දෙසැම්බර් 02 දිනැති ලිපියෙන් දකුණු පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත දන්වා තිබූ නමුත්, වසර 02 කට වඩා වැඩි කාලයක් ගත වී ඇතත්, ඒ පිළිබඳව ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. ක්‍රීඩා පිටිය අහිමිවීම නිසා විද්‍යාලේ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ක්‍රීඩා කිරීමට පාසලේම පැවති වෙනත් බිම් කොටසක් ක්‍රීඩා පිටියක් ලෙස සංවර්ධනය කිරීමට 2014 වසරේදී ආපදා හා කළමනාකරණ අමාත්‍යාංශය විසින් පාසල් සංවර්ධන සමිතියට රු.1,487,683 ක් ලබා දී තිබූ අතර එම මුදල් වැය කරමින් අදාළ සංවර්ධන කටයුතු 2014 වර්ෂයේ සිදුකර	විද්‍යාලය සතුව තිබූ ක්‍රීඩා පිටියේ ඉඩමේ ගැටළුකාරී තත්ත්වය හේතුවෙන් මැද මිදුල ක්‍රීඩා කිරීමට යොදාගෙන ඇත. වැසි දිනවලදී මඩවීම හා පාංශුඛාදනය වැලැක්වීමට තණකොළ වවා ප්‍රවේශ මාර්ග සකසා ඇති බව.	ශක්‍යතා අධ්‍යනයකින් පසුව ඉදිකිරීම් සිදුකල යුතුය.

	තිබුණද, විගණිත දින වන විට ශක්‍යතා අධ්‍යයනයකින් තොරව ක්‍රීඩා භූමියක් ලෙස සංවර්ධනය කරන ලද කොටස නැවත සංවර්ධනය කිරීම නිසා වැය කරන ලද මුදල නිශ්කාර්ය වියදමක් බවට පත් වී තිබුණි.		
(ii)	ගා/කයිකාවල ශ්‍රී රේවත කණිෂ්ඨ විද්‍යාලයේ අවස්ථා 111 කදී කරන ලද වටිනාකම රු.953,620 ක් වූ ගෙවීම් සම්බන්ධයෙන් ගෙවීම් වවුචර් පිළියෙල කර නොතිබූ අතර අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ අංක 26/2018 චක්‍රලේඛයේ 16.3 වගන්ති ප්‍රකාරව රු.56,720 ක් වූ ලැබීම් සඳහා ලදුපත්ද නිකුත් කර නොතිබුණි.	මේ පිළිබඳ මූලික විමර්ශනයක් පැවැත්වීම සඳහා නිර්දේශ කර මා වෙත යොමු කර ඇති අතර ඒ සම්බන්ධයෙන් ඉදිරියේදී කටයුතු කරන බව.	කඩිනමින් මූලික විමර්ශනය සිදුකර අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.
(iii)	කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකගෙන් අනුමැතිය ලබා නොතිබියදී හා පාසල් සංවර්ධන කමිටුවේ යෝජනා අනුමැතියක් නොතිබියදී, 2022 මාර්තු, අප්‍රේල්, මැයි යන මාස 03 තුළදී ගා/ජනාධිපති බාලිකා විද්‍යාලයේ පළමු ශ්‍රේණියට ඇතුළත් කරගත් ශිෂ්‍යාවන් ගෙන් නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා රු.1,330,000 ක මුදලක් ලබා ගෙන තිබුණි.	2022 වර්ෂයේ කොවිඩ් වසංගතය හා ඉන්ධන අර්බුදය මත පාසල අඛණ්ඩව නොපැවැත්වූ අතර zoom තාක්ෂණය ඔස්සේ පාසල් සංවර්ධන සමිතියේ අනුමැතිය ලබා ගෙන ඇත. ගා/ ජනාධිපති විද්‍යාලයේ විදුහල්පති දැනුවත්ව ගාල්ල කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ ලිපිය මඟින් නව ඉදිකිරීම් හා අවශ්‍යතා යටතේ දැනුම් දී ඇති බව.	විධිමත් අනුමැතියක් මත මුදල් එකතු කිරීම් සිදුකල යුතුය.
(iv)	2023 වසරේදී ගා/ජනාධිපති බාලිකා විද්‍යාලයේ 12 ශ්‍රේණියට සිසුන් ඇතුළත් කර ගැනීමේදී ශිෂ්‍යාවන් 62 දෙනෙකු ඇතුළත් කර ගෙන තිබූ අතර, එක් ශිෂ්‍යාවකගෙන් රු.25,000 ත් රු.30,000 ත් අතර මුදල් ලබාගෙන තිබුණු අතර, එම මුදල් පාසල් සංවර්ධන ගිණුමට බැරකර නොතිබූ අතර, විදුහල්පතිතුමියගේ උපදෙස් පරිදි එම මුදල් වෙනත් ගිණුමකට බැර කරවා ගෙන තිබුණි.	2022 වර්ෂයේ 12 ශ්‍රේණියට වෙනත් පාසල්වලින් ඇතුළත් කරගත් සිසුවියන්ගේ දෙමාපියන් රු.1,710,000 ක් ආදි ශිෂ්‍ය සංගමයේ ගිණුමට බැර කර තිබූ අතර එම මුදලින් අවුරුදු 2ක පහසුකම් හා සේවා ගාස්තු, විද්‍යාලයේ නිල ඇඳුමට අවශ්‍ය ද්‍රව්‍ය වෙනුවෙන් හා ඉදිරියේදී සියලුම ප්‍රශ්න පත්‍ර මුද්‍රණය කර ලබා දීමේ වියදම් මෙම මුදලට ඇතුළත් බව දන්වා ඇත. ඒ අනුව ආදි ශිෂ්‍ය ගිණුමේ තැන්පත් කර ඇති මුදල් වලින් රු.200,000 ක් පාසල් සංවර්ධන සමිති ගිණුමටද, වර්ෂ 2ක	විධිමත් අනුමැතියක් සහිතව රැස්කරන ලද සියළුම මුදල් පාසල් සංවර්ධන අරමුදලට බැරකල යුතුය.

පහසුකම් හා සේවා ගාස්තු විද්‍යාලයේ පහසුකම් හා සේවා ගාස්තු ගිණුමට ද අයකර ගෙන රිසිට්පත් දියණියන්ට ලබා දි ඇති බව.

1.5.11 ශිර්ෂය 311 - දකුණු පළාත් ධීවර, සත්ත්ව නිෂ්පාදන හා සංවර්ධන, පරිසර කටයුතු, ග්‍රාමීය කර්මාන්ත, විදුලිබල සහ ග්‍රාමීය වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව	අනුකූල නොවීම	ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම	නිර්දේශය
2019 මැයි 31 දිනැති අංක 13/2008(V) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙන් සංශෝධිත 2011 පෙබරවාරි 09 දිනැති අංක 13/ 2008 (IV) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය හා 2014 ජනවාරි 02 දිනැති 01/2014 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 2.1.3 (ii) ඡේදය	යොමුගත චක්‍රලේඛයන්හි අනුමත ඉන්ධන සීමාවන් හා ඉන්ධන වර්ගය පිළිබඳව පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් දැනුවත් කර තිබියදී හා ඒ පිළිබඳ ලබා දී තිබූ නිර්දේශ නොසලකා සහ රාජ්‍ය වියදම් කළමනාකරණය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති සම්බන්ධ චක්‍රලේඛ විධිවිධාන අභිබවායමින් ආණ්ඩුකාරවරගේ 2019 මැයි 13 දිනැති අංක G/SP/1/6/1/19 දරන ලිපියෙන් ලද අනුමැතිය මත 2019 මැයි 16 දිනැති අංක 02- 2019 දරන ප්‍රධාන ලේකම් චක්‍රලේඛය (මුදල්) නිකුත් කර තිබුණු අතර ඒ අනුව දකුණු පළාත් ධීවර අමාත්‍යාංශයේ එක් තනතුරකට අයත් එක් නිලධාරියෙකු වෙත 2019 මැයි මස සිට 2023 ජුනි දක්වා වූ කාලපරිච්ඡේදයට අදාළව රු.940,010 ක් අනුමත සීමාව ඉක්මවීම හේතුවෙන් සහ සුපිරි පෙට්‍රල් /සුපිරි ඩීසල් භාවිතය හේතුවෙන් රු.275,230 ක් ඉන්ධන දීමනා ලෙස වැඩිපුර ගෙවා තිබුණි.	ඉන්ධන දීමනා ගෙවීමේදී නිලධාරීන් කාණ්ඩ වර්ගකර පදනම් දෙකක් යටතේ ඉන්ධන ගෙවා නොමැති අතර නිලධාරීන් භාවිතා කරන වාහන සඳහා එම වාහන වලට භාවිතා කරන ඉන්ධන වර්ගය අනුව වර්ග දෙකක් හඳුනාගෙන ඇති අතර ඒ අනුව භාවිතා කරන සත්‍ය ඉන්ධන වර්ගය පදනම් කර ගෙන දීමනා ගෙවා ඇති බව.	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය.

1.5.12 ශීර්ෂය 312 - දකුණු පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව	අනුකූල නොවීම	ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම	නිර්දේශය
2019 මැයි 31 දිනැති අංක 13/2008(V) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙන් සංශෝධිත 2011 පෙබරවාරි 09 දිනැති අංක 13/ 2008 (IV) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය	යොමුගත චක්‍රලේඛයන්හි අනුමත ඉන්ධන සීමාවන් පිළිබඳව පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් දැනුවත් කර තිබියදී හා ඒ පිළිබඳ ලබා දී තිබූ නිර්දේශ නොසලකා සහ රාජ්‍ය වියදම් කළමනාකරණය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති සම්බන්ධ චක්‍රලේඛ විධිවිධාන අභිබවායමින් ආණ්ඩුකාරවරයගේ 2019 මැයි 13 දිනැති අංක G/SP/1/6/1/19 දරන ලිපියෙන් ලද අනුමැතිය මත 2019 මැයි 16 දිනැති අංක 02-2019 දරන ප්‍රධාන ලේකම් චක්‍රලේඛය (මුදල්) නිකුත් කර තිබුණු අතර ඒ අනුව දකුණු පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ තනතුරු 02 කට අයත් නිලධාරීන් 03 දෙනෙකු වෙත 2019 මැයි මස සිට 2023 ජුනි දක්වා වූ කාලපරිච්ඡේදයට අදාළව රු.360,860 ක් අනුමත සීමාව ඉක්මවීම හේතුවෙන් ඉන්ධන දීමනාව ලෙස වැඩිපුර ගෙවා තිබුණි.	ඉන්ධන දීමනා ගෙවීමේදී නිලධාරීන් කාණ්ඩ වර්ගකර පදනම් දෙකක් යටතේ ඉන්ධන ගෙවා නොමැති අතර නිලධාරීන් භාවිතා කරන වාහන සඳහා එම වාහන වලට භාවිතා කරන ඉන්ධන වර්ගය අනුව වර්ග දෙකක් හඳුනාගෙන ඇති අතර ඒ අනුව භාවිතා කරන සත්‍ය ඉන්ධන වර්ගය පදනම් කර ගෙන දීමනා ගෙවා ඇති බව.	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය.

1.5.13 ශීර්ෂය 313 - දකුණු පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව

(අ) නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව	අනුකූල නොවීම	ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම	නිර්දේශය
2019 මැයි 31 දිනැති අංක 13/2008(V)	යොමුගත චක්‍රලේඛයන්හි අනුමත ඉන්ධන සීමාවන් හා ඉන්ධන	ඉන්ධන දීමනා ගෙවීමේදී නිලධාරීන් කාණ්ඩ වර්ගකර පදනම් දෙකක්	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු

දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙන් සංශෝධිත 2011 පෙබරවාරි 09 දිනැති අංක 13/ 2008 (IV) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය හා 2014 ජනවාරි 02 දිනැති 01/2014 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 2.1.3 (ii) ඡේදය	වර්ගය පිළිබඳව පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් දැනුවත් කර තිබියදී හා ඒ පිළිබඳ ලබා දී තිබූ නිර්දේශ නොසලකා සහ රාජ්‍ය වියදම් කළමනාකරණය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති සම්බන්ධ චක්‍රලේඛ විධිවිධාන අභිබවායමින් ආණ්ඩුකාරවරගේ 2019 මැයි 13 දිනැති අංක G/SP/1/6/1/19 දරන ලිපියෙන් ලද අනුමැතිය මත 2019 මැයි 16 දිනැති අංක 02- 2019 දරන ප්‍රධාන ලේකම් චක්‍රලේඛය (මුදල්) නිකුත් කර තිබුණු අතර ඒ අනුව දකුණු පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුවේ එක් තනතුරකට අයත් එක් නිලධාරියෙකු වෙත 2019 මැයි මස සිට 2023 ජූනි දක්වා වූ කාලපරිච්ඡේදයට අදාළව රු.64,400 ක් අනුමත සීමාව ඉක්මවීම හේතුවෙන් සහ සුපිරි පෙට්‍රල් /සුපිරි ඩීසල් භාවිතය හේතුවෙන් රු.2,125 ක් ඉන්ධන දීමනා ලෙස වැඩිපුර ගෙවා තිබුණි.	යටතේ ඉන්ධන ගෙවා නොමැති අතර නිලධාරීන් භාවිතා කරන වාහන සඳහා එම වාහන වලට භාවිතා කරන ඉන්ධන වර්ගය අනුව වර්ග දෙකක් හඳුනාගෙන ඇති අතර ඒ අනුව භාවිතා කරන සත්‍ය ඉන්ධන වර්ගය පදනම් කර ගෙන දීමනා ගෙවා ඇති බව.	කල යුතුය.

(ආ) මෙහෙයුම් අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් රුහුණු රන්සළු අලෙවිසැල් මගින් විකුණුම් සිදුකිරීමේදී මාස 06 කින් ගෙවා අවසන් කිරීමේ පදනම මත ණයට විකුණුම් කරනු ලැබුවද, මාතර, ගාල්ල හා හම්බන්තොට දිස්ත්‍රික්ක වලින් 2017 වර්ෂයේ සිට 2023 දෙසැම්බර් 31 දින දක්වා සිදුකල ණයට විකුණුම් වලින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට රු.25,822,756 ක ණය ශේෂයක් අයවීමට පැවතුණි.	2024 ජනවාරි 01 සිට 2024 මාර්තු 31 දක්වා කාලය තුල රු.1,969,264 ක ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර ඇති බව.	ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කල යුතුය.

(ඇ) මතභේදයට තුඩුදුන් ගණුදෙනු

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
දකුණු පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුවේ කුරුදුවත්ත වර්ණාගාරයේ අපජලය බැහැර කිරීමට තිබූ වල බැකෝ යන්ත්‍රයක් යොදා ගනිමින් ඒ ආසන්නයේ පැවති පස් කණ්ඩියෙන් පස් කපා වසා දැමීමට ආයතන ප්‍රධානියාගෙන් ලද අනුමැතිය මත පස් කැපීම වෙනුවෙන් 2023 දෙසැම්බර් 29 දින රු.45,500 ක් ගෙවීම් කර තිබුණි. ඒ සම්බන්ධව 2024 පෙබරවාරි 16 දින කරන ලද ස්ථානීය පරීක්ෂාවේදී බැකෝ යන්ත්‍රයක් මඟින් පස් කපා ටිපර් රථයක් මඟින් ආයතන පරිශ්‍රයෙන් පස් ඉවත් කරන බව නිරීක්ෂණය විය. පසුව සී.සී.ටී.වී දර්ශන අනුව කරන ලද පරීක්ෂාවේදී 2024 පෙබරවාරි 14, 15 සහ 16 යන දිනවල ටිපර් රථ 02 ක් මඟින් පස් ටිපර් රථ 75 ක් ඉවත් කර තිබුණි. මෙසේ පස් ඉවත් කිරීමට කිසිදු ලිඛිත අනුමැතියක් හෝ අවසරයක් ලබාගෙන නොතිබූ අතර පස්වල වටිනාකම වූ රු.300,000 ක් රජයට අහිමි වී තිබුණි.	රජයට සිදුවූ අලාභය සම්බන්ධයෙන් හා ඊට වගකිව යුතු පුද්ගලයන් සම්බන්ධයෙන් මූලික පරීක්ෂණයක් සිදුකිරීමට අවශ්‍ය කටයුතු සලසා දෙන මෙන් ධීවර අමාත්‍යාංශ ලේකම් වෙතින් ඉල්ලීමක් කර ඇති අතර එම වාර්තාව අනුව ඉදිරි කටයුතු සිදුකරන බව.	වගකිව යුතු පාර්ශවයන් හඳුනා ගැනීමට කටයුතු කර අලාභය අයකර ගැනීමට කටයුතු කල යුතුය.

(ඈ) හඳුනා ගන්නා ලද පාඩු

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් ජීප් රථය 2020 මාර්තු 05 වන දින හදිසි අනතුරකට ලක් වී තිබුණු අතර අනතුරින් පසු රථය අළුත්වැඩියා කර තිබුණි. ඒ වෙනුවෙන් 2020 දෙසැම්බර් 03 වන දින රු.847,700 ක මුදලකට අළුත්වැඩියාව සිදුකර පෞද්ගලික ආයතනය වෙත ගෙවීම් කර තිබුණද, මෙම රථයේ අනතුර සිදුවී වසර 03 කට අධික කාලයක් ගත වී පැවතුණද, ඒ සම්බන්ධ විධිමත් පූර්ණ වාර්තාවක් ඉදිරිපත්කර නොතිබූ අතර රු.847,700 ක් වූ අලාභය සම්බන්ධයෙන් මූල්‍ය රීති ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	රථය අලුත් වැඩියා කිරීම වෙනුවෙන් රු.847,000 ක මුදලක් අනුර මෝටර්ස් ආයතනය වෙත ගෙවූ බව දක්වා ඇති අතර පළාත් මූල්‍ය රීති 54.6 ප්‍රකාරව මූලික පරීක්ෂණයේ වාර්තාව 2023 දෙසැම්බර් 29 දින දෙපාර්තමේන්තුව වෙත ලබාදී එමගින් රථය අලුත් වැඩියාවට වැය වූ පිරිවැයෙන් සියයට 25 ක් හා දෙපාර්තමේන්තු ගාස්තු සියයට 25 ක් රියදුරුගෙන් අයකිරීමටත් අලාභහානියෙන් 75% පොතෙන් කපා හැරීමටත් නිර්දේශ ලබාදී ඇති බව සහ නමුත් මේ සඳහා	මූල්‍ය රීති ප්‍රකාරව කටයුතු කල යුතුය.

		මූලික විමර්ශනයක් සිදුකිරීම නිරීක්ෂණය වූ බැවින් ඒ සඳහා ඉල්ලීම් කර ඇති බව.	

(ඉ) නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් මාතර වර්ණාගාරය තුළ නූල් වර්ණ ගැන්වීමේ කටයුතු නතර කර දමා තිබූ බැවින් පිරිවැය රු.1,390,000 ක් වූ නූල් වර්ණ ගැන්වීමේ යන්ත්‍රය වසරකට ආසන්න කාලයක සිට සම්පූර්ණයෙන්ම නිශ්කාර්යව පැවතුණි. එමෙන්ම, මාතර වර්ණාගාරයේ නූල් වියළිම සඳහා යොදා ගැනීමේ අරමුණින් 2020 වර්ෂයේ රු.750,000 ක පිරිවැයක් දරමින් නූල් වියළීමේ යන්ත්‍රයක් සවිකර තිබුණු අතර එම යන්ත්‍රය සවිකල දිනයේ සිටම සම්පූර්ණයෙන්ම නිශ්කාර්යව පැවතුණි. මෙලෙස නිසි ඇගයීමකින් හා අධ්‍යනයකින් තොරව මෙම යන්ත්‍රය මිලදී ගෙන තිබීම නිසා ඒ සඳහා දරා තිබූ සම්පූර්ණ වියදම නිශ්කාර්ය වියදමක් බවට පත් වී තිබුණි.	2024 වසරේදී මෙම යන්ත්‍ර ඵලදායීව පරිහරණය කිරීමට තාක්ෂණික වශයෙන් හා පිරිවැය අනුව (cost effective) ඵලදායි ක්‍රමවේදයක් හරහා යන්ත්‍ර පිළිසකර කිරීමට හා නිෂ්පාදන කාර්යය නැවත ආරම්භ කිරීමට අපේක්ෂිත බව.	මෙම යන්ත්‍ර අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට කටයුතු කල යුතුය.
(ii)	කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව සතු තක්සේරු වටිනාකම රු.7,945,730 ක් වූ ජීප් රථයක ටයර් ගෙවී යාම හේතුවෙන් සහ ඒ සඳහා දෙපාර්තමේන්තුවේ ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැති වීම හේතුවෙන් 2022 වර්ෂයේ මැයි මස සිට එනම්, වසරකට අධික කාලයක් ධාවනය කිරීමකින් තොරව දක්ෂිණපාය පරිශ්‍රය තුළ ගාල්කර තිබූ අතර ජීප් රථය දිරාපත් වෙමින් පැවතුණි.	මෙම රථය නිරන්තර අලුත්වැඩියාවන්ට ලක් වන බැවින් නඩත්තු වියදම් අධික බැවින් ද දෙපාර්තමේන්තුව සතු ප්‍රතිපාදන සීමිත බැවින් ද මෙම රථය ප්‍රධාන ලේකම් වෙත ලබා ගන්නා ලෙස ප්‍රධාන ලේකම් වෙත ඉල්ලීම් කර ඇති බව.	මෙම ජීප් රථය අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ නොමැති නම් භාවිතා කල හැකි ආයතනයකට පවරා දීමට කටයුතු කල යුතුය.

1.5.14 ශීර්ෂය 314 - දකුණු පළාත් කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, වාරිමාර්ග, ජල සම්පාදන හා ජලාපවහන, වෙළඳ, ආහාර සැපයීම් හා බෙදාහැරීම සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව	අනුකූල නොවීම	ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම	නිර්දේශය
2019 මැයි 31 දිනැති අංක 13/2008(V) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙන් සංශෝධිත 2011 පෙබරවාරි 09 දිනැති අංක 13/ 2008 (IV) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය හා 2014 ජනවාරි 02 දිනැති 01/2014 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 2.1.3 (ii) ඡේදය	යොමුගත චක්‍රලේඛයන්හි අනුමත ඉන්ධන සීමාවන් හා ඉන්ධන වර්ගය පිළිබඳව පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් දැනුවත් කර තිබියදී හා ඒ පිළිබඳ ලබා දී තිබූ නිර්දේශ නොසලකා සහ රාජ්‍ය වියදම් කළමනාකරණය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති සම්බන්ධ චක්‍රලේඛ විධිවිධාන අභිබවායමින් ආණ්ඩුකාරවරයාගේ 2019 මැයි 13 දිනැති අංක G/SP/1/6/1/19 දරන ලිපියෙන් ලද අනුමැතිය මත 2019 මැයි 16 දිනැති අංක 02- 2019 දරන ප්‍රධාන ලේකම් චක්‍රලේඛය (මුදල්) නිකුත් කර තිබුණු අතර ඒ අනුව දකුණු පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ එක් තනතුරකට අයත් එක් නිලධාරියෙකු වෙත 2019 මැයි මස සිට 2023 ජූනි දක්වා වූ කාලපරිච්ඡේදයට අදාළව රු.915,760 ක් අනුමත සීමාව ඉක්මවීම හේතුවෙන් සහ සුපිරි පෙට්‍රල් /සුපිරි ඩීසල් භාවිතය හේතුවෙන් රු.150,620 ක් ඉන්ධන දීමනා ලෙස වැඩිපුර ගෙවා තිබුණි.	ඉන්ධන දීමනා ගෙවීමේදී නිලධාරීන් කාණ්ඩ වර්ගකර පදනම් දෙකක් යටතේ ඉන්ධන ගෙවා නොමැති අතර නිලධාරීන් භාවිතා කරන වාහන සඳහා එම වාහන වලට භාවිතා කරන ඉන්ධන වර්ගය අනුව වර්ග දෙකක් හඳුනාගෙන ඇති අතර ඒ අනුව භාවිතා කරන සත්‍ය ඉන්ධන වර්ගය පදනම් කර ගෙන දීමනා ගෙවා ඇති බව.	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය.

1.5.15 ශිර්ෂය 315 - දකුණු පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

(අ) නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව	අනුකූල නොවීම	ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම	නිර්දේශය
2019 මැයි 31 දිනැති අංක 13/2008(V) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙන් සංශෝධිත 2011 පෙබරවාරි 09 දිනැති අංක 13/ 2008 (IV) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය	යොමුගත චක්‍රලේඛයන්හි අනුමත ඉන්ධන සීමාවන් පිළිබඳව පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් දැනුවත් කර තිබියදී හා ඒ පිළිබඳ ලබා දී තිබූ නිර්දේශ නොසලකා සහ රාජ්‍ය වියදම් කළමනාකරණය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති සම්බන්ධ චක්‍රලේඛ විධිවිධාන අභිබවායමින් ආණ්ඩුකාරවරගේ 2019 මැයි 13 දිනැති අංක G/SP/1/6/1/19 දරන ලිපියෙන් ලද අනුමැතිය මත 2019 මැයි 16 දිනැති අංක 02- 2019 දරන ප්‍රධාන ලේකම් චක්‍රලේඛය (මුදල්) නිකුත් කර තිබුණු අතර ඒ අනුව දකුණු පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ තනතුරු 02 කට අයත් නිලධාරීන් 02 දෙනෙකු වෙත 2019 මැයි මස සිට 2023 ජුනි දක්වා වූ කාලපරිච්ඡේදයට අදාළව රු.50,840 ක් අනුමත සීමාව ඉක්මවීම හේතුවෙන් ඉන්ධන දීමනාව ලෙස වැඩිපුර ගෙවා තිබුණි.	ඉන්ධන දීමනා ගෙවීමේදී නිලධාරීන් කාණ්ඩ වර්ගකර පදනම් දෙකක් යටතේ ඉන්ධන ගෙවා නොමැති අතර නිලධාරීන් භාවිතා කරන වාහන සඳහා එම වාහන වලට භාවිතා කරන ඉන්ධන වර්ගය අනුව වර්ග දෙකක් හඳුනාගෙන ඇති අතර ඒ අනුව භාවිතා කරන සත්‍ය ඉන්ධන වර්ගය පදනම් කර ගෙන දීමනා ගෙවා ඇති බව.	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය.

(ආ) ආර්ථික නොවූ ගණුදෙනු

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2016 වර්ෂයේ සිට 2022 ඔක්තෝබර් මස දක්වා රු.14,955,094 ක වියදමක් දරමින් දකුණු පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් තොරතුරු	2019 වර්ෂයේ මැයි මස සිට මාණ්ඩලික නිලධාරීන්ට පමණක් සිම්පත් සඳහා ගෙවීම් කරනු ලැබුවද 2024 අප්‍රේල් 01 දින සිට සියලු	වියදම් දරන ලද අරමුණු ඉටුකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.

කළමනාකරණ පද්ධතියක් ස්ථාපිත කර තිබුණද දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම උපදේශකවරුන් එම කාර්යයෙන් ඉවත්වීම තුළ අපේක්ෂිත අරමුණු කරා ළඟා වීමට නොහැකි වී තිබුණි. තොරතුරු කළමනාකරණ පද්ධතියේ කටයුතු සඳහා අන්තර්ජාල පහසුකම් ලබා ගැනිමට ලබාගත් දුරකථන සිම්පත් වෙනුවෙන් 2017 සිට 2023 ඔක්තෝබර් දක්වා රු.2,614,541 ක් ගෙවා තිබුණි. මෙම සියළු සිම්පත් 2018 ජූලි 29 දින විසන්ධි කොට 2019 මැයි සිට මාණ්ඩලික නිලධාරීන්ට පමණක් සිම්පත් ලබාදී ඒ වෙනුවෙන් රු.842,326 ක් ගෙවීම් කර තිබුණද මෙම සිම්පත් අදාළ රාජකාරි කටයුතු සඳහා යොදා ගන්නා බව නිරීක්ෂණය නොවීය. එමෙන්ම,තොරතුරු කළමනාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීම සඳහා රු.8,780,450 ක් වැයකර ලබාදුන් ටැබ් පරිගණක 225 හි වර්තමාන හිමිකාරීත්වය හා ක්‍රියාකාරිත්වය පිළිබඳව ප්‍රමාණවත් තොරතුරු දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන ගොස් නොතිබුණි.

සිම්පත් විසන්ධි කරන ලෙසට අදාළ ආයතන වෙත දැනුම් දී ඇත. ඒ අනුව මේ වන විට අන්තර්ජාල පහසුකම් සඳහා කිසිඳු ගෙවීමක් සිදු නොකරන බව.

(ඇ) නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
පෝද්දිවල ගොවිපළෙහි පවතින යන්ත්‍ර අළුත්වැඩියා කිරීමට කටයුතු නොකිරීම නිසා රු.1,169,236 ක වත්කම් ඌන උපයෝජිතව පැවතුණි.	විගණනයෙන් සඳහන් කර ඇති ගොවිපල තුළ ඌණ උපයෝජිත උපකරණ ලැයිස්තුව කාර්මික සංවර්ධන අධිකාරිය වෙත ඉදිරිපත් කර උපකරණ අළුත්වැඩියා කිරීමට අදාළ මිල ගණන් අදාළ ආයතන විසින් ඉදිරිපත් කර ඇත. ඒ අනුව ලබා දී ඇති මිල ගණන් යටතේ එම උපකරණ අළුත්වැඩියාව ඵලදායීදැයි පරීක්ෂා කර බලා අදාළ නිර්දේශ ලබා ගනිමින් අළුත්වැඩියාව සඳහා හෝ වෙනත් සුදුසු ක්‍රියාමාර්ගයක් ලබා ගැනීමට අපේක්ෂා කරන බව.	ගොවිපල සතු සම්පත් උපරිම ඵළදායීතාවයකින් යුතුව භාවිතා කරමින් නිෂ්පාදන ධාරිතාවය වැඩිකිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.

1.5.16 ශීර්ෂය 316 - දකුණු පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව

(අ) නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව	අනුකූල නොවීම	ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම	නිර්දේශය
2019 මැයි 31 දිනැති අංක 13/2008(V) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙන් සංශෝධිත 2011 පෙබරවාරි 09 දිනැති අංක 13/ 2008 (IV) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය හා 2014 ජනවාරි 02 දිනැති 01/2014 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 2.1.3 (ii) ඡේදය	යොමුගත චක්‍රලේඛයන්හි අනුමත ඉන්ධන සීමාවන් හා ඉන්ධන වර්ගය පිළිබඳව පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් දැනුවත් කර තිබියදී හා ඒ පිළිබඳ ලබා දී තිබූ නිර්දේශ නොසලකා සහ රාජ්‍ය වියදම් කළමනාකරණය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති සම්බන්ධ චක්‍රලේඛ විධිවිධාන අභිබවායමින් ආණ්ඩුකාරවරගේ 2019 මැයි 13 දිනැති අංක G/SP/1/6/1/19 දරන ලිපියෙන් ලද අනුමැතිය මත 2019 මැයි 16 දිනැති අංක 02- 2019 දරන ප්‍රධාන ලේකම් චක්‍රලේඛය (මුදල්) නිකුත් කර තිබුණු අතර ඒ අනුව දකුණු පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ එක් තනතුරකට අයත් නිලධාරීන් 02 දෙනෙකු වෙත 2019 මැයි මස සිට 2023 ජුනි දක්වා වූ කාලපරිච්ඡේදයට අදාළව රු.311,150 ක් අනුමත සීමාව ඉක්මවීම හේතුවෙන් සහ සුපිරි පෙට්‍රල් /සුපිරි ඩීසල් භාවිතය හේතුවෙන් රු.259,480 ක් ඉන්ධන දීමනා ලෙස වැඩිපුර ගෙවා තිබුණි.	ඉන්ධන දීමනා ගෙවීමේදී නිලධාරීන් කාණ්ඩ වර්ගකර පදනම් දෙකක් යටතේ ඉන්ධන ගෙවා නොමැති අතර නිලධාරීන් භාවිතා කරන වාහන සඳහා එම වාහන වලට භාවිතා කරන ඉන්ධන වර්ගය අනුව වර්ග දෙකක් හඳුනාගෙන ඇති අතර ඒ අනුව භාවිතා කරන සත්‍ය ඉන්ධන වර්ගය පදනම් කර ගෙන දීමනා ගෙවා ඇති බව.	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය.

(ආ) අවිධිමත් ගණුදෙනු

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	දකුණු පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ මාතර දිස්ත්‍රික් කාර්යාල බල ප්‍රදේශයේ මුලටියන ගමගෙවත්ත අමුණෙහි ගේබියන් බැම්ම ඉදිකිරීම සඳහා රු.8,188,000 ක් හා රත්මලාව අමුණ ඉදිකිරීම සඳහා රු.11,016,000 ක ඇස්තමේන්තු සකස්කර 2024 මාර්තු 05 දින පුවත්පත් මඟින් ප්‍රසම්පාදන දැන්වීම් ප්‍රසිද්ධ කර තිබුණි. මේ සඳහා ලංසු ලිපිලේඛන 2024 මාර්තු 05 සිට 25 දින දක්වා වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් කාර්යාලය හා ප්‍රධාන කාර්යාලයෙන් නිකුත් කිරීම් කටයුතු සැලසුම්කර තිබුණද, ප්‍රසම්පාදන දැන්වීම ප්‍රසිද්ධ කිරීමට පෙර සිටම ඉදිකිරීම් සිදුකිරීමට අපේක්ෂිත වැඩ බිම වෙත ඉදිකිරීම් ද්‍රව්‍ය බඹගල් ඝනමීටර් 355 ක් හා ABC ඝන මීටර් 34 ක් පමණ ප්‍රවාහනය කර ගොඩගසා තිබුණි. දෙපාර්තමේන්තු කළමනාකරණය මේ පිළිබඳව දැනුවත් වී තිබුණද සිද්ධිය සම්බන්ධයෙන් නීත්‍යානුකූලව කටයුතු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. තවද, මෙම හේතුව මත ව්‍යාපෘතිය සඳහා වූ ප්‍රසම්පාදනයේ විනිවිදභාවය පිළිබඳව විගණනයේදී සෑහීමකට පත් විය නොහැකි විය.	ඉදිකිරීමට අපේක්ෂිත ස්ථානයට බඹ ගල් ගෙනවිත් ගොඩගසා තිබූ බවට අප දැනුවත් වූයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය අවසන් වීමට ප්‍රථම 2024 මාර්තු 17 දින දුරකථන මාර්ගයෙනි. මේ සම්බන්ධයෙන් මීට පෙර දැනුවත්වී නොතිබූ බව හා වැඩ බිම් ආසන්නයේ ප්‍රදේශයේ ගොවීන්ට අයත් පෞද්ගලික අයිතින් සතු කුඹුරු ඉඩම්වල අමුද්‍රව්‍ය ගොඩගසා ඇති බවත් එය වාරිමාර්ග රක්ෂිතයට අයත් නොවන ප්‍රදේශ වන බැවින් නීත්‍යානුකූලව ක්‍රියාමාර්ග ගැනීමට හැකියාවක් නොවූ බව .	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූලව කටයුතු කළ යුතුය.

(ඇ) නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
දකුණු පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් ගැසට් කර තිබූ වැව් 905 ක ආක්‍රමණශීලී ජලජ පැළෑටි ඉවත් කර ප්‍රතිසංස්කරණය සඳහා රු.මිලියන 84 ක් වටිනා යන්ත්‍රයක් මිලදී ගෙන 2023	මෙම යන්ත්‍රය මිල දී ගන්නා ලද්දේ ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් පිරිසකගේ මැදිහත් වීමෙන් මීට සර්වසම යන්ත්‍රයක ක්‍රියාකාරීත්වය ශ්‍රී ලංකාවේදී ප්‍රායෝගිකව අධ්‍යයනය කිරීමෙන් අනතුරුව ය. දකුණු පළාත්	යන්ත්‍රය ඵලදායිව උපයෝජනය කල යුතුය.

සැප්තැම්බර් 14 දිනට දින 587 ක් ගත වී තිබුණද, යන්ත්‍රය 2022 පෙබරවාරි 02 දින සිට 2023 සැප්තැම්බර් 14 දින දක්වා දින 353 කදී පැය 414 ක් පමණක් භාවිතා කර තිබුණි. එමෙන්ම වැව් 06 ක ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා යන්ත්‍රය යොදා ගෙන තිබුණද ප්‍රතිසංස්කරණය කර තිබුණේ වැව් 03 ක් පමණක් වීම නිසා යන්ත්‍රය දින 234 ක් නිෂ්ක්‍රීයව පැවතුණි. ඉන් අළුත්වැඩියා කටයුතු සඳහා දින 199 ක් ගතවී තිබූ අතර ඒ අනුව ආනයනික සමාගම ප්‍රමාණවත් සේවා සැපයීමක් සහ අළුත්වැඩියාවක් සිදු නොකරන බව තහවුරු වූ බැවින් මිලදී ගැනීමට පෙර ශක්‍යතා අධ්‍යයනයක් හා අවශ්‍යතා හඳුනාගත්තේ නම් මෙවැනි නිෂ්කාර්ය වැය බරක් වළක්වා ගැනීමට හැකියාව තිබුණි.	වාරිමාර්ග දෙපාර්තමේන්තුවට ඉදිරියේ දී ලැබෙන ප්‍රතිපාදන සැලකිල්ලට ගෙන දේශීය අවශ්‍යතාවය ද පදනම් කර ගෙන වැව් විශාල ප්‍රමාණයක ආක්‍රමණශීලී ජලජ පැළෑටි ඉවත් කිරීමට නියමිත බව.

1.5.17 ශීර්ෂය 317 - දකුණු පළාත් සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව	අනුකූල නොවීම	ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම	නිර්දේශය
2019 මැයි 31 දිනැති අංක 13/2008(V) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙන් සංශෝධිත 2011 පෙබරවාරි 09 දිනැති අංක 13/ 2008 (IV) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය හා 2014 ජනවාරි 02 දිනැති 01/2014 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 2.1.3 (ii) ඡේදය	යොමුගත චක්‍රලේඛයන්හි අනුමත ඉන්ධන සීමාවන් හා ඉන්ධන වර්ගය පිළිබඳව පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් දැනුවත් කර තිබියදී හා ඒ පිළිබඳ ලබා දී තිබූ නිර්දේශ නොසලකා සහ රාජ්‍ය වියදම් කළමනාකරණය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති සම්බන්ධ චක්‍රලේඛ විධිවිධාන අභිබවායමින් ආණ්ඩුකාරවරගේ 2019 මැයි 13 දිනැති අංක G/SP/1/6/1/19 දරන ලිපියෙන් ලද අනුමැතිය මත 2019 මැයි 16 දිනැති අංක 02-2019 දරන ප්‍රධාන ලේකම්	ඉන්ධන දීමනා ගෙවීමේදී නිලධාරීන් කාණ්ඩ වර්ගකර පදනම් දෙකක් යටතේ ඉන්ධන ගෙවා නොමැති අතර නිලධාරීන් භාවිතා කරන වාහන සඳහා එම වාහන වලට භාවිතා කරන ඉන්ධන වර්ගය අනුව වර්ග දෙකක් හඳුනාගෙන ඇති අතර ඒ අනුව භාවිතා කරන සත්‍ය ඉන්ධන වර්ගය පදනම් කර ගෙන දීමනා ගෙවා ඇති බව.	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය.

	චක්‍රලේඛය (මුදල්) නිකුත් කර තිබුණු අතර ඒ අනුව දකුණු පළාත් සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ එක් තනතුරකට අයත් නිලධාරින් 02 දෙනෙකු වෙත 2019 මැයි මස සිට 2023 ජුනි දක්වා වූ කාලපරිච්ඡේදයට අදාළව රු.517,370 ක් හා අනුමත සීමාව ඉක්මවීම හේතුවෙන් සහ සුපිරි පෙට්‍රල් /සුපිරි ඩීසල් භාවිතය හේතුවෙන් රු.126,000 ක් ඉන්ධන දීමනා ලෙස වැඩිපුර ගෙවා තිබුණි.		

1.5.18 ශිර්ෂය 318 - දකුණු පළාත් ක්‍රීඩා යෞවන කටයුතු, ග්‍රාම සංවර්ධන, සංස්කෘතික හා කලා කටයුතු, සමාජ සුභසාධන, පරිවාස හා ළමා රක්ෂක සේවා, කාන්තා කටයුතු හා ගෘහ ආර්ථික ප්‍රවර්ධන, නිවාස හා ඉදිකිරීම්, මිනිස් බල හා රැකී රක්ෂා අමාත්‍යාංශය

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව	අනුකූල නොවීම	ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම	නිර්දේශය
2019 මැයි 31 දිනැති අංක 13/2008(V) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙන් සංශෝධිත 2011 පෙබරවාරි 09 දිනැති අංක 13/ 2008 (IV) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය හා 2014 ජනවාරි 02 දිනැති 01/2014 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 2.1.3 (ii) ඡේදය	යොමුගත චක්‍රලේඛයන්හි අනුමත ඉන්ධන සීමාවන් හා ඉන්ධන වර්ගය පිළිබඳව පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් දැනුවත් කර තිබියදී හා ඒ පිළිබඳ ලබා දී තිබූ නිර්දේශ නොසලකා සහ රාජ්‍ය වියදම් කළමනාකරණය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති සම්බන්ධ චක්‍රලේඛ විධිවිධාන අභිබවායමින් ආණ්ඩුකාරවරගේ 2019 මැයි 13 දිනැති අංක G/SP/1/6/1/19 දරන ලිපියෙන් ලද අනුමැතිය මත 2019 මැයි 16 දිනැති අංක 02- 2019 දරන ප්‍රධාන ලේකම් චක්‍රලේඛය (මුදල්) නිකුත් කර තිබුණු අතර ඒ අනුව දකුණු පළාත් ක්‍රීඩා අමාත්‍යාංශයේ එක් තනතුරකට අයත් නිලධාරින් 02 දෙනෙකු වෙත 2019 මැයි මස සිට 2023	ඉන්ධන දීමනා ගෙවීමේදී නිලධාරීන් කාණ්ඩ වර්ගකර පදනම් දෙකක් යටතේ ඉන්ධන ගෙවා නොමැති අතර නිලධාරීන් භාවිතා කරන වාහන සඳහා එම වාහන වලට භාවිතා කරන ඉන්ධන වර්ගය අනුව වර්ග දෙකක් හඳුනාගෙන ඇති අතර ඒ අනුව භාවිතා කරන සත්‍ය ඉන්ධන වර්ගය පදනම් කර ගෙන දීමනා ගෙවා ඇති බව.	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය.

ජුනි දක්වා වූ කාලපරිච්ඡේදයට අදාළව රු.830,320 ක් අනුමත සීමාව ඉක්මවීම හේතුවෙන් සහ සුපිරි පෙට්‍රල් /සුපිරි ඩීසල් භාවිතය හේතුවෙන් රු.142,360 ක් ඉන්ධන දීමනා ලෙස වැඩිපුර ගෙවා තිබුණි.

1.5.19 ශීර්ෂය 319 - දකුණු පළාත් සමාජ සුභ සාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව	**අනුකූල නොවීම**	**ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
2019 මැයි 31 දිනැති අංක 13/2008(V) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙන් සංශෝධිත 2011 පෙබරවාරි 09 දිනැති අංක 13/ 2008 (IV) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය හා 2014 ජනවාරි 02 දිනැති 01/2014 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 2.1.3 (ii) ඡේදය	යොමුගත චක්‍රලේඛයන්හි අනුමත ඉන්ධන සීමාවන් හා ඉන්ධන වර්ගය පිළිබඳව පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් දැනුවත් කර තිබියදී හා ඒ පිළිබඳ ලබා දී තිබූ නිර්දේශ නොසලකා සහ රාජ්‍ය වියදම් කළමනාකරණය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති සම්බන්ධ චක්‍රලේඛ විධිවිධාන අභිබවායමින් ආණ්ඩුකාරවරගේ 2019 මැයි 13 දිනැති අංක G/SP/1/6/1/19 දරන ලිපියෙන් ලද අනුමැතිය මත 2019 මැයි 16 දිනැති අංක 02- 2019 දරන ප්‍රධාන ලේකම් චක්‍රලේඛය (මුදල්) නිකුත් කර තිබුණු අතර ඒ අනුව දකුණු පළාත් සමාජ සුභ සාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ එක් තනතුරකට අයත් නිලධාරින් 02 නෙකු වෙත 2019 මැයි මස සිට 2023 දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදයට අදාළව රු.524,379 ක් අනුමත සීමාව ඉක්මවීම හේතුවෙන් සහ සුපිරි පෙට්‍රල්/ සුපිරි ඩීසල් භාවිතය හේතුවෙන් රු.342,392 ක් ඉන්ධන දීමනා ලෙස වැඩිපුර ගෙවා තිබුණි.	ඉන්ධන දීමනා ගෙවීමේදී නිලධාරීන් කාණ්ඩ වර්ගකර පදනම් දෙකක් යටතේ ඉන්ධන ගෙවා නොමැති අතර නිලධාරීන් භාවිතා කරන වාහන සඳහා එම වාහන වලට භාවිතා කරන ඉන්ධන වර්ගය අනුව වර්ග දෙකක් හඳුනාගෙන ඇති අතර ඒ අනුව භාවිතා කරන සත්‍ය ඉන්ධන වර්ගය පදනම් කර ගෙන දීමනා ගෙවා ඇති බව.	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය.

1.5.20 ශිර්ෂය 320 - දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය

(අ) නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

	නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව	අනුකූල නොවීම	ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	2019 මැයි 31 දිනැති අංක 13/2008(V) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙන් සංශෝධිත 2011 පෙබරවාරි 09 දිනැති අංක 13/ 2008 (IV) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය හා 2014 ජනවාරි 02 දිනැති 01/2014 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 2.1.3 (ii) ඡේදය	යොමුගත චක්‍රලේඛයන්හි අනුමත ඉන්ධන සීමාවන් හා ඉන්ධන වර්ගය පිළිබඳව පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් දැනුවත් කර තිබියදී හා ඒ පිළිබඳ ලබා දී තිබූ නිර්දේශ නොසලකා සහ රාජ්‍ය වියදම් කළමනාකරණය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති සම්බන්ධ චක්‍රලේඛ විධිවිධාන අභිබවායමින් ආණ්ඩුකාරවරගේ 2019 මැයි 13 දිනැති අංක G/SP/1/6/1/19 දරන ලිපියෙන් ලද අනුමැතිය මත 2019 මැයි 16 දිනැති අංක 02- 2019 දරන ප්‍රධාන ලේකම් චක්‍රලේඛය (මුදල්) නිකුත් කර තිබුණු අතර ඒ අනුව දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයේ තනතුරු 09 කට අයත් නිලධාරීන් 18 දෙනෙකු වෙත 2019 මැයි මස සිට 2023 ජූනි දක්වා වූ කාලපරිච්ඡේදයට අදාළව රු.5,898,575 ක් අනුමත සීමාව ඉක්මවීම හේතුවෙන් සහ සුපිරි පෙට්‍රල් /සුපිරි ඩීසල් භාවිතය හේතුවෙන් රු.2,868,650 ක් ඉන්ධන දීමනා ලෙස වැඩිපුර ගෙවා තිබුණි.	ඉන්ධන දීමනා ගෙවීමේදී නිලධාරීන් කාණ්ඩ වර්ගකර පදනම් දෙකක් යටතේ ඉන්ධන ගෙවා නොමැති අතර නිලධාරීන් භාවිතා කරන වාහන සඳහා එම වාහන වලට භාවිතා කරන ඉන්ධන වර්ගය අනුව වර්ග දෙකක් හඳුනාගෙන ඇති අතර ඒ අනුව භාවිතා කරන සත්‍ය ඉන්ධන වර්ගය පදනම් කර ගෙන දීමනා ගෙවා ඇති බව.	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය.
(ii)	2022 සැප්තැම්බර් 16 දිනැති අංක 11/2022 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය	දකුණු පළාත් සභාවට අයත් අබලි ද්‍රව්‍ය ලෙස අපහරණය කර තිබූ වාහන 40 ක අයිතිය සමාලෝචිත වර්ෂය අවසාන දිනවන විටත් රජයේ ලියාපදිංචි නමින් පැවති අතර වාහන 03 ක් පසුව පුද්ගලික නමකට ලියාපදිංචි කර සමාලෝචිත වර්ෂය දක්වා	මෙම වාහනවල ලියාපදිංචිය අවලංගු නොවීම සම්බන්ධයෙන් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවට හා පළාත් මෝටර් රථ දෙපාර්තමේන්තුවට අංක CSS/03/09/09 හා 2023 සැප්තැම්බර්20/2023 නොවැම්බර් 23 දිනැති ලිපි මගින් දැනුම් දී ඇති බව.	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය.

		ආදායම් බලපත්‍ර ලබා ගෙන තිබුණි.		
(iii)	2020 ඔක්තෝබර් 02 දිනැති අංක 05/2020 දරන චක්‍රලේඛය කළමනාකරණ චක්‍රලේඛය	දකුණු පළාත් සභාවේ ආයතන 09 කට අයත් ගර්හිත තත්ත්වයේ පැවති වාහන හා යතුරු පැදි 34 ක්, අයිතිය නිශ්චිතව හඳුනාගත නොහැකි දිරාපත්වෙමින් පැවති ප්‍රධාන අමාත්‍යාංශ පරිශ්‍රයේ ගාල් කර තිබූ වාහන 02 ක් සහ කලේගාන සම්පත් මධ්‍යස්ථානයෙහි ගාල් කර තිබූ වාහන 02ක් අපහරණය කිරීමට හෝ අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට කටයුතු කර නොතිබුණි.	මේ වන විට එම වාහනවල කැබලි පමණක් ඇති බැවින්, විශේෂ කමිටුවක් පත් කර, එම කමිටු තීරණ හා උපදෙස් අනුව වාහන කැබලි සඳහා තක්සේරුවක් නියම කර කොටස් ලෙස අපහරණයට කටයුතු කරනු ඇති බව.	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය.
(iv)	2022 සැප්තැම්බර් 13 දිනැති අංක PS/PCA/ DCC/06/26 දරන ජනාධිපති ලේකම් උපදෙස් ලිපිය	යොමුගත උපදෙස් ලිපිය ප්‍රකාරව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපතිවරුන්ට එක් නිල වාහනයක් පමණක් ලබාදිය හැකි වුවද මාතර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපතිට ලබා දී තිබූ කැබ් රථය අලුත්වැඩියා කටයුතු සඳහා යොමු කර තිබූ කාලසීමාව තුළ ප්‍රධාන ලේකම් කාර්යාලයට අයත් ජීප් රථය මාතර දිස්ත්‍රික් ලේකම් වෙත 2023 පෙබරවාරි 07 දින තාවකාලිකව අනුයුක්ත කර තිබුණි. එහෙත් රථයේ අලුත්වැඩියා කටයුතු 2023 මාර්තු මසදී අවසන්වී තිබුණද, මෙම වාර්තාවේ දින දක්වාම අදාළ රථය ප්‍රධාන ලේකම් කාර්යාලය සතු ජීප් රථය ආයතනය වෙත ගෙන්වා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කර නොතිබුණි.	ජීප් රථය දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ නියමය පරිදි මාතර දිස්ත්‍රික් ලේකම් හා ගිවිසුම් ගතව මාතර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපති වෙත ලබා දී ඇති අතර, අවසන් ගිවිසුම 2024 මැයි 06 දක්වා වලංගු බැවින්, ඉන් පසු නැවත කාර්යාලය වෙත භාරදෙන ලෙස CSS/03/10/11 හා 2024.04.19 දිනැති ලිපිය මගින් මාතර දිස්ත්‍රික් ලේකම් වෙත දන්වා ඇති බව.	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය.

(ආ) ආදායම් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
1994 අංක 01 දරන දකුණු පළාතේ මුද්දර ගාස්තු හැරවීමේ ප්‍රඥප්තිය අනුව	1994 අංක 04 හා අංක 05 දරන දකුණු පළාත් මුද්දර ගාස්තු	1990 අංක 07 දරන දකුණු පළාත් මුදල් ප්‍රඥප්තිය ප්‍රකාරව

1990 අංක 07 දරන දකුණු පළාත් මුදල් ප්‍රඥප්තිය හා 1992 අංක 02 දරන දකුණු පළාත් මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය ප්‍රකාර පළාත් සභාව විසින් දකුණු පළාතේ යම් පළාත් පාලන ආයතනයක පරිපාලන සීමා ඇතුළත පිහිටි යම් නිශ්චල දේපලක් පැවරීම සම්බන්ධයෙන් වූ යම් සාධන පත්‍රයක් වෙනුවෙන් යම් මුද්දර ගාස්තුවක් අයකර, දකුණු පළාත් පාලන අරමුදලට ගෙවා ඇති අවස්ථාවක පළාත් සභාව විසින් ඒ මුද්දර ගාස්තුව අදාළ පළාත් සභා ආයතන වෙත එකතු කරන ලද වර්ෂයේ දෙසැම්බර් 31 වැනි දින සිට අවුරුදු 2 ක් වූ කාල සීමාවක් තුළ විෂයභාර අමාත්‍යවරයාගෙන් ලියවිල්ලකින් හිමිකමක් ඉදිරිපත් කරන විට ඒ ඒ පළාත් පාලන ආයතනයට ඒ මුද්දර ගාස්තුව හැරවිය හැකි වුවද, දකුණු පළාත් සභාවේ භාණ්ඩාගාරය විසින් පළාත් පාලන ආයතනවලට යොමු නොකරන ලද රු.මිලියන 681.79 ක් වූ මුද්දර ගාස්තු ආදායම සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවතුණි. එමෙන්ම, පළාත් භාණ්ඩාගාරයේ ස්ථාවර තැන්පතුවල රු.මිලියන 1,500 ක මුද්දර ගාස්තු ආදායමක්ද ආයෝජනය කර පැවතුණි.	හැරවීමේ ප්‍රඥප්තිය හා අධිකරණ දඩ පැවරීමේ ප්‍රඥප්තිය අනුව මුද්දර ගාස්තු හා උසාවි දඩ පළාත් අරමුදලට බැර කර වසර 02 ක් ඇතුලත එම උසාවි දඩ හා මුද්දර ගාස්තු මුදල් විෂය භාර අමාත්‍යවරයා හෝ ආණ්ඩුකාරතුමාගේ ලිඛිත නියෝගය මත ගෙවා නිරවුල් කරනු ලැබේ. ඒ අනුව 2023 දෙසැම්බර් 31 දිනට මුද්දර ගාස්තු ශේෂය 681,794,410.72 ක් හා උසාවි දඩ ශේෂය රු.11,201,339 ක් වේ. 2023 දෙසැම්බර් 31 දිනට විගණනය විසින් පෙන්වා ඇති රු.2,795,993,077 ක අගය නිවැරදි නොවන බව හා ඒ අනුව, ප්‍රධාන ලේකම් කාර්යාලයේ දකුණු පළාත් භාණ්ඩාගාරය විසින් මෙම මුද්දර ගාස්තු නිරවුල් කිරිමේදි කිසිදු ප්‍රමාදයක් සිදු වි නොමැති බව.	කටයුතු කර මුද්දර ගාස්තු ආදායම් අදාළ පළාත් පාලන ආයතන වලට යොමු කිරීමට කටයුතු කල යුතුය.

(ඇ) කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	2006 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා දකුණු පළාත් සභාවේ සභාපති විසින් නිල රථය ලෙස භාවිතා කර තිබූ දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයට අයත් ටොයොටා ලැන්ඩ්කෲෂර් වර්ගයේ ප්‍රාඩෝ ජීප් රථය, 2016 ජුනි 06 දින නැවත ප්‍රධාන ලේකම් කාර්යාලයට ආපසු භාර දී වසරකින් පසුව එම රථය අළුත්වැඩියාවකට පෞද්ගලික ගරාජයකට භාරදී තිබුණි. යාන්ත්‍රික ඉංජිනේරු විසින් අළුත්වැඩියාවන්	ජීප් රථය සම්බන්ධයෙන් පත්කරන ලද කමිටු තීරණය පරිදි සුදුසුකම්ලත් යාන්ත්‍රික ඉංජිනේරු වරයෙක් මගින් මේ වන විට එම රථයේ සියයට 50 ක අළුත්වැඩියාවන් සිදුකර ඇත්ද යන්න තහවුරු කරගෙන, එහි ඉදිරි කටයුතු කිරීමට නියමිත බව මෙම රථයෙහි මෙතෙක් කරන ලද අළුත්වැඩියාවන් සම්බන්ධයෙන් හා ඉතිරි අළුත්වැඩියාවන් කිරීම සම්බන්ධයෙන් වාර්තාවක් ලබා	නියමිත කල වකවානුව තුළ වාහන අලුත්වැඩියා කර ඵලදායී ලෙස සේවය සඳහා යොදා ගැනීමට කටයුතු කල යුතුය.

	සිදුකරන ලෙස 2017 ජූලි 06 දින ලබාදුන් නිර්දේශ මත 2017 ජූලි 10 දිනැති නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) ගේ ලිපියෙන් මිල ගණන් කැඳවීම් කර අවම මිලගණන් ඉදිරිපත් කර තිබූ පෞද්ගලික ගරාජය වෙත රු.1,099,005 ක මුදලකට අලුත්වැඩියාව සඳහා යොමුකර තිබුණි. එහෙත් වසර 2 ½ ක් එනම් දින 912 ක කාලයක් අලුත්වැඩියා කිරීමකින් තොරව පෞද්ගලික ආයතනයක ගරාජයේ වාහනය නතර කර තිබීමෙන් වාහනය අලුත්වැඩියා කිරීමට අධික පිරිවැයක් දැරීමට සිදුව තිබුණි.	ගෙන ඉදිරි කටයුතු සිදු කරනු ලබන බව.	
(ii)	අනවශ්‍ය හා ක්‍රියාත්මක නොවන වැඩසටහනක් සඳහා ප්‍රතිපාදන වෙන්කිරීම		
	මූල්‍ය රීති 27.1 ප්‍රකාරව ආණ්ඩුකාරවර විසින් අලුත් පළාත් සභාවක් රැස්වීම පිණිස කැඳවනු ලැබ ඇති දිනය හෝ පළාත් සභා කටයුතු කිරීම නැවත ආරම්භ කරන දිනය හෝ ප්‍රකාශයට පත් කර නොමැති අවස්ථාවක වාර්ෂික මුදල් ප්‍රකාශය මඟින් ප්‍රතිපාදන වෙන්කිරීම අත්‍යවශ්‍ය නොවුවද, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් දකුණු පළාත් සභාවේ අමාත්‍යාංශ 05 සඳහා අමාත්‍ය කාර්යාල වියදම් වෙනුවෙන් සංකේත ප්‍රතිපාදන ලෙස වෙන්කර ගැනීමකින් තොරව වාර්ෂික මුදල් ප්‍රකාශයේ 2021 මඟින් ප්‍රතිපාදන වෙන්කරවා ගෙන තිබුණි. ඒ අනුව, ජාතික අයවැය චක්‍රලේඛ මගින් රාජ්‍ය වියදම් සීමාකර ඇති විටෙක, අත්‍යවශ්‍ය නොවන හා ක්‍රියාත්මක නොවන වැඩසටහන් සඳහා මුදල් වෙන්කර, පසුව එම ප්‍රතිපාදන මඟින් වියදම් දරා තිබුණි.	පළාත් සභා ක්‍රියාත්මක වන්නේ කුමන අවස්ථාවේද යන්න නොදන්නා බැවින් සෑම වර්ෂයකම සෑම අමාත්‍යාංශයක්ම පළාත් සභා අමාත්‍යවරුන්ගේ කාර්යාලයක් සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම අත්‍යවශ්‍ය වශයෙන්ම සිදු කල යුතු කාර්යයක් බව.	ක්‍රියාත්මක නොවන එහෙත් ඉදිරියේදී ක්‍රියාත්මක වුවහොත් වියදම් දැරීමට සිදු විය හැකි වැය විෂයයන් වෙනුවෙන් සංකේත ප්‍රතිපාදන සලසා ගැනීමට කටයුතු කල යුතුය.
(iii)	දකුණු පළාත් සභාව විසින් පුනර්ජනනීය සූර්ය බලශක්ති උත්පාදනය කර ජාතික විදුලි බල පද්ධතියට 50 MW විදුලි ධාරිතාවයක් එක් කිරීමේ අරමුණ හා පළාත් සභාව තුළ නව ආදායම්		

මාර්ගයක් හඳුනා ගැනීමේ අරමුණ ඇතිව පළාත් සභාව තුළ පිහිටි පාසල්, රෝහල් හා රජයේ ගොඩනැගිලිවල වහලවල් වසර 20 ක කාලයකට දිගුකාලීන බදු පදනමට ලබාදෙමින් සූර්ය බලශක්ති උත්පාදනය කර විදුලිය ජනනය කිරීමේ කාර්යය සඳහා පෞද්ගලික ආයතනය තෝරාගෙන 2022 අප්‍රේල් 22 දින ගිවිසුම් ගතවී තිබුණි. පහත කරුණු නිරීක්ෂණය විය.		
(ඒ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.7.4 වගන්තිය සහ 2.8.1 (ආ) වගන්ති ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	2.8.1 වගන්ති ප්‍රකාරව ප්‍රසම්පාදන කමිටුවට අදාළ ආයතනය තෝරාගැනීම පිළිබඳ ප්‍රසම්පාදන තීරණය ගැනීම සඳහා නිර්දේශ ලබා දෙනුයේ තාක්ෂණික ඇගයීම් කමිටුව වන බැවින් ඒ සඳහා දකුණු පළාත් ඉංජිනේරු සේවා ආයතනයේ පළපුරුදු විදුලි ඉංජිනේරු මහතෙකු වන ජේ.ජී ජනත් මහතා විදුලි ඉංජනේරු ක්ෂේත්‍රයේ ජ්‍යෙෂ්ඨ ඉංජනේරුවකු වන බැවින් ඒ මහතා කමිටු සාමාජිකයෙකු ලෙස පත්කරගෙන ඇති බව.	රාජ්‍ය හා පෞද්ගලික හවුල් කාර්යයක් යටතේ වන සේවා සැපයීමක් බැවින් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූලව කටයුතු කල යුතුය.
(බී) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.9.1 වගන්තියට අනුව අදාළ කමිටු සඳහා දීමනා ගෙවීම් සිදුකල යුතු වුවද, ප්‍රසම්පාදනයේ විශාලත්වය හා දක්වන ලද දායකත්වය පදනම් කරගෙන ප්‍රසම්පාදන කමිටු හා තාක්ෂණික කමිටු වෙත එකතුව රු.640,000 ක් ආණ්ඩුකාරවර අනුමැතිය මත ගෙවීම් කර තිබුණි.	ගෙවීම් සඳහා ආණ්ඩුකාරවරගේ අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරන ලද ලිපියෙහි ප්‍රසම්පාදනයේ විශාලත්වය හෝ දක්වන ලද දායකත්වය සහ එහි මූල්‍යමය අගය පිළිබඳ සඳහන් නොකිරීම පිළිඳව ප්‍රමාදදෝෂයක් සිදු වී ඇති අතර ඉදිරියේදී එවැනි ගෙවීම් සඳහා අනුමැතිය ලබාගැනීමේදී එවැනි ප්‍රමාද දෝෂයන් සිදු නොවීමට වග බලා ගන්නා බව.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූලව කටයුතු කල යුතුය.

(ඈ) අවිධිමත් ගණුදෙනු

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
දකුණු පළාත් සභාවේ ආයතන නමින් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර තිබුණු වාහන සහ යතුරුපැදි 178 ක් හා ආයතන විසින් ඉදිරිපත් කර තිබූ වාහන ලැයිස්තුවල සඳහන් වාහන 07 ක් සහ මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගතකර තිබූ වාහන හා යතුරු පැදි 04 ක් ඇතුළුව වාහන 201 ක භෞතික පැවැත්ම තහවුරුකර ගැනීමට නොහැකි වූ අතර ඒ පිළිබඳව පරීක්ෂාකර නීත්‍යානුකූලව කටයුතුකර නොතිබුණි. ඉන් භෞතික පැවැත්ම තහවුරු නොවූ දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස් නමින් ලියාපදිංචි යතුරු පැදි 30 ක් වෙනුවෙන් අවස්ථා කිහිපයකදී නිදහස් ආදායම් බලපත්‍ර ලබාදී තිබූ අතර ආදායම් බලපත්‍ර ලබාගැනීමේදී දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ හෝ ප්‍රාදේශීය අධිකාරියේ අත්සන සහිතව මෝ.වා.ප්‍ර 2 ආකෘතිය මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ගාස්තු නිදහස් කර ගැනීම සිදු කල යුතු බැවින් වාහනවල අයිතිය හා භෞතික පැවැත්ම පිළිබඳව තහවුරු නොකර නිදහස් ආදායම් බලපත්‍ර ලබාගත්තේ කෙසේද යන්න විගණනයේදී තහවුරු නොවුණි.	පළාත් පාලන ආයතනවල මහජන නියෝජිතයින් සඳහා මෙම යතුරු පැදි ලබා දීම ප්‍රධාන අමාත්‍යාංශය වෙතින් සිදු කරන ලද අතර වාරික වශයෙන් අය කිරීම් පමණක් අදාල පළාත් පාලන ආයතන වෙතින් සිදු කර ගන්නා ලදී. මෙම යතුරු පැදි ලබා දීමේ නාම ලේඛනය අමාත්‍යාංශය මඟින් අප වෙත ලබා දී ඇති අතර, එම නාම ලේඛනය, මෙම යතුරු පැදි ලියාපදිංචි වර්ෂය 2011 සහ 2012 වර්ෂයන් වුයෙන් හා අයකිරීම් ක්‍රමවේදය අනුව මෙම යතුරු පැදි 2011 සහ 2012 වර්ෂයන්හි පළාත් පාලන ආයතනවල මහජන නියෝජිතයින් සඳහා ලබා දුන් යතුරු පැදි බව.	විශේෂ විමර්ශනයක් සිදුකිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.

(ඉ) කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i) ප්‍රධාන ලේකම් කාර්යාලයේ පැති බැම්ම ඉදිකිරීම		
(ඒ) ප්‍රධාන ලේකම් කාර්යාලයේ ඉදිරිපස පැති බැම්ම ඉදිකිරිම සඳහා වූ කොන්ත්‍රාත්තුව	මුළු පිරිවැය ඇස්තමේන්තුව මත පැති බැම්ම සම්පූර්ණයෙන් ඉදිකිරීම සඳහා රු.37,362,532ක වැට් රහිත මුදලකට කොන්ත්‍රාත් ගිවිසුම අත්සන්	විශේෂ විමර්ශනයක් සිදුකිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.

පෞද්ගලික ආයතනයට රු.37,362,532 ක බදු රහිත මිලකට පවරා තිබුණු අතර එය බදු රු.2,989,002 හා රු.3,735,465 ක හදිසි අවිනිශ්චිත ප්‍රතිපාදන සමඟ රු.44,087,000 ක මුදලකින් සමන්විත විය. කර්මාන්තයේ පළමු අදියර 2021 අගෝස්තු 03 දින ආරම්භ වී 2022 මාර්තු 31 එනම් දින 240 ක කාලයකින් නිම කල යුතු වුවත් අවස්ථා 02 කදී දින දීර්ඝ කර තිබුණි. කෙසේ වුවද, කර්මාන්තය කරගෙන යන අතරතුර 2022 අගෝස්තු 02 දින සිට ඉදිකිරීම් නතර කර කර්මාන්තයේ ඉතිරි වැඩ කොටස් දෙවන අදියර වශයෙන් සලකා නව කොන්ත්‍රාත්තුවක් ලෙස එම පෞද්ගලික ආයතනයටම රු.34,368,110 ක බදු රහිත මිලකට පවරා තිබුණි. එය බදු සඳහා රු.4,124,173 ක්, අවිනිශ්චිත ප්‍රතිපාදන (සියයට 10) රු.3,436,811 ක් හා මිල වැඩිවීම (සියයට 10) සඳහා රු.3,436,405 ක් ලෙස මුළු පිරිවැය රු.45,365,499 ක් විය. 2022 සැප්තැම්බර් 10 දින ආරම්භ වී 2022 දෙසැම්බර් 20 දින නිම කල යුතුව තිබුණද අවස්ථා 03 කදී දින දීර්ඝ කිරීම් සමඟ 2023 මාර්තු 31 දින කර්මාන්තයේ කල ද රටේ පැවැති අධි උද්ධමනකාරී තත්ත්වය, වෙළඳපොළ තුළ භාණ්ඩ හිඟ වීම තෙල් අර්බුදය හා රටේ ඇති වූ ආර්ථික අර්බුධය හේතුවෙන් කොන්ත්‍රාත් කටයුතු සිදු කිරීම ප්‍රසම්පාදන තීරණය මත අවසන් කල අතර 2022 මැයි 24 දිනැතිව නිකුත්කර ඇති 03/2022 අංක සහිත ප්‍රධාන ලේකම් (මුදල්) චක්‍රලේඛයේ සඳහන් උපදෙස් පරිදි කටයුතු කර කොන්ත්‍රාත් ගිවිසුම අවසන් කිරීම සහ නැවත ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීම සඳහා නිසි බලය ලබා දී ඇත. ඒ අනුව, පැති බැම්ම ඉදිකිරීම (ඉතිරි වැඩ) සඳහා සඳහා ප්‍රසම්පාදනය සිදුකර දෙවන කොන්ත්‍රාත්තුවේ කටයුතු ආරම්භ කර 2023 මාර්තු 31 දින කර්මාන්තය නිම කර ඇති බව.

	වැඩ අවසන් කර තිබුණි.		
(බී)	කර්මාන්තයේ පළමු අදියර වෙනුවෙන් අත්තිකාරම් මුදල්ද ඇතුළුව බිල්පත් 08 කින් රු.30,060,799 ක් ද දෙවන අදියර වෙනුවෙන් අත්තිකාරම් මුදල් ද ඇතුළත්ව බිල්පත් 04 කින් රු.29,755,738 ක් ද වශයෙන් රු.59,816,537 ක් මුළු ගෙවීම් ලෙස කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි. (දෙවන අදියරේ අවසන් බිල්පත හැර) පළමු හා දෙවන කොන්ත්‍රාත්තුවට අදාළව රු.16,326,201 ක (රු.7,135,820 ක් දෙවන කොන්ත්‍රාත්තුවේදී රු.9,190,319 ක්) මුදලක් කොන්ත්‍රාත්කරුට වැඩිපුර ගෙවා ඇති බව නිරීක්ෂණය කරන අතර එය බදු සමඟ රු.18,775,131 ක් (16,326,201*1.15) බව නිරීක්ෂණය කෙරේ. තවද, කොන්ත්‍රාත්කරුට රු.11,398,346 ක ගෙවිය යුතු අත්තිකාරම් මුදල් නියමිත දිනට කලින් ගෙවා තිබුණු අතර එයින් රු.10,507,510 ක් ඇස්තමේන්තු නිවැරදිව පිළියෙල නොකිරීම නිසා මුදල් ගලා ගොස් ඇති බව නිරීක්ෂණය කෙරේ.	දෙවන ඡේදයේ සඳහන් පරිදි කොන්ත්‍රාත්කරුට පළමු කොන්ත්‍රාත්තුව වෙනුවෙන් බිල්පත් 08කින් රු.30,060,798ක් හා දෙවන කොන්ත්‍රාත්තුව වෙනුවෙන් බිල්පත් 04කින් රු.29,755,737ක් ගෙවා ඇත. නමුත් 01 හා 02 කොන්ත්‍රාත්වලට අදාළව රු.16,326,201 ක මුදලක් කොන්ත්‍රාත්කරුට වැඩිපුර ගෙවා නොමැති බව පැතිබැම්ම සඳහා සකස් කරන ලද මුල් ඇස්තමේන්තුව හා ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ නිරීක්ෂණයන්ට අනුකූලව සකස් කරන ලද අවසාන සැලැස්ම අනුව සකස් කරන ලද ඇස්තමේන්තුව පිළිබඳව විධිමත්ව පරීක්ෂා කර සංසන්දනාත්මක වාර්තාවක් ඉංජිනේරුවරු දෙදෙනකුගේ හා තාක්ෂණික නිළධාරීන් තිදෙනකුගෙන් යුත් කමිටුවක් මඟින් ලබා ගෙන ඇත. ඒ අනුව මෙම කර්මාන්තය සම්පූර්ණ කිරිම සඳහා සංශෝධන සැලැස්ම අනුව වැයවන මුදල රු.56,195,179ක් බව අනාවරණය වී ඇත. එම අගය පළමු හා දෙවන කොන්ත්‍රාත් දෙකෙහිම ගෙවා ඇති සමස්ථ මුදල වන රු. 55,584,432 ට වඩා වැඩි බැවින් රජයට පාඩුවක් සිදු වී නොමැති බව.	විශේෂ විමර්ශනයක් සිදුකිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.
(සී)	එමෙන්ම ඉදිරිපස පැති බැම්ම ඉදිකිරිම සඳහා බැරකම් ලෙස රු.5,264,418 ක් තිබුණද,	බැරකම් හඳුනා ගැනීමේදී වැඩිපුර රු.5,264,418 ක් බැරකම් වල ඇතුළත් වීම පිළිගෙන ඇත. බැරකම් හඳුනා ගන්නා අවස්ථාව වන විට	විශේෂ විමර්ශනයක් සිදුකිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.

පිළිතුරට අනුව බැරකම් ලෙස රු.25,581,761 ක් හඳුනා ගෙන තිබුණි. එහෙත් අවසාන බිල්පතට අනුව කොන්ත්‍රාත්කරුට ගෙවීම වෙනුවට තොන්ත්‍රාත්කරුගෙන් රු.1,811,259 ක් අයවිය යුතු ලෙස දක්වා තිබුණු බැවින් වැරදි ඇස්තමේන්තු මත පදනම්ව ඇති කර තිබූ රු.25,587,761 ක් ඇති කල නොහැකි බැරකමක් ලෙස නිරීක්ෂණය කෙරේ.	කොන්ත්‍රාත්තුවේ අවසාන බිල්පත ඉදිරිපත් කර නොමැති බැවින් කොන්ත්‍රාත්කරුගේ අයවීමක් තිබුණු බවට තහවුරුවක් නොවීය. මෙහි ඇස්තමේන්තුව වැරදි ඇස්තමේන්තුවක් නොව ඇස්තමේන්තුවේ ඇති වැඩ කොටස් යාබද පෞද්ගලික ඉඩම් හිමියකු විසින් පැති බැම්මේ කොටසක් එම ඉඩමේ පිවිසුම් මාර්ගය සමඟ ඉදිකිරිම නිසා ඉටු කිරීමට නොහැකි වීම නිසා ඇස්තමේන්තු වැඩ කොටස් ඉතිරි වීම මත අවසාන බිල්පතෙහි අයකිරීමක් පැවතීම වැරදි ඇස්තමේන්තුවක් මත පදනම්ව සිදුවූවක් නොවන බව අවසාන බිල්පතෙහි අය කිරීමක් සිදු වුයේ අවසාන බිල්පත මඟින් මිල විචලන ගැලපීම සිදු කිරීමත් පෞද්ගලික ඉඩම් හිමියකු විසින් පැති බැම්මේ යාබද කොටසක් ඉදිකිරිමත් නිසා බව.

(ඊ) නොවිසඳී ඇති විගණන ඡේද

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
ව්‍යාපෘති වාර්තාවක් සකස් කිරීමකින් තොරව ගරු ආණ්ඩුකාරවරගේ යෝජනාවක් මත දකුණු පළාතේ සියලුම රාජ්‍ය ආයතන ඒකාබද්ධ කර තැපැල කළමනාකරණ පරිගණක වැඩසටහනක් නිර්මාණය කිරීම සඳහා 2020 ඔක්තෝබර් මස 07 වන දින රු.14,008,176 ක මුදලකට කොන්ත්‍රාත් සමාගමක් සමඟ ගිවිසුම්ගත වී තිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා 2021 වර්ෂය තුළදී රු.27,984,663 ක මුදලක් වැයකර තිබුණද, ගිවිසුම් ප්‍රකාරව නියමිත කාලය තුළ වැඩ අවසන් කර නොතිබුණි. එමෙන්ම මේ සඳහා රු.21,140,000 කට ස්කැනර් යන්ත්‍ර 86 ක් මිලට ගෙන තිබූ අතර ඉන් 70 ක් 2022 දෙසැම්බර් මස 22 සහ 23 යන	පළාත් සභාවට සුදුසු ලෙස එම පද්ධතිය සංවර්ධනය කිරීම සඳහා අදාල ආයතනය වෙතින් එම පද්ධතියට අදාළ ක්ෂේත ලිඛිතව ඉල්ලා ඇති අතර, එම ක්ෂේත ලබනු පසු පද්ධතිය වැඩිදියුණු කිරීමට කටයුතු කරනු ඇති බව.	ව්‍යාපෘති සිදුකිරීමට පෙර ශක්‍යතා අධ්‍යනයක් සිදුකර ඒ අනුව කටයුතු කල යුතුය. එමෙන්ම කළමනාකරණ තොරතුරු පද්ධති ඵලදායී ලෙස සංවර්ධනය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.

දිනයන්වල එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන ආයතන සඳහා බෙදා හැර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොකිරීම නිසා එම යන්ත්‍ර ඵලදායී ලෙස ව්‍යාපෘතිය සඳහා යොදවා ගැනීමටත් ව්‍යාපෘතියෙන් බලාපොරොත්තු වූ අරමුණු ඉටු කර ගැනීමටත් නොහැකි වී තිබුණි.

1.5.21 ශීර්ෂය 321 - දකුණු පළාත් සැලසුම් ලේකම් කාර්යාලය
නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව	**අනුකූල නොවීම**	**ප්‍රධාන ගණකාධිකාරියාගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
2019 මැයි 31 දිනැති අංක 13/2008(V) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙන් සංශෝධිත 2011 පෙබරවාරි 09 දිනැති අංක 13/ 2008 (IV) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය හා 2014 ජනවාරි 02 දිනැති 01/2014 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 2.1.3 (ii) ඡේදය	යොමුගත චක්‍රලේඛයන්හි අනුමත ඉන්ධන සීමාවන් හා ඉන්ධන වර්ගය පිළිබඳව පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් දැනුවත් කර තිබියදී හා ඒ පිළිබඳ ලබා දී තිබූ නිර්දේශ නොසලකා සහ රාජ්‍ය වියදම් කළමනාකරණය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති සම්බන්ධ චක්‍රලේඛ විධිවිධාන අභිබවායමින් ආණ්ඩුකාරවරගේ 2019 මැයි 13 දිනැති අංක G/SP/1/6/1/19 දරන ලිපියෙන් ලද අනුමැතිය මත 2019 මැයි 16 දිනැති අංක 02- 2019 දරන ප්‍රධාන ලේකම් චක්‍රලේඛය (මුදල්) නිකුත් කර තිබුණු අතර ඒ අනුව දකුණු පළාත් සැලසුම් ලේකම් කාර්යාලයේ තනතුරු 02 කට අයත් නිලධාරින් 02 දෙනෙකු වෙත 2019 මැයි මස සිට 2023 ජුනි දක්වා වූ කාලපරිච්ඡේදයට අදාළව රු.1,293,465 ක් අනුමත සීමාව ඉක්මවීම හේතුවෙන් සහ සුපිරි පෙට්‍රල් /සුපිරි ඩීසල් භාවිතය හේතුවෙන් රු.560,830 ක් ඉන්ධන දීමනා ලෙස වැඩිපුර ගෙවා තිබුණි.	ඉන්ධන දීමනා ගෙවීමේදී නිලධාරීන් කාණ්ඩ වර්ගකර පදනම් දෙකක් යටතේ ඉන්ධන ගෙවා නොමැති අතර නිලධාරීන් භාවිතා කරන වාහන සඳහා එම වාහන වලට භාවිතා කරන ඉන්ධන වර්ගය අනුව වර්ග දෙකක් හඳුනාගෙන ඇති අතර ඒ අනුව භාවිතා කරන සත්‍ය ඉන්ධන වර්ගය පදනම් කර ගෙන දීමනා ගෙවා ඇති බව.	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය.

1.5.22 ශිර්ෂය 322 - දකුණු පළාත් ඉංජිනේරු සේවා කාර්යාලය

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව	අනුකූල නොවීම	ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම	නිර්දේශය
2019 මැයි 31 දිනැති අංක 13/2008(V) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙන් සංශෝධිත 2011 පෙබරවාරි 09 දිනැති අංක 13/ 2008 (IV) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය හා 2014 ජනවාරි 02 දිනැති 01/2014 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 2.1.3 (ii) ඡේදය	යොමුගත චක්‍රලේඛයන්හි අනුමත ඉන්ධන සීමාවන් හා ඉන්ධන වර්ගය පිළිබඳව පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් දැනුවත් කර තිබියදී හා ඒ පිළිබඳ ලබා දී තිබූ නිර්දේශ නොසලකා සහ රාජ්‍ය වියදම් කළමනාකරණය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති සම්බන්ධ චක්‍රලේඛ විධිවිධාන අභිබවායමින් ආණ්ඩුකාරවරගේ 2019 මැයි 13 දිනැති අංක G/SP/1/6/1/19 දරන ලිපියෙන් ලද අනුමැතිය මත 2019 මැයි 16 දිනැති අංක 02- 2019 දරන ප්‍රධාන ලේකම් චක්‍රලේඛය (මුදල්) නිකුත් කර තිබුණු අතර ඒ අනුව දකුණු පළාත් ඉංජිනේරු සේවා කාර්යාලයේ තනතුරු 03 කට අයත් නිලධාරින් 03 දෙනෙකු වෙත 2019 මැයි මස සිට 2023 ජුනි දක්වා වූ කාලපරිච්ජේදයට අදාළව රු.1,290,175 ක් අනුමත සීමාව ඉක්මවීම හේතුවෙන් සහ සුපිරි පෙට්‍රල් /සුපිරි ඩීසල් භාවිතය හේතුවෙන් රු.178,560 ක් ඉන්ධන දීමනා ලෙස වැඩිපුර ගෙවා තිබුණි.	ඉන්ධන දීමනා ගෙවීමේදී නිලධාරීන් කාණ්ඩ වර්ගකර පදනම් දෙකක් යටතේ ඉන්ධන ගෙවා නොමැති අතර නිලධාරීන් භාවිතා කරන වාහන සඳහා එම වාහන වලට භාවිතා කරන ඉන්ධන වර්ගය අනුව වර්ග දෙකක් හඳුනාගෙන ඇති අතර ඒ අනුව භාවිතා කරන සත්‍ය ඉන්ධන වර්ගය පදනම් කර ගෙන දීමනා ගෙවා ඇති බව.	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය.

1.5.23 ශීර්ෂය 323 - දකුණු පළාත් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව	**අනුකූල නොවීම**	**ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
2019 මැයි 31 දිනැති අංක 13/2008(V) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙන් සංශෝධිත 2011 පෙබරවාරි 09 දිනැති අංක 13/ 2008 (IV) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය හා 2014 ජනවාරි 02 දිනැති 01/2014 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 2.1.3 (ii) ඡේදය	යොමුගත චක්‍රලේඛයන්හි අනුමත ඉන්ධන සීමාවන් හා ඉන්ධන වර්ගය පිළිබඳව පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් දැනුවත් කර තිබියදී හා ඒ පිළිබඳ ලබා දී තිබූ නිර්දේශ නොසලකා සහ රාජ්‍ය වියදම් කළමනාකරණය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති සම්බන්ධ චක්‍රලේඛ විධිවිධාන අභිබවායමින් ආණ්ඩුකාරවරගේ 2019 මැයි 13 දිනැති අංක G/SP/1/6/1/19 දරන ලිපියෙන් ලද අනුමැතිය මත 2019 මැයි 16 දිනැති අංක 02- 2019 දරන ප්‍රධාන ලේකම් චක්‍රලේඛය (මුදල්) නිකුත් කර තිබුණු අතර ඒ අනුව දකුණු පළාත් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ එක් තනතුරකට අයත් එක් නිලධාරියෙකු වෙත 2019 මැයි මස සිට 2023 ජුනි දක්වා වූ කාලපරිච්ඡේදයට අදාළව රු.83,300 ක් අනුමත සීමාව ඉක්මවීම හේතුවෙන් සහ සුපිරි පෙට්‍රල් /සුපිරි ඩීසල් භාවිතය හේතුවෙන් රු.29,025 ක් ඉන්ධන දීමනා ලෙස වැඩිපුර ගෙවා තිබුණි.	ඉන්ධන දීමනා ගෙවීමේදී නිලධාරීන් කාණ්ඩ වර්ගකර පදනම් දෙකක් යටතේ ඉන්ධන ගෙවා නොමැති අතර නිලධාරීන් භාවිතා කරන වාහන සඳහා එම වාහන වලට භාවිතා කරන ඉන්ධන වර්ගය අනුව වර්ග දෙකක් හඳුනාගෙන ඇති අතර ඒ අනුව භාවිතා කරන සත්‍ය ඉන්ධන වර්ගය පදනම් කර ගෙන දීමනා ගෙවා ඇති බව.	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය.

1.5.24 ශිර්ෂය 324 - දකුණු පළාත් ආදායම් දෙපාර්තමේන්තුව

(අ) නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව	**අනුකූල නොවීම**	**ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
2019 මැයි 31 දිනැති අංක 13/2008(V) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙන් සංශෝධිත 2011 පෙබරවාරි 09 දිනැති අංක 13/ 2008 (IV) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය හා 2014 ජනවාරි 02 දිනැති 01/2014 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 2.1.3 (ii) ඡේදය	යොමුගත චක්‍රලේඛයන්හි අනුමත ඉන්ධන සීමාවන් හා ඉන්ධන වර්ගය පිළිබඳව පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් දැනුවත් කර තිබියදී හා ඒ පිළිබඳ ලබා දී තිබූ නිර්දේශ නොසලකා සහ රාජ්‍ය වියදම් කළමනාකරණය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති සම්බන්ධ චක්‍රලේඛ විධිවිධාන අභිබවායමින් ආණ්ඩුකාරවරගේ 2019 මැයි 13 දිනැති අංක G/SP/1/6/1/19 දරන ලිපියෙන් ලද අනුමැතිය මත 2019 මැයි 16 දිනැති අංක 02-2019 දරන ප්‍රධාන ලේකම් චක්‍රලේඛය (මුදල්) නිකුත් කර තිබුණු අතර ඒ අනුව දකුණු පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ එක් තනතුරකට අයත් නිලධාරින් 02 දෙනෙකු වෙත 2019 මැයි මස සිට 2023 ජුනි දක්වා වූ කාලපරිච්ඡේදයට අදාළව රු.295,908 ක් අනුමත සීමාව ඉක්මවීම හේතුවෙන් සහ සුපිරි පෙට්‍රල් /සුපිරි ඩීසල් භාවිතය හේතුවෙන් රු.237,668 ක් ඉන්ධන දීමනා ලෙස වැඩිපුර ගෙවා තිබුණි.	ඉන්ධන දීමනා ගෙවීමේදී නිලධාරීන් කාණ්ඩ වර්ගකර පදනම් දෙකක් යටතේ ඉන්ධන ගෙවා නොමැති අතර නිලධාරීන් භාවිතා කරන වාහන සඳහා එම වාහන වලට භාවිතා කරන ඉන්ධන වර්ගය අනුව වර්ග දෙකක් හඳුනාගෙන ඇති අතර ඒ අනුව භාවිතා කරන සත්‍ය ඉන්ධන වර්ගය පදනම් කර ගෙන දීමනා ගෙවා ඇති බව.	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය.

(ආ) මෙහෙයුම් අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	පළාත් මූල්‍ය රීති 116.1 අනුව හිඟ ආදායම් අයකර ගැනීම පිළිබඳව ආදායම් රැස්කරන නිලධාරීන් අවධානයෙන් හා ඉතා සැලකිලිමත්ව සිටිය යුතු අතර නීති මාර්ගයෙන් හෝ වෙනත් මාර්ග වලින් හෝ හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කලයුතු වුවද සමාලෝචිත වර්ෂය අවසාන වන විට ආදායම් සංකේත 04 කට අදාළව අයකර ගැනීමට ඇති සමස්ථ හිඟ මුදල රු.මිලියන 375.6 ක් වූ අතර එම මුදල තුල අවුරුදු 03 ඉක්මවූ රු. මිලියන 203.96 ක හිඟ ආදායමක් විය.	හිඟ ආදායම් අය කර ගැනීම සඳහා 1990 අංක 07 දරන දකුණු පළාත් මුදල් ප්‍රඥප්තිය ප්‍රකාරව නීතිමය ක්‍රියා මාර්ග ගැනීම හා අනෙකුත් අය ක්‍රියා මාර්ග ගැනීම සිදු කරමින් පවතින බව.	හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කල යුතු අතර අයකල නොහැකි සහ ආදායම් සම්බන්ධයෙන් නෛතික ක්‍රියාමාර්ග ගත යුතුය.
(ii)	ඔප්පු දෙවන පිටපත් සඳහා හිඟ මුද්දර ගාස්තු හා දඩ මුදල් අයකර ගැනීම දකුණු පළාත් සභාවේ 1990 අංක 7 දරන මුදල් ප්‍රඥප්තිය ප්‍රකාරව නොතාරිස්වරුන් ලියා සහතික කරනු ලබන ඔප්පුවල දෙවන පිටපත් සඳහා නියමිත මුද්දර ගාස්තු ගෙවා නොමැති විට, හිඟ මුද්දර ගාස්තු හා දඩ මුදල් අයකර ගත යුතුය. එහෙත් මාතර ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් 2021 අගෝස්තු සිට 2022 අප්‍රේල් දක්වා මාස 08 කට අදාළ රු.9,560,841,078 ක් වූ ඔප්පු 2784 ක තොරතුරු 2023 පෙබරවාරි මස 24 දින පළාත් ආදායම් ප්‍රාදේශීය කාර්යාලයට ලැබී තිබුණද, 2023 නොවැම්බර් 27 දින වන විටත්, ඒ සම්බන්ධයෙන් ලිපිගොනු විවෘත කර ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි.	2021 අගෝස්තු සිට 2022 අප්‍රේල් දක්වා මාස 08 කට අදාලව ඔප්පු 2784 ක තොරතුරු 2023.02.24 දින මාතර කාර්යාලටය ලැබී ඇති බවත් 2024 මාර්තු 31 දින වන විට ඉන් 1023 ක් පිටපත් කර ඇති බව.	පළාත් සභාවට ආදායම් රැස් කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.
(iii)	ලිපිගොනු විවෘත නොකිරීම නිසා මුද්දර ගාස්තු කාර්යයෙන් අත්හැරීම		
	(අ) 2018 මැයි සිට 2020 අගෝස්තු දක්වා වූ මාස 19 කට අදාළ රු.500,000 කට වඩා වැඩි වටිනාකම් සහිත ඔප්පු 7481 ක් සම්බන්ධයෙන් වූ උපලේඛන	එක් එක් තක්සේරුකරුවකුට පවතින අනිකුත් රාජකාරිද ඇතුළත්ව වර්ෂයක් තුල කලමනාකරණය කල හැක්කේ උපරිම වශයෙන් ලිපිගොනු 500කට	පළාත් සභාවට ආදායම් රැස් කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.

	මාතර ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් 2020 ජූලි 30 දින සහ 2021 අප්‍රේල් 07 හා සැප්තැම්බර් 23 දිනවල පළාත් ආදායම් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබුණි. එම ඔප්පුවලින් 2023 ජනවාරි 01 සිට 2023 නොවැම්බර් 24 දින දක්වා ඔප්පු 2327 ක් සඳහා ලිපිගොනු විවෘත කර තිබූ අතර ඔප්පු 5154 ක් සම්බන්ධයෙන් අදාළ ඔප්පු කුමන වර්ගයේ ඔප්පුද යන්න හඳුනාගෙන ප්‍රමුඛතාවය ලබාදිය යුතු ඔප්පු සඳහා ලිපිගොනු විවෘත කිරීමට කටයුතු කර නොතිබුණි.	ආසන්න ප්‍රමාණයක් පමනි. ඒ අනුව සමස්ථ දෙපාර්තමේන්තුව සඳහා විවෘත කල හැකි උපරිම ලිපිගොනු සංඛ්‍යාව 9,950 කි.එය දෙපාර්තමේන්තුව විසින් සියයට 100ක උපරිමයම ඉටු කර ඇත. මෙම තත්ත්වය තුළ තාර්කික පදනම මත ලැබෙන ඔප්පු තෝරාගැනීමක් සිදු කර ලිපි ගොනු විවෘත කරන බව	
(බී)	තවද, 2018 වර්ෂයේ මැයි, ජූලි, අගෝස්තු, සැප්තැම්බර් හා දෙසැම්බර් මාස සඳහා මාතර ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් එවා තිබුණු රු.500,000 ට වඩා වැඩි වටිනාකම් සහිත ඔප්පු 1934 ක් පිළිබඳ විස්තර ඇතුළත් උපලේඛන පාදක කරගෙන 2023 ජනවාරි 01 සිට 2023 නොවැම්බර් 29 දින දක්වා මුද්දර ගාස්තු කාර්යය සඳහා ලිපිගොනු 579 ක් විවෘත කර තිබුණි. එහෙත් එම මාසවලට අදාළ උපලේඛන පරීක්ෂාවේදී රු.2,289,318,710 ක් වටිනා ඔප්පු 1355 ක් සම්බන්ධයෙන් අදාළ ඔප්පු කුමන වර්ගයේ ඔප්පු දැයි හඳුනා ගෙන ලිපිගොනු විවෘත නොකිරීම නිසා මුද්දර ගාස්තු කාර්යයෙන් අත්හැරී තිබුණි.	- එම-	- එම-
(සී)	තංගල්ල ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙහි මුද්දර ගාස්තු උපලේඛනය මත 2021 වර්ෂයේදී ලියාපදිංචි කරන ලද මුළු ඔප්පු සංඛ්‍යාව 5938 ක් වූ අතර එම ඔප්පුවල වටිනාකම	හම්බන්තොට දිස්ත්‍රික්කයේ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල මාසික උපලේඛන එවීම සිදු නොකරන අතර මේ සම්බන්ධව ඉඩම් රෙජිස්ට්‍රාර්වරුන් වරින් වර	පළාත් සභාවට ආදායම් රැස් කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.

රු.5,091,239,200 ක් විය. ඒවායින් රු.500,000 සහ ඊට වඩා වැඩි වටිනාකම් සහිත ඔප්පු සංඛ්‍යාව 2360 ක් වූ අතර එහි වටිනාකම රු.3,456,952,100 ක් විය. නමුත්, රු.500,000 ට වඩා වැඩි වටිනාකම් සහිත ඔප්පු අතුරින් මුද්දර ගාස්තු කාර්යය සඳහා පළාත් ආදායම් කාර්යාලයන් ලිපිගොනු විවෘත කර තිබුණේ ඔප්පු 232 ක් සඳහා පමණි.

දැනුවත් කර ඇත. හම්බන්තොට කාර්යාලයේ නිලධාරින් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල වෙත ගොස් ඔප්පු විස්තර සටහන් කරගෙන පැමිණීම මත මෙතෙක් ලිපිගොනු විවෘත කර ඇති බව 2023 වර්ෂයේ සිට අනුමත තක්සේරු කරුවන් සංඛ්‍යාව (03) සම්පූර්ණ කිරීම හේතුවෙන් වර්ෂයකට ලිපිගොනු 1500 බැගින් විවෘත කරන ලද බවත් එහිදි වටිනාකම මත ප්‍රමුඛතාවය ලබාදිමට පහසුකම් නොලැබීම හේතුවෙන් තංගල්ල ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ රු.500,000 ට වැඩි වටිනාකමක් සහිත ඔප්පු සංඛ්‍යාවෙන් ඉතා සුළු ප්‍රමාණයක් සඳහා පමණක් ලිපිගොනු විවෘත වී ඇති බව.

(iv) පිට පළාත්වල නොතාරිස්වරු විසින් මාතර දිස්ත්‍රික්කයේ ඉඩම් හුවමාරු කිරීම් වලට අදාළ ඔප්පු ලියාපදිංචි කිරීම් මුද්දර ගාස්තු කාර්යයෙන් අත්හැරීම

දකුණු පළාත හැර වෙනත් පළාත්වල නොතාරිස්වරු විසින් මාතර දිස්ත්‍රික්කයේ ඉඩම් හුවමාරු කිරීම්වලට අදාළ ඔප්පු ලියාපදිංචි කිරීම් සම්බන්ධයෙන් විගණන දිනය වූ 2023 නොවැම්බර් 27 දින මාතර ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් සිදු කරන ලද නියැදි විගණන පරීක්ෂාවේදී 2020 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා වූ කාලය තුළ රු.54,897,017 ක් වටිනා ඉඩම් හුවමාරු අවස්ථා 18කට අදාළව තොරතුරු නිරීක්ෂණය වූ අතර, ඉන් ඔප්පු 16 කට අදාළ තොරතුරු ලබා ගෙන ගොනු විවෘත කර අදාළ මුද්දර ගාස්තු නියමිත පරිදි ගෙවා තිබේදැයි පරීක්ෂා කර හිඟ මුද්දර ගාස්තු අයකර ගැනීමට කටයුතු කල යුතුව පැවතුණි.

අනෙකුත් ඔප්පු 16 පිළිබඳව කටයුතු කිරීම සඳහා අදාල ඔප්පු පිටපත් ලබා දෙන ලෙස නියෝජ්‍ය කොමසාරිස් විසින් මාතර ඉඩම් රෙජිස්ට්‍රාර්වරයාට 2024 ජනවාරි 18 දින ලිඛිතව දැනුම් දී ඇත. මාතර ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් විසින් පිට පළාත් නොතාරිස් වරු සහතික කරන ලද ඔප්පු වල දෙවන පිටපත් මාතර ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය වෙත ලබා දී නොමැති බව සඳහන් කර 2024 ජනවාරි 23 දින ලිඛිතව මාතර නියෝජ්‍ය කොමසාරිස් වෙත දන්වා ඇත.ඒ අනුව එම නොතාරිස් වරුන්ට අයත් බල ප්‍රදේශ වල ඉඩම් කාර්යාල වෙත එම එක් එක් දේපලට අදාල ඔප්පු වල දෙවන පිටපත් ලබාදෙන ලෙසට ලිඛිතව

පළාත් සභාවට ආදායම් රැස් කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.

දන්වා ඇත. එම තොරතුරු ලැබුන පසු ඉදිරි කටයුතු කරන බව.

(v) දේපල පැවරීම මත, මත සහතික නිකුත් කිරිම

පෞද්ගලික ආයතනය සතු දේපල තවත් පෞද්ගලික ආයතනයක් වෙත පැවරීමේදී නිශ්චල දේපල ලෙස රු.104,000,000 ක් වූ තේ කර්මාන්ත ශාලාව (ගොඩනැඟිලි සහ වගාවන් සහිත ඉඩම ඇතුළුව) සහ චංචල දේපල ලෙස රු.232,000,000 ක් වූ යන්ත්‍ර සූත්‍ර හා සවිකිරිම්ද රු.16,000,000 ක් වූ වාහන සහ රු.12,000,000 ක් වූ වෙළඳ ලාභය ලෙසද වර්ගීකරණය කර කෙටුම්පත් ගිවිසුමක්ද ඉදිරිපත් කර මත සහතික ලබා ගැනීම සඳහා අයදුම්පත්‍රයක් 2023 ජනවාරි 09 දින පළාත් ආදායම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබුණි.

ඒ අනුව මත ප්‍රකාශයක් ලබා දීම සඳහා පළාත් ආදායම් කොමසාරිස් විසින් පත් කරන ලද කමිටුව විසින් 2023 ජනවාරි 31 දින ලබා දෙන ලද තක්සේරු වාර්තාව අනුව සියළු දේපල වල වටිනාකම රු.243,000,000 ක්ද ගෙවිය යුතු මුද්දර ගාස්තුව රු.9,719,000 ක්ද ලෙස දක්වමින් මත සහතිකයක් ලබා දී තිබුණද ඊට එකඟ නොවී මත අයදුම්කරු විසින් 2023 පෙබරවාරි 09 දින අභියාචනාවක් ඉදිරිපත් කර තිබුණි. ඒ අනුව අභියාචනා විභාගයක් පවත්වා තිබුණද, එයට එකඟතාවය පල කර නොතිබුණු බැවින් ඉහත ප්‍රඥප්තියේ 79 (11) වගන්තිය ප්‍රකාරව ගෙවිය යුතු මුද්දර ගාස්තුව දින 07 ක් තුළ සම්පූර්ණ කිරීමට දැනුම් දී තිබුණි. අයදුම්කරු විසින් ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි. ඒ අනුව එසේ නොගෙවන ලද රු.9,719,000 ක් වූ මුද්දර ගාස්තුව මුදල් ප්‍රඥප්තිය ප්‍රකාරව පැහැර හැර ඇති මුද්දර ගාස්තුවක් ලෙස නිරීක්ෂණය විය.

අයදුම්කරු විසින් මත අයදුම්පත හා ඉදිරිපත් කර ඇති කෙටුම්පත් ඔප්පුව මගින් පවරනු ලබන දේපල ලෙස උපලේඛනයේ දක්වා ඇති පරිදි තේ කර්මාන්ත ශාලාව, අනෙකුත් ගොඩනැගිලි, ගස් හා වැවිලි සහ ඒ සම්බන්ධිත අනෙකුත් සියල්ල ලෙස දක්වා ඇත. ඒ අනුව අප විසින් මත සහතික ලබා දීමේ දී එම උපලේඛනයේ සඳහන් කර ඇති දේපල සම්බන්ධව සලකා බලනු ලබන අතර අප විසින් මත සහතිකය ලබා දෙනු ලබන්නේ අයදුම්පත සමඟ ඉදිරිපත්කල කෙටුම්පතහි උපලේඛනයේ විස්තර කර ඇති දේපල සඳහා වේ. නමුත් විකිණීම හා මිලදී ගැනීම සඳහා සකස් කරන ලද කෙටුම්පත් ඔප්පුවේ ගිවිසුම තුළ උපලේඛනයේ සඳහන් දේපලද ඇතුළත් කර ඇති බව.

1990 අංක 07 දරන මුදල් ප්‍රඥප්තිය ප්‍රකාරව කටයුතු කල යුතුය.

1.5.25 ශීර්ෂය 325 - දකුණු පළාත් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව	අනුකූල නොවීම	ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම	නිර්දේශය
මූල්‍ය රීති 259.2 හා දකුණු පළාත් ප්‍රධාන ලේකම්ගේ 2024 ජනවාරි 02 දිනැති අංක 03/2023 දරන ප්‍රධාන ලේකම් (ගිණුම් හා ගෙවීම්) චක්‍රලේඛය	යොමුගත රීතිය ප්‍රකාරව වර්ෂය අවසානයේදී ගිණුම් පියවිය යුතු අතර, දෙසැම්බර් මාසයේ 31 වන විට ඉතිරි වූ අග්‍රිම ශේෂය ඊළඟ වර්ෂයේ ජනවාරි 10 වන දිනට හෝ පළාත් භාණ්ඩාගාරය විසින් නියම කරනු ලබන දිනයට පෙර පළාත් භාණ්ඩාගාරය වෙත ආපසු ගෙවිය යුතු වුවත් දකුණු පළාත් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ රු.688,000 ක්වූ අග්‍රිම ශේෂ සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි.	ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව	මූල්‍ය රීති අනුව කටයුතු කල යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පළාත් සභා අරමුදලේ මෙහෙයුම් කටයුතුවල ප්‍රතිඵලය රු.850,674,421 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.777,611,692 ක් විය.

3. ප්‍රඥප්ති ගිණුම්/ අරමුදල් ගිණුම්/ වාණිජ අත්තිකාරම් ගිණුම් හා අනෙකුත් අත්තිකාරම් ගිණුම්

3.1 ප්‍රඥප්ති ගිණුම් / අරමුදල් ගිණුම්

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
දකුණු පළාත් සභාව තුළ වූ ප්‍රඥප්තිගත ආයතන සඳහා ලබාදෙන ප්‍රතිපාදන එම ආයතනවල අරමුණු හා කාර්යයන්	ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව.	අදාළ මුදල් ආයතන අරමුණු ඉටුකර ගැනීම සඳහා යෙදවිය යුතුය.

ඉටුකිරිම සඳහා යෙදවිය යුතු වුවත්, එවැනි ආයතන 02 ක් සඳහා ලබාදුන් රු.482,238,726 ක් වූ මුදල් එකී අරමුණු සඳහා යෙදවීමකින් තොරව ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි.

3.2 අනෙකුත් අත්තිකාරම් ගිණුම්

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පළාත් රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්වල එකතු ශේෂය රු.1,577,211,969 ක් ලෙස දක්වා තිබූ අතර එම ශේෂයෙන් ස්ථානමාරු වී ගිය/ විශ්‍රාම ගිය, මියගිය, වැඩ තහනම් කර හා සේවය හැර ගිය නිලධාරීන් 3,609 දෙනෙකුගෙන් තවදුරටත් අයවිය යුතු එකතුව රු.53,726,173 ක් වූ ණය ශේෂ ඇතුළත්ව තිබුණි.	ඉදිරියේදී නිවැරදි කිරිමට කටයුතු කරමින් පවතින බව.	අයවිය යුතු ණය ශේෂ කඩිනම්ව අයකර ගැනීමට කටයුතු කල යුතුය.
(ආ)	තංගල්ල මූලික රෝහලේ රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුමේ 2023 දෙසැම්බර් 31 දිනට කේවල ශේෂ වර්ගීකරණ සාරාංශය අනුව අයවිය යුතු ණය ශේෂය සහ පාලන ගිණුම අතර රු.565,633 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර, මෙම වෙනස වසර 10 කටත් පෙර සිට පැවතියද වෙනසට හේතු නිවැරදිව හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.	පාලන ගිණුම හා කේවල ශේෂ ගිණුම අතර වෙනස සඳහා හේතු ඉදිරියේදී සොයා බලා නිවැරදි කිරීමට කටයුතු කරන බව.	නිවැරදිව ගිණුම් තැබීමට කටයුතු කල යුතුය.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.1 රජයේ ප්‍රදාන

පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන (පීඑස්ඩීජී), පළාත් සංවර්ධන ප්‍රාදන (පීඩීජී), උපමාන පාදක ප්‍රදාන (සීර්ජී) හා අනෙකුත් සංවර්ධන ව්‍යාපෘති ප්‍රදාන උපයෝජනයට අදාළව නිරීක්ෂණ පහත දැක්වේ.

මූලාශ්‍රය	අනුමත මුදල රු.	වැයකල මුදල රු.	ඌන උපයෝජනය රු.
පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන (PSDG)	825,200,000	802,412,669	22,787,331
උපමාන පාදක ප්‍රදාන (CBG)	152,000,000	152,000,000	-
ප්‍රාථමික සෞඛ්‍ය සේවා ශක්තිමත් කිරීම් වැඩසටහන් (PSSP)	1,444,000,000	1,390,795,671	53,204,329
සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘති (GEMP)	375,000,000	365,733,588	9,266,412

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) ඉහත තොරතුරු අනුව දකුණු පළාත් සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ මූලාශ්‍ර 04 කින් ලැබී තිබූ ප්‍රතිපාදනවලින් වැයකිරීම් වලින් පසු තවදුරටත් පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන, ප්‍රාථමික සෞඛ්‍ය සේවා ශක්තිමත් කිරීමේ වැඩසටහන හා සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘති සඳහා ලද මුදල් වලින් පිළිවෙලින් රුපියල් මිලියන 22.8 ක්, රුපියල් මිලියන 53.2 ක් හා රුපියල් මිලියන 9.3 ක් ඌන උපයෝජිතව පැවතුණි.	2023 වර්ෂය ආරම්භයේ දී මුදල් කොමිෂන් සභාවේ එකඟතාවය පරිදි රු.මිලියන 1,620 (PSDG) සහ රු.මිලියන 104 (CBG) ක සංවර්ධන සැලැස්ම අනුමත කරන ලදි. නමුත්, මුදල් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද සංවර්ධන සැලැස්ම සඳහා මුදල් කොමිෂන් සභා ලේකම් ගේ අංක: FC/PDP/03/2023-SP හා 2023 මාර්තු 03 දිනැති ලිපිය මගින් එකඟතාවය ලබා දීමේ දී ව්‍යාපෘති සම්බන්ධයෙන් වන බැදීම් වලට එළඹීමට ප්‍රථම අදාල ගෙවීම් සඳහා අවශ්‍ය වන අක් මුදල් මහා භාණ්ඩාගාරයෙන් ලැබීම පිළිබඳ තහවුරු කර ගන්නා ලෙස උපදෙස් ලබා දී තිබුණු බව ඒ අනුව, අක්මුදල් තහවුරුව ලබා ගනිමින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සිදුකරන ලද අතර, වර්ෂය අවසාන භාගයේ පැවති අධික වර්ෂාව සහිත කාලගුණ තත්ත්වය හේතුවෙන් සැලසුම් කල පරිදි ව්‍යාපෘති අවසන් කිරීමට නොහැකි වූ බව.	සැලසුම් කල පරිදි වෙන්කල ප්‍රතිපාදන වලින් උපරිම ප්‍රයෝජන ගැනීමට කටයුතු කල යුතුය.

4.1.2 පළාත් සංවර්ධන සැලැස්ම

සමාලෝචිත වර්ෂය සඳහා පළාත් සංවර්ධන සැලැස්ම යටතේ නව වැඩ හා අවිච්ඡේද වැඩ වෙනුවෙන් රු. මිලියන 857.53 ක ඇස්තමේන්තු වටිනාකමකට වූ යෝජනා 699 ක් අනුමත කර තිබුණි. පළාත් සභාවේ ප්‍රගති වාර්තා අනුව වැඩ යෝජනාවල ප්‍රගතිය පහත පරිදි විය.

විස්තරය	නව වැඩ යෝජනා ගණන	අවිච්ඡේද යෝජනා වැඩ ගණන	මුළු වැඩ යෝජනා ගණන	මුළු වැඩවල ඇස්තමේන්තු වටිනාකම
				රු.මිලියන
(i) සම්පූර්ණයෙන් නිම කල	622	07	629	625.99
(ii) සියයට 50 කට වඩා අඩුවෙන් නිම කල	21	-	21	50.33
(iii) සියයට 50 කට වඩා වැඩියෙන් නිම කල	40	-	40	179.21
(iv) ආරම්භ කර නොතිබූ	09	-	9	2.0
	-----	----	----	--------
එකතුව	692	07	699	857.53
	===	==	===	=====

මේ පිළිබඳ නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2023 වර්ෂයේ පළාත් සංවර්ධන සැලැස්ම යටතේ පළාත් නිශ්චිත සහ උපමාන පාදක වැඩසටහන සඳහා අනුමත වැඩ යෝජනා 699 ක ප්‍රගතිය අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වැඩ යෝජනා 629 ක වැඩ සම්පූර්ණයෙන් අවසන් කර තිබුණු අතර වැඩ යෝජනා 61 ක් ක්‍රියාත්මක වෙමින් පැවති නමුත් වැඩ යෝජනා 09 ක් ආරම්භ කිරීමට හෝ කටයුතු කර නොතිබුණි. ඒ අනුව තවදුරටත් වැඩ යෝජනා 61 ක් අමාත්‍යාංශය මට්ටමින් අවසන් කිරීමට පැවතීමෙන් ඒ ඒ අමාත්‍යාංශ මඟින් එකී වැඩ යෝජනා අවසන් කිරීම සම්බන්ධ පසු විපරම් කටයුතු විධිමත් පරිදි සිදුවී නොතිබුණි.	ව්‍යාපෘති සම්බන්ධයෙන් වන බැදීම්වලට එළැඹීමට ප්‍රථම අදාල ගෙවීම් සඳහා අවශ්‍ය වන අක් මුදල් මහා භාණ්ඩාගාරයෙන් ලැබීම පිළිබඳ තහවුරු කර ගන්නා උපදෙස් ලබාදීම සහ ඉහත කරුණු හේතුවෙන් සහ වර්ෂය අවසාන භාගයේ පැවති අධික වර්ෂාව සහිත කාලගුණ තත්ත්වය හේතුවෙන් සැලසුම් කල පරිදි ව්‍යාපෘති අවසන් කිරීමට නොහැකි වූ බවද වැඩ අවසන් නොවූ ව්‍යාපෘති 61 අතුරින් 2024 වර්ෂයේ අවිච්ඡේද ව්‍යාපෘති ලෙස ව්‍යාපෘති 07ක් පමණක් ක්‍රියාත්මක කරන අතර, අනෙක් ව්‍යාපෘති එම පැවති තත්ත්වයන් අවසන් කර ඇති බව.	පසු විපරම් කටයුතු විධිමත් පරිදි සිදුකල යුතුය.

(ආ)	පළාත් සංවර්ධන සැලැස්ම සකස් කිරීමේ මූලික අරමුණ වනුයේ පළාත තුළ ප්‍රමුඛතාවයන් ලබාදිය යුතු අත්‍යවශ්‍ය ව්‍යාපෘති (විශේෂයෙන් පළාත් ආදායම ඉහළ නැංවීමට අදාළ ව්‍යාපෘති) හඳුනාගෙන ඒ අනුව ප්‍රමුඛ අවශ්‍යතා ලේඛනගත කර අදාළ සංවර්ධන ව්‍යාපෘති ඇතුළත් කර පළාත් සංවර්ධන සැලැස්ම සකස් කිරීම වුවද, වර්ෂය තුළ පළාත් සංවර්ධන සැලැස්මේ වූ සංවර්ධන ව්‍යාපෘති සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වාම සංශෝධනය කර තිබුණි. ඒ අනුව පළාත් සභාව තුළ කාලීනව හඳුනාගනු ලබන විශේෂ ව්‍යාපෘති සංශෝධනය කිරීමේදී යම් කාල වකවානුවක් නිර්ණය කිරීම තුළ අනවශ්‍ය ලෙස ව්‍යාපෘති සංශෝධනය කිරීම මගහරවා ගත හැකි බවද වර්ෂය ආරම්භයේදී අධික වියදමක් දරා සකසන ලද සංවර්ධන සැලැස්ම තුළින් අදාළ අරමුණු ඉටු වී නොතිබුණි.	වර්ෂය ආරම්භයේ දී වාර්ෂික සංවර්ධන සැලැස්ම සකස් කලද වාර්ෂික සංවර්ධන සැලැස්ම කිහිප අවස්ථාවකදීම සංශෝධනය කිරීමට සිදුවූ බැවින් අවශ්‍ය ගැලපීම් සිදු කර ඇති බව.	ව්‍යාපෘති නිවැරදිව හඳුනාගෙන සංවර්ධන සැලැස්ම සැකසීමට කටයුතු කල යුතුය.
(ඇ)	2023 වර්ෂයේ ව්‍යාපෘති 14 ක් සඳහා අනුමත අතැති බිල් ඉක්මවා රු. මිලියන 3.91 ක වියදම් දරා තිබුණි.	අප විසින් අතැති බිල් අනුමත කිරීමේදී පෙර වර්ෂයේ ගෙවන ලද බිල්පත් වටිනාකම අඩුකර ගෙවීමට ඇති අතැති බිල් වටිනාකම පමණක් අනුමත කර ඇත. නමුත්, අතැති බිල් වටිනාකම ඉක්මවා මාර්ග සංවර්ධන අධිකාරිය විසින් බිල්පත් ගෙවීම් අපගේ නිර්දේශයක් හෝ අනුමැතියකින් තොරව කරන ලද කාර්යයකි. මේ සම්බන්ධයෙන් කීප අවස්ථාවකම එම අධිකාරිය දැනුවත් කර ඇති බව.	බිල්පත් සඳහා ගෙවීම් සිදුකිරීමේදී සහතික කිරීම, අනුමත කිරිම හා ගෙවිම මුදල් රෙගුලාසි වල දක්වා ඇති පරිදි සිදුකල යුතුය.
(ඈ)	එමෙන්ම, 2023 වර්ෂය සඳහා ව්‍යාපෘති 08 ක් සඳහා අතැති බිල් සඳහා රු. මිලියන 1.12 ක් අනුමත කර තිබුණද, එකී අතැති බිල් ගෙවා නොමැති වීම මත නිවැරදි ඇස්තමේන්තු මත අදාළ ව්‍යාපෘති ක්‍රියාත්මක වී නොමැති බවත්	අතැති බිල්පත් ගෙවීම් සිදු කරනු ලබනුයේ පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය මගින් වන අතර මේ සම්බන්ධයෙන් අප සොයා බැලීමේදි නිරීක්ෂණය වු කරුණු මත කිහිප අවස්ථාවක දීම අදාල අමාත්‍යාංශය	පසු විපරම් කටයුතු විධිමත් පරිදි සිදුකල යුතු අතර අදාල ව්‍යාපෘතිවල ප්‍රගතිය පිළිබඳ පරීක්ෂාවට ලක්කල යුතුය.

සාවද්‍ය ලෙස අතැති බිල් සඳහා තොරතුරු ඉදිරිපත් කර ඇති බවද නිරීක්ෂණය විය.	හරහා එම අධිකාරිය වෙතින් විමසීම් කර ඇති බව සහ විමසීම් සඳහා පිළිතුරු ඉදිරිපත් නොකිරීම හා හේතු ඉදිරිපත් නොකර මෙම ව්‍යාපෘති අනුමත කරන ලෙස අප වෙත දිගින් දිගටම ඉල්ලීම් සිදු කලද එම ව්‍යාපෘති සඳහා අප විසින් අනුමැතිය ලබා නොදීමට කටයුතු කරන ලද අතර තවදුරටත් එම ක්‍රියාමාර්ගය අනුගමනය කරමින් සිටින බව.

4.2 කාර්ය මණ්ඩල පරිපාලනය

4.2.1 පළාත් සභා ආයතනවල කාර්ය මණ්ඩලය

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පළාත් රාජ්‍ය නිලධාරීන් (අධ්‍යාපන හා සෞඛ්‍ය හැර) පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

		අනුමත සේවක සංඛ්‍යාව	තථ්‍ය සේවක සංඛ්‍යාව		පුරප්පාඩු සේවක සංඛ්‍යාව
			ස්ථිර	අනියම්/ආදේශක/ කොන්ත්‍රාත්	
(i)	පළාත් සභා අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු	5,684	5,271	16	413
(ii)	පළාත් පාලන ආයතන	5,961	5,340	601	621
(iii)	ප්‍රඥප්ති මඟින් පිහිටවූ ආයතන	593	447	11	146
	එකතුව	12,238	11,058	628	1180

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින පළාත් සභා ආයතනවල කාර්යය මණ්ඩල තොරතුරු අනුව පළාත් සභා නිලධාරීන්ගෙන් 1,180 ක පුරප්පාඩු ප්‍රමාණයක් පැවතුණි.	පුරප්පාඩු විධිමත් කිරීමට කටයුතු කරන බව.	රාජ්‍ය සේවයේ පොදු ප්‍රතිපත්ති අනුව කටයුතු කල යුතුය.

4.2.2 පාසල් කාර්ය මණ්ඩලය

දකුණු පළාත් සහා පාසල්වල පවතින විදුහල්පතිවරු, ගුරුහවතුන් හා සහයක කාර්යය මණ්ඩලය පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

	සේවක වර්ගය	අනුමත සේවක සංඛ්‍යාව	තථ්‍ය සේවක සංඛ්‍යාව	පුරප්පාඩු සේවක සංඛ්‍යාව	අතිරික්ත සේවක සංඛ්‍යාව
(i)	විදුහල්පතිවරු	283	141	142	-
(ii)	නියෝජ්‍ය විදුහල්පතිවරු/ සහකාර විදුහල්පතිවරු	1,337	914	423	-
(iii)	ගුරුහවතුන්	23,592	21,280	2,312	-
(iv)	සුළු සේවක හා සහාය කාර්ය මණ්ඩලය	3,322	4,045	-	723
		----------	----------	----------	----------
	එකතුව	28,534	26,380	2,877	723
		======	======	======	======

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක ජනරාල්ගේ අංක DMS/ SP/0301 හා 2019 අප්‍රේල් 02 දිනැති ලිපිය මඟින්ද, අංක DMS/SP/0301 හා 2019 මැයි 28 දිනැති ලිපි මඟින් අනුමත කල පාසල් කාර්ය සහායක හා පාසල් මුරකරුවන් සංඛ්‍යාව ඉක්මවා පාසල් කාර්ය සහායක තනතුරු 53 ක් සහ මුරකරුවන් තනතුරු 670 ක් සඳහා එකතුව රු.343,135,800 ක වැඩිපුර වැටුප් හා වේතන ගෙවීමට අදාළ අනුමැතිය ලබාදුන් කාර්ය මණ්ඩල ලිපි නොතිබුණි.	පාසල් කාර්ය මණ්ඩලය ලෙස ලබා දී ඇති ආකෘතියෙහි සඳහන් අනුමත සංඛ්‍යා 2019 කාර්ය මණ්ඩල සමාලෝචන වාර්තාව අනුව නිවැරදි නොවන බැවින් එම සංඛ්‍යා පහත පරිදි නිවැරදි වියයුතු බව 2019 කාර්ය මණ්ඩල සමාලෝචන වාර්තාව අනුව දකුණු පළාතේ පළාත් සහා පාසල් සඳහා විදුහල්පති සංඛ්‍යාව 1337 කි. (විදුහල්පති,නියෝජ්‍ය,සහකාර) 2019 කාර්ය මණ්ඩල සමාලෝචන වාර්තාව අනුව දකුණු පළාතේ පළාත් සහා පාසල් සඳහා අනුමත ගුරු සංඛ්‍යාව 23,596 කි. 2019 කාර්ය මණ්ඩල සමාලෝචන වාර්තාව අනුව දකුණු පළාතේ සුළු සේවක හා සහාය කාර්ය මණ්ඩලය සඳහා අනුමත සංඛ්‍යාව 4,132 කි.	පාසල්වල පවතින කාර්ය මණ්ඩල ඌනතාවයන්/ අතිරික්තයන් සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග අනුගමනය කල යුතුය.

4.2.3 සෞඛ්‍ය කාර්ය මණ්ඩලය

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් 2013 වර්ෂයේ අනුමත කරන ලද කාර්ය මණ්ඩලය සහ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තථ්‍ය කාර්යය මණ්ඩලය පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

සේවක වර්ග	අනුමත සේවක සංඛ්‍යාව	තථ්‍ය සේවක සංඛ්‍යාව	පුරප්පාඩු සේවක සංඛ්‍යාව
ජොෂ්ඨ මට්ටම	1,395	1,156	239
තෘතියික මට්ටම	169	109	60
ද්විතියික මට්ටම	5,288	4,830	458
ප්‍රාථමික මට්ටම	3,255	2,858	397
	10,107	8,953	1,154

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
එක් එක් සේවා ගණයන්වල අනුමත සේවක සංඛ්‍යාවට වඩා 1,154 ක පුරප්පාඩුවක් පැවති අතර ඒ අනුව ඇල්පිටිය, කඹුරුපිටිය හා තංගල්ල මූලික රෝහල්වල ඇතැම් නිලධාරීන් වසර 06 සිට වසර 35 කට අධික කාලයක් එකම සේවා ස්ථානයක සේවා නියුක්තව සිටි බව නිරීක්ෂණය විය. එසේ වුවද ආයතනය තුළ පවත්වාගෙන යන තොරතුරු පද්ධතිය තුළ වසර 05 ඉක්මවූ සියලුම නිලධාරීන් සම්බන්ධව තොරතුරු විගණනයේදී ඉදිරිපත් නොවුණි.	දකුණු පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව මඟින් පවත්වාගෙන යනු ලබන දත්ත පද්ධතියේ තොරතුරු ඇතුළත් කිරීම පෞද්ගලික ලිපිගොනු පවත්වාගෙන යනු ලබන දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලවල හා මූලික රෝහල් වල පෞද්ගලික ලිපිගොණු භාර විෂය නිලධාරින් විසින් සිදුකරනු ලබයි .ඒ අනුව මෙම දත්ත පද්ධතියට දත්ත ඇතුළත් කිරීම හා යාවත්කාලීන කිරීම සම්බන්ධව නිරන්තරව එම ආයතන දැනුවත් කිරීමද සිදුකරනු ලබයි.එසේම පසුගිය දිනවල එක් එක් ආයතන වෙන්වෙන් වශයෙන් ගෙන එම ආයතනයේ තොරතුරු ඇතුළත් කිරීම සම්බන්ධව අදාළ විෂය නිලධාරීන් දැනුවත් කරන ලදී. ඒ අනුව ඉදිරියේදී සියළු නිලධාරීන්ගේ තොරතුරු දත්ත පද්ධතියට ඇතුළත් කිරීමට හා දත්ත පද්ධතිය යාවත්කාලීනව පවත්වාගෙන යාමට කටයුතු කරන බව.	අනුමත කාර්ය මණ්ඩලයට අනුකූලව කටයුතු කල යුතුය.

5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

5.1 මහජන සේවා ඉටු කිරීම

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
දකුණු පළාත තුළ ක්‍රියාත්මක වන විවිධ සේවා සමුපකාර සමිතිවල එම සමිතිවලට වෙන වෙනම අදාළ වන සේ සම්මත කරනු ලැබ ඇති අතුරු ව්‍යවස්ථා ප්‍රකාරව වසර 03 කට වරක් ප්‍රාදේශීය කාරක සභා වලට සභිකයන් පත් කල යුතු අතර ඒ ඒ ප්‍රාදේශීය කාරක සභාවල නිල කාලය වසර 03 කි. එම කාලය අවසන් වීමෙන් පසුව නිලවරණයක් පවත්වා නව සභිකයන් පත්කිරීමේ බලය අංක 297/7 දරන 1977 දෙසැම්බර් 28 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මඟින් සමුපකාර සංවර්ධන කොමසාරිස්වරයා වෙත පවරා තිබුණද දකුණු පළාත තුළ ක්‍රියාත්මක විවිධ සේවා සමුපකාර සමිති 34 න් 20 ක නිල කාලය සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට අවසන් වී තිබුණි. එක් සමිතියක නඩු කටයුත්තක් පැවතුණද, අනෙක් සමිති 19 හි ඡන්ද විමසීම් කටයුතු පැවැත්වීමට අදාල ගැසට් නියෝගය පරිදි කටයුතු කර නොතිබුණි.	දකුණු පළාත් විවිධ සේවා සමුපකාර සමිති බොහෝමයක නිල කාලය 2022 න් අවසන් වී තිබුණද ප්‍රාදේශීය කාරක සභා/ අධ්‍යක්ෂ මණ්ඩල තෝරා පත් කර ගැනීම සඳහා නිලවරණය පවත්වා නැත්තේ ඒ සම්බන්ධව ගරු ආණ්ඩුකාරතුමා විසින් අංක G/SP/04/0402/03-1 හා 2023 පෙබරවාරි 27 දිනැතිව ලබා දී ඇති උපදෙස් ලිපිය අනුව බව.	අදාළ ගැසට් නිවේදනයෙන් ලද බලතල ප්‍රකාරව කටයුතු කල යුතුය.

5.2 අයවැය ලේඛනමය පාලනය

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
වියදම් ශීර්ෂ 26ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනවලින්, එකතුව රු.4,770,164,561 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණු අතර, එම අගයයන් රු.1,383,824 සිට රු.1,571,938,944 ත් අතර පරාසයක පැවතුණි.	රටෙහි පවතින ආර්ථික දුෂ්කරතා හේතුවෙන් ප්‍රධාන ලේකම් චක්‍රලේඛ 01/2023 හා අයවැය චක්‍රලේඛ අංක 03/2022 මගින් වියදම් අවම කර ගන්නා ලෙස දන්වා ඇති අතර එම උපදෙස් අනුව වියදම් දැරීමේදී අත්‍යාවශ්‍ය වියදම් පමණක් දරමින් හා ප්‍රාග්ධන වියදම් සීමා කිරීම හේතු වූ බව.	අවශ්‍යතා සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන සලසා ගත යුතුය.